
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565ක් වූ ඇසළ පුර අටවක පෝය දින, 2021 ජූලි 17 සෙනසුරාදා , BUDUSARANA SATURDAY JULY 17, 2021

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 56 වැනි කාණ්ඩය, 04 වැනි පත්‍රය , පිටු 20 ආරම්භය 1965 - 06 - 13 මිල රු. 40.00



මට්ටකුණ්ඩලීට පිහිට වීම

# සංවිධානය වූ චරිතය තමන්ට අභිමානයකි






කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

**සංයුත්ත නිකායේ දේවතා සංයුත්තයට අයත් සමිද්ධි සූත්‍රය තුළ තරුණ සමිද්ධි හිමියන් තාරුණ්‍යය නියම ලෙස භාවිත කරන ආකාරය පැහැදිලි කළහ. මෙම සූත්‍රය තුළදී දේවතාවිය සහ සමිද්ධි හිමියන් අතර ඇතිවන සංවාදය වර්තමාන තාරුණ්‍යයට මහත් මඟ පෙන්වීමක් ලබා දෙන්නක් බඳු ය.**

සංවිධානය වූ චරිතයක අභිමානය සමිද්ධි හිමියන් ගේ වචන තුළින් මනාව ප්‍රකට වේ. අප බොහෝ විට කරුණාව භාවිත කරනවාට වඩා වැඩි වේගයකින් අවි භාවිත කිරීම සිදුකරයි.

දහම පැත්තෙන් ගත් කල ද බොහෝ අය කල්පනා කරනුයේ දහම වයසක මහල්ලන්ට අයත් දෙයක් බව ය.ඒ බව හුමාටු දේවතාවියගේ ප්‍රකාශය තුළ ගැබ්ව ඇත.

සමිද්ධි හිමියන් තපෝද නැමති උණුදිය සහිත විලට පැන් පහසුවීමට වැඩි අවස්ථාවක අල්පේශාක්‍ය භූමා වූ දේවතාවියක් උන්වහන්සේ ඉදිරියෙහි පෙනී සිටියා ය. එහිදී සමිද්ධි හිමියන් ඇය ඇමතූ අවස්ථාවේ ඇය මෙවැනි ප්‍රශ්නයක් උන්වහන්සේට යොමු කළා ය.

“ඔබ වහන්සේ නොවළඳා සිඟා කති වළඳා සිඟා නොකති.”

මෙහිදී දේවතාවිය අදහස් කරන්නේ පංචකාම සම්පත්තීන් විඳින්න තියෙන තරුණ කාලයෙහි ඔබ එය අත්හැර මහණ දම් පුරනවා. පළමුව පංචකාම සම්පත්තීන් විඳ පසුව මහණ වෙන්න යනුවෙනි.

මෙම දේවතාවිය තවදුරටත් උන්වහන්සේට පැහැදිලි කරන්නේ ඔබ ළ දරුවියේ පැවිදිවූ කෙනෙක්. ඔබ දැන් තරුණයි. ඉතා කළු කෙස් ඇත්තෙක්. කාම ක්‍රීඩා නොකළ කෙනෙක් මිනිසුන්ට අයත් කාම සැප වළඳන්න පසුව මහණ දම් පුරන්න වශයෙනි.

මෙම දේවතාවියගේ ප්‍රකාශය ධර්මය නොදන්නා කෙනකුගේ අදහසකි. ඔවුන් හිතනුයේ පැවිදි විය යුත්තේ, සිල් සමාදන් ව ආධ්‍යාත්මික ජීවිතය සකසා ගත යුත්තේ මහලු වයසේදී බවය. ජීවිතයේ අනෙක් සියලුම සැප ලැබ, නිවන්සැප වයසට යෑමේ දී මරණයේ දී ලැබෙනු ඇති බවය.

යමක් කමක් කර කියාගත නොහැකි අවස්ථාවේ නිවන් යාම බහුතරයකගේ අදහසයි. යම් විටෙක තරුණ වයසක කෙනෙකු ධර්ම මාර්ගයට යොමු වුවහොත් බොහෝ අය ඒ පිළිබඳව සෘණාත්මක ව කතා කිරීමට සහ සිතීමට පෙළඹේ. ගෙදර ප්‍රශ්න, පවුල් ප්‍රශ්න ජීවිතය කළකිරී ඇති ලෙස බොහෝ නිගමනවලට පැමිණේ.

අපරාදෙ හොඳට ඉගෙන ගත් දරුවෙක් මේ විදියට දහමට නැඹුරු වෙලා ලස්සන රූපයක් තියෙන කෙනෙක් ඇයි මේ වයසෙම එහෙම තීන්දුවක් ගත්තෙ ආදී වශයෙන් ඒ ගැන කතා කිරීමට පෙළඹේ. එයට ප්‍රධානතම හේතුව වන්නේ දහමට නැඹුරු වීමට නිශ්චිත වයසක් ඇතැයි සමාජය තුළ දූර්මතයක් පවතින බැවිනි.

මෙම දේවතාවියගේ ප්‍රශ්නය ද එසේම ය. එහිදී සමිද්ධි හිමියන් නැවත ඇයට දේශනා කරනුයේ මම මේ ආත්මයෙහි වින්ද හැකි සැපයක් හැර දමා කල්ගත වන සැපයක් පස්සේ නොදුවමි. ඒ වෙනුවට කල්ගත ව ලැබෙන සැප හැරදමා මේ ආත්මයෙහි ලැබෙන සැප පස්සේ දුවමි. මම කාලය ඉක්මවා නොයෑමට මෙලෙස තරුණ කාලයේ දීම ආධ්‍යාත්මික සුවය සොයන බවයි.

වයසට යාමේ දී බොහෝ ආබාධ ඇතිවේ. ඒ කාලය තුළ වැඩි වේගයකින් ආධ්‍යාත්මික සුවය සෙවීම අපහසු ය. විශේෂයෙන් වයසට යාම යනු විශ්‍රාමික ජීවිතයයි. සමාජය සමඟ ගැටී බොහෝ කාරියන් සිදු කරනුයේ තරුණ කාලය තුළය. කෙනෙකු වඩාත් ධර්මයට ළංවිය යුත්තේ මේ කාලය තුළදී ය. එවිට බොහෝ නොකටයුතුකම් ඔවුන් තේරුම් ගනී. එසේම තමාගේ පිරිසුදු බව ඒ තුළ තහවුරු කරගත හැකි ය. එය සමාජයට ද යහපත් ව බලපානු ලැබේ.

එහෙයින් වයසට ගොස් දුබලතා සමඟ නිවැරැදි වෙනවාට වඩා තරුණ වයසේ දීම යහපත් මාර්ගය සොයා ගැනීම ඉතා වැදගත් ය.

සිගාල ගෘහපතියා තරුණයෙකි. සදිසාව ගැන තථාගතයන් වහන්සේ දේශනා කළේ එතුමාට ය. දීඝජානු තරුණයෙකි දෙලොව සුගතියට අවශ්‍ය දහමක් දේශනා කරන්න යැයි සඳහන් කළේ ඔහු ය. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය එහි ප්‍රතිඵලයකි.

යසකුල පුත්‍රයාගේ යහළුවන් පනස් හතර දෙනාම තරුණයන් ය. තම මිත්‍රයා නිවැරැදි දර්ශනයක් වැළඳ ගැනීම නිසා යහළුවෝද බුදුන් සරණ ගියහ.

භද්ද වග්ගිය කුමාරවරු යම් දඩබ්බර පිරිසකි. තමා සෙවීම වැදගත් බව දේශනා කිරීමත් සමඟ ඔවුහු ධර්මයෙහි පිහිට ලැබූහ.

සංස්කෘත සාහිත්‍යයට අනුව යෞවනය ඇතැම්විට ගංගාවක් සේ සැඩ ය. ගලා යාමට දිසාවක් නැති වූ විට පිටාරගලා යා හැකි ය. තරුණ නැගිටීම් ඇති වන්නේ ඔවුනට අවශ්‍ය දිසාව නොපෙන්වන අවස්ථාවල දී ය. එහෙයින් ඔවුනට අවශ්‍ය පිළියම ධර්මය තුළ ගැබ්ව ඇත. ඒ සඳහා ඔවුන් යොමු කිරීම කාලීන අවශ්‍යතාවයකි. කායික මානසික ශක්තිය නිකරුණේ අපතේ යැවීම බුද්ධිගෝචර නොවේ.

සමිද්ධි හිමියන් ලස්සන, ජවසම්පන්න තරුණ භික්ෂුවක් ලෙස තම කාලය නිවැරැදිව යොදා ගත්හ. දේවතාවිය අමතා උන්වහන්සේ දේශනා කළේ තමන් මෙතරම් ම තරුණ කාලය තුළ දහමට නැඹුරු වූයේ දහම එහිපස්සික ඕපනයික, සන්දිට්ඨික, අකාලික තමන්ට සැපයක් යැයි දැනෙන ගුණයන් ඇති නිසා බවයි.

මෙහිදී ඒහිපස්සික යනු ඇවිත් බැලිය හැකි, බලන්න යමක් ඇති, එසේම කෙනෙකුට, බලෙන් හෝ ගෙනත් පෙන්විය හැකි නිසා ය. බොහෝ දේ එසේ පෙන්විය නොහැක. සහතික දිය නොහැක. අභ්‍යන්තරය හිස් ය. ඇතැම් දර්ශන මතවාද මෙන් ය. බුදු දහම එසේ නොවේ. ජ්‍යොතික රත්නයක් මෙන් සැම කල්හි සතර දිශාව ආලෝකවත් කරයි. වෙන හැම දේකටමත් වඩා මුලින්ම තම සිතේ පවත්වාගත යුතු බැවින් ඕපනයික වේ. ඇතැම් දෑ සම්බන්ධයෙන් අපරාදේ වැනි හැඟීම් පසුකාලීන ව ඇති වේ. මට එහෙම නොකරන්න තිබ්බේ වැනි පසු තැවීම් ඇතිවේ. එහෙත් දහම සම්බන්ධයෙන් එසේ නොවේ. දහම සාන්දෘෂ්ටික ය. තමාටම ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ය.

ඵලය ලැබීම තමන්ම අත්විඳී, වැඩිකල් නොගොස් එවෙලේම ප්‍රතිඵල ලැබිය හැකි බැවින් දහම අකාලික වේ.

ලෝකයෙහි සියල්ල කාලීකය. ඒ අතර ධර්මය අකාලික ය. යම් පැළයක් රෝපණය කළත් එහි ඵලය හට ගැනීමට කාලයක් ගත වේ. දහම එසේ නොවේ.

අහෝ සැපයි , අහෝ සැපයි කියා යමක් විඳිය හැකි නම්, එය ධර්මයෙන් ලබාන විමුක්තිය පමණි. පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූ යන ගුණය ඒ අරුතින් ධර්මයෙහි ඇති තවත් ගුණයකි. පණ්ඩිත අය එසේ සැප යැයි සැලකීම ධර්මයෙහි අන්තර්ගත ගුණයකි. සමිද්ධි හිමියන් දේවතාවියට දේශනා කරනුයේ මෙම ගුණ නිසා තමන්ගේ තරුණ ජීවිතය දහමෙන් පෝෂණය කර ගැනීමට තීරණය කළ බව ය.

අප ශාස්තෘන් වහන්සේ බුද්ධත්වයට පත්වන්නේ තරුණයකු ලෙස ය. එවන් පසුබිමක තරුණයන් දහමට නැඹුරුවීම පිළිබඳ දෙවතාවක් නොසිතිය යුතු ය. සිදුවිය යුත්තේ ද එයමය.

විහාරස්ථාන, එමෙන්ම ආගමික වැඩසටහන් සංවිධානයේ දී තරුණ පිරිස ඉලක්ක කර ගැනීමට අත්‍යවශ්‍ය ය. නිරන්තර ව පන්සලට පැමිණෙන පිරිස් සමඟ ආගමික කටයුතු සංවිධානය කරනවා වෙනුවට නොපැමිණෙන තරුණයාත් කැඳවාගෙන කටයුතු මෙහෙයවීම අවශ්‍ය වේ. ඒ තුළ සාරවත්, ගුණවත්, පව, පින විශ්වාස කරන සමාජයක් බිහි කර ගත හැකි වේ.



# දන්නා දෙය ගැන නොදන්නා ලෙස සිටින්නේ ඇයි?



**අප්පමාදෝ අමතපදං - පමාදෝ මච්චුනෝ පදං**
**අපමත්තා න මියන්ති - යේ පමත්තා යථා මතා**

*"පමා නොවීම නිවනට මඟ ය. පමා වීම මරණයට මඟ ය.*
*පමා නොවූවෝ නොමැරෙති. පමා වූවෝ මළවුන් වැනි වෙති."*



ඇසළ පුර අටවක පෝදා

## දම් දෙසුම



කොළඹ 06, හැව්ලොක් සිටි, සාමවිහාරාධිපති

**අතපත්තු කන්දේ ආනන්ද හිමි**

**අප්‍රමාදය හෙවත් පමා නොවී ම , නැත හොත් අද කළයුතු දෙය හෙටට කල් නොදැමීම බුදු සමයේ දී ඉගැන්වෙන ඉතා ප්‍රකට සදුපදේශයකි.**

ක්‍රියාත්මක නොකළ ද අපේ ජන සමාජයට මෙම හඳුන්වා දීම විරල වූවක් නොවේ. එහෙත් අපේ බෞද්ධ සමාජය තුළ ඇතැම්විට බොහෝ සෙයින් දන්නා දෙය වුවද නොදන්නා ලෙස සිටීමට කැමැත්තක් දක්වන අයුරු දක්නට ලැබේ.

භාරත දේශය ක්‍රි.පූ: 06 සියවස වන විට විවිධ ආගමික ඉගැන්වීම් නිසා ජන මනස ඔද්දල් වූ ස්වභාවයක පැවති බව ප්‍රකට කරුණකි. මෙම නිසා බුදුවරයන් වහන්සේ නමකගේ පහළ වීම මෙම සමාජය අපේක්ෂා අතර, සෙසු විවිධ ඉගැන්වීම් අතර බුදු දහම නැවුම් දර්ශනයකින් යුතු වූ ඉගැන්වීමක් වූ බව නොරහසකි.

සම්මා සම්බුද්ධත්වයට පත් සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ තත්කාලීන ව පැවති සාම්ප්‍රදායික ආගමික පරිසරය නව මඟකට යොමු කිරීම සඳහා උන්වහන්සේගේ තාරුණ්‍ය හා සමාජ ප්‍රභූත්වය බහුල වශයෙන් හේතු වූවා යැයි අනුමාන කළ හැකි ය. එම සමාජයෙහි ආගමික නායකත්ව දරන ලද ෂට් ශාස්තෘවරුන් පිළිබඳව සිතා බැලුව ද එතුමන් වහන්සේලා සියලු දෙනාම ඉතා වයෝවෘද්ධ තත්වයෙන් පසු වූයේ වුව ද,බොහෝ පිරිස් සහිතව ගතානුගතික ව තම දර්ශනයන් ඉදිරිපත් කරමින් සිටි අය බවදක්නට ලැබේ.

තරුණ පැවිද්දෙක් ලෙස සම්මා සම්බුද්ධත්වයට එළඹි තථාගතයන් වහන්සේ සමඟ එක්වූ බොහෝ දෙනා තුරුණු විය ඉක්මවූවෝ නොවූහ. අගසව් දෙනමගේ සිට යස සහ භද්දවග්ගිය ප්‍රමුඛ බුදුරදුන් වෙත එළඹි පිරිස්වල සියල්ලෝ ම තුරුණු වියෙහි පසු වූහ. ඔවුහු නව දහමක් පිළිබඳ අපේක්ෂාවන් ඇතිව පැමිණි පිරිසක් බව දක්නට ලැබේ. ඒ අනුව තථාගතයන් වහන්සේගේ දේශනාවන් පැවති සාම්ප්‍රදායික ඉගැන්වීම් අභිබවනය කළ නවතම ඉගැන්වීම් ක්‍රමයක් විය.

බොහෝ දෙනා බොහෝ වෙනස් මඟක් ගත් මෙම ඉගැන්වීම් ක්‍රමයට ඇලුම් කළහ.එම නිසා වඩ වඩාත් බුදු දහමට නතුවීම වැළැක්විය නොහැකි විය. භාග්‍යවතුන් වහන්සේ වෙත බොහෝ පිරිස් වැල නොකැඩී දිනෙන්දින සමීප වූයේ උන්වහන්සේගේ දේශනා ක්‍රමයෙහි තිබූ ආකර්ශනීයවූත්, නැවුම් වූ ත්, තාර්කික වූ ත් සමානාත්මීය ස්වභාවය නිසා බව ඉතා පැහැදිලි ය.

තමා පිළිබඳව වන වගකීම අදෘෂ්‍යමාන ශක්තීන්ට හා කර්මය වෙත පවරා තිබූ සමාජයක තමා පිළිබඳව වගකීම ඇත්තේ තමාට ම බව පැවසීම මහත් සමාජ පෙරළියක් සඳහා හේතු වූවාට සැකයක් නැත.

තමන්ගේ සාංසාරික පැවැත්ම හෝ නැවැත්ම පිළිබඳ වගකීම තමන් වෙතම පවරන ලද තථාගතයන් වහන්සේ ඒ සඳහා අප්‍රමාදී ව ක්‍රියා කිරීම සඳහා පුද්ගලයා හා සමාජය දිරිගන්වා ඇත්තේ සුවිශේෂී ආකාරයකට බව දක්නට ලැබේ.

පන්සාළිස් වසක් මුළුල්ලේ ලෝකාර්ථ චරියාවෙහි නිරත වූ තථාගතයන් වහන්න්සේ මහා කරුණාවෙන් යුතුව තම ශ්‍රාවක ශ්‍රාවිකාවන් මෙහෙයවන ලද්දේ අප්‍රමාදීව ක්‍රියා කිරීම සඳහාම ය. සම්බුදු සිරිත ආරම්භයේ සිට පරිනිර්වාණය දක්වාම භාග්‍යවතුන් වහන්සේ බොහෝ දේශනා සිදු කිරීමේ දී තේමා කොට ගෙන ඇත්තේ ද අප්‍රමාදීව ක්‍රියා කිරීමේ අගය බව ත්‍රිපිටක සාහිත්‍ය මඟින් මනාව අනාවරණය කොට තිබේ.

විවිධ උපමා උපමේය භාවිත කරමින් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කොට ඇත්තේ "හිස ගිනි ගත්තෙකු එම ගින්න නිවා දැමීම සඳහා" යුහුසුළු වන්නාක් මෙන් අප්‍රමාදී ව ක්‍රියා කළ යුතු බව ය. එමෙන්ම "ආදිච්චස්මිංඅගාරස්මිංයං නීහරති භාජනං" ගෙය ගිනි ගත් විට එහි ඇති භාණ්ඩ එළියට ගැනීමද මතු නොව ගින්න නිවා දැමීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගන්නාක් මෙන් ප්‍රමාදී බව දුරලීම ද කළ යුතු බව අවධාරණය කොට තිබේ.

මෙසේ විවිධ අවස්ථාවන්හි දී විවිධාකාරයෙන් අප්‍රමාදී ව ක්‍රියා කිරීම පිළිබඳව අනුශාසනා කරන ලද තථාගතයන් වහන්සේ පරිනිර්වාණ මංචකයේ දී පවා මහණෙනි සියලු සංස්කාර ධර්ම අනිත්‍ය" වන අතර, අප්‍රමාදීව සිහියෙන් කටයුතු කරන්නැයි අවවාද කොට ඇත්තේ ද තමන් වහන්සේගේ අවසන් බුද්ධ වචනය වශයෙනි.

කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ දී භාග්‍යවතුන් වහන්සේ විසින් ඉහත ගාථාවන්ගෙන් අප්‍රමාදී බවෙහි අගය ප්‍රකාශ කිරීම සඳහා හේතුපාදක කොටගෙන ඇත්තේ, සෝවාන් බවින් ද යුතුව මහත් පින්කම්වල නිරතව සිටි සාමාවතී බිසව ඇතුලු සේවිකා පිරිස මාලිගයට ගිනි තබා සාමූහික ව මරා දැමීමේ සාහසික ක්‍රියාව ය.

රටෙහි පාලකයා වූ උදේනි රජුගේ බිසෝවරු අතර සාමාවතිය ඉතා සැදැහැ සම්පන්න කුල කාන්තාවක් ලෙස ප්‍රකට ය. එහි විසූ මාගන්දියා රූ සිරියෙන් අගපත් ය. එමෙන්ම කුරිරු කමින් ද අගපත් ය වූ කාන්තාවකි.

තමාගේ රූමත්කම පිළිබඳව මහත් ආඩම්බරයෙන් පසු වූ ඇය විවාහ කරදීම සඳහා මව්පියන් තෝරාගනු ලැබුයේ බුදුරජාණන් වහන්සේය. එහිදී උන්වහන්සේ විසින් සිරුරෙහි ඇති පිළිකුල් බව ප්‍රකාශ කිරීම නිසාඇය බුදුරදුන් කෙරෙහි වෛරීව ක්‍රියා කළා ය. බුද්ධෝපස්ථානයට යන අය කෙරෙහි ද වෛරීව ක්‍රියා කරන්නියක් වූවා ය. එපමණකුදු නොව තථාගතයන් වහන්සේට දාමරිකයන් ලවා අපහාස කරවමින් උන්වහන්සේගෙන් පළිගැනීමෙහි ද නිරතව සිටියා ය.

මෙම පාපකාරී කාන්තාව වෛරී වූයේ භාග්‍යවතුන් වහන්සේට පමණක් නොවන අතර උන්වහන්සේ වැඩීම සඳහා නිතර විහාරයට ගිය සාමාවතීය පිළිබඳව ද පසු වූයේ බද්ධ වෛරයකින් යුතුව ය. ඒ අනුව එක් දිනක් සාමාවතිය සිය මාළිගයෙහි පරිවාර ස්ත්‍රීන් හා සමඟ සිටියදී අපරාධකරුවන් ලවා ගිනි තබා විනාශ කරන ලදී.

මේ නිසා උදහස් වූ රජතුමා මෙය මාගන්දියගේ කුමන්ත්‍රණකාරී ක්‍රියාවක් බව තේරුම්ගෙන එම පාපකාරී ස්ත්‍රීය මතු නොව ඇගේ ඥාති සමූහයද සමූල ඝාතනය කරන ලද ආකාරය ලොමු දැහැගැන්වෙන අයුරින් අපේ ධර්ම සාහිත්‍ය මඟින් වාර්තා කොට තිබේ.

මේ මහා සාපරාධී විනාශය අරමුණු කොටගත් භාග්‍යවතුන් වහන්සේ විසින් අප්‍රමාදීහු මිය ගිය ද නොමියන බවත් , ප්‍රමාදීහු ජීවත් වුවත් මියගිය වුන් වැනි බවද සදහන් කරමින් මෙම උතුම් දම් දෙසුම සිදුකරන ලදී.



# ජීවිතය සුවඳවත් කරන ප්‍රතිපත්තිගරුකබව



ගොතටුව පාරමිතා ශ්‍රී මහා බෝධිමලු
විහාරාධිපති, ශාස්ත්‍රපති පණ්ඩිත
**අරම ශ්‍රී ධම්මතිලක නා හිමි**

**දුක්ඛදායක ලෝකයක සැරිසරන සත්වයා ඒ දුකෙන් මුදවා ගැනීම අරබයා චතුරාර්ය සත්‍ය ධර්මයක් බුදුරජාණන් වහන්සේ අපට පෙන්වා දුන්හ. දුක, දුක ඇතිවීම, දුක නැති කිරීම හා දුක නැති කිරීමේ මාර්ගය යන චතුස් සත්‍ය කෙරෙහි අවධානය යොමු කොට ඒ අනුව අපගේ ජීවිතය සකස් කර ගත යුතු ය. මෙය න්‍යායාත්මක ස්වරූපයක් නොව ප්‍රායෝගික සාධකයකි.**

ජීවිතය වඩාත් උසස් තලයකට අවතීර්ණ වන්නේ ප්‍රතිපත්ති මත ය. මේ ප්‍රතිපත්තිවල එකම ස්වරූපයක් තිබිය යුතු ය. බාහිර හා අභ්‍යන්තර වශයෙන් දෙකක් බැරිය. චරිත දෙකක් ජීවිතයට රඳවා ගතහොත් එය මුළා කිරීමකි. මුළා වන්නේ සමාජය නොව තමන්ම ය. මෙය මැනවින් සාක්ෂාත්කොට ගත යුතු ය.

## දෙබිඩි චරිත

අද්‍යතන සමාජයේ අපට දකින්නට ලැබෙන බොහෝ අයගේ ජීවිත දෙබිඩි ය. නිවෙසට එක ජීවිතයකුත්, සමාජයට තවත් ජීවිතයකුත් වශයෙන් දෙයාකාර ය. මෙය තමන් රවටා ගැනීමකි. ආත්ම වංචාවකි.

බාහිර වශයෙන් සුරාපානය නො කරන්නේ යැයි හඟවා නිවෙසේ දී සුරාපානය ගන්නේ නම් එය තමන් ම රවටා ගැනීමකි. පංචශීල ප්‍රතිපත්තිය යම් පුද්ගලයකු අකුරට ම ඉටු කරන්නේ නම් මේ අනවරාග්‍රභවය අපට කෙටි කරගත හැකි ය.

මිනිසා සංවේදී, විනය ගරුක, ශික්ෂණයෙන් යුත් පුද්ගලයෙක් බවට පත් කරන්නේ ධර්මය යි. ධර්මය කෙරෙහි සිත් සතන් යොමු කොට ඒ අනුව යමකු දිවි ගෙවන්නේ නම්, ගැටලු මතු නොවේ.

## පංචශීලයෙහි පිහිටීම

පංච ශීලයෙහි යමකු රැඳෙන්නේ නම් එම පුද්ගලයා ජීවිතය ජය ගන්නෙකි. සත්ත්ව ඝාතනයෙන් වැළැකීම, සුරාපානයෙන් වැළැකීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැකීම, බොරු කීමෙන් වැළැකීම ආදියෙන් යම් පුද්ගලයකු දුරස් වන්නේ නම් එම පුද්ගලයා දැහැමි ස්වරූපයෙන් උපයුක්ත ය.

හුදෙක්ම ජීවිතයේ යතාර්ථය මැනවින් අවබෝධ කොට ගත් පුද්ගලයා ප්‍රතිපත්ති පූජාවට නිරන්තරයෙන්ම නැඹුරු වෙයි. උදේ පටන් රාත්‍රී වනතුරු බණ ඇසුවත්, බුදුරදුන්ට කො තරම් මල් පූජා කළත්, බණ පොත කොතරම් පරිශීලනය කළත් පුද්ගලයා කෙරෙහි ප්‍රතිපත්ති ගරුක ස්වරූපයක් නැත්නම් ඒ වැයමෙන් කිසිදු ඵලක් නොමැත.

## ප්‍රසන්න බව

ප්‍රතිපත්තිවලින් උපයුක්ත පුද්ගලයා ඉතාම ප්‍රියජනක ය. එක් වරක් ඔහු හෝ ඇය දෙස බැලූවොත් පුන පුනා ඒ දෙස බලන්නට නැඹුර වේ. ඒ මන්දයත් ඒ අය කෙරෙහි පවත්නා ප්‍රතිපත්තිගරුක භාවය මත ය.

ඉවසීම, දයාව, කරුණාව, අන් අය කෙරෙහි දක්වන භක්තිය, නිතරම තමන්ගේ ජීවිතයට දක්වන සැලකිල්ල අන් අය කෙරෙහිත් දැක්වීම, ප්‍රතිපත්තිගරුක තැනැත්තා කෙරෙහි පවත්නා ලක්ෂණයන් ය. අප ප්‍රියජනක භාවයට පත්විය යුතු ය. එසේ නොමැතිව අමනුෂ්‍යයෙක් ලෙස ජීවත්වුවහොත් එම ජීවිතයෙන් ඵලක් නොමැත.

මිනිසා අමනුෂ්‍යයකු බවට පත්වන්නේත් ස්වකීය දිවි මගෙහි ප්‍රතිපත්ති නොමැති නිසා ය. මනුෂ්‍යත්වයක් ලබා ගන්නේ ඉතාම දුෂ්කරතා මධ්‍යයේ ය. එම මනුෂ්‍යත්වය අප රැක ගත යුතු ය.

## වසලයා කවුද

'වසලයා' යන්නට බුදුරදුන් නව අර්ථකථනයක් දී ඇත. නරක වැඩ කරන පුද්ගලයා බුදුරදුන් හැඳින්වූයේ 'වසලයා' යනුවෙනි. කෙනෙකු වසලයකු වන්නේත්, බ්‍රාහ්මණයෙකු වන්නේත් උත්පත්තියෙන් නොවේ. වසලයකු වන්නේ කරන ක්‍රියා හේතු කොටගෙන ය.

උසස් අයට උසස් අන්දමට සැලකීම, පිදිය යුත්තන් පිදීම, බොහෝ ඥානය තිබීම, ශිල්ප ශාස්ත්‍රවල දක්ෂකම, විනය ගරුක වීම, මානව ශික්ෂණය, හොඳ වදන් පැවසීම මංගල කරුණු ලෙස දැක්වේ. ප්‍රතිපත්ති ගරුක පුද්ගලයා කෙරෙහි පවත්නේ මෙවන් ලක්ෂණයන් ය.

අනවරාග්‍ර වූ හෙවත් කෙළවරක් නැති භවයෙන් මිදෙන්නට නිතරම සිතට ගත යුතු ය. අද සමාජයේ බොහෝ අය කෙරෙහි දක්නට නැත්තේත් මෙයම ය.

සංයමය ආත්මකොට ගන්නා ප්‍රතිපත්තිගරුක පුද්ගලයා කිසිම දෙයකට සැලෙන්නේ නැත. එමෙන්ම අනවශ්‍ය බරක් හිසේ දරා ගන්නේත් නැත. ඉතාම සැහැල්ලු දිවි පෙවෙතක් අනුගමනය කරන ප්‍රතිපත්ති ගරුක තැනැත්තා සමාජයට අතිශය පරමාදර්ශී පුද්ගලයෙකි.

අන් අයගේ චරිතවලට කිඳා බැස විවේචනයට යොමු වන්නේ නැත. නිසල චරිතයක ස්වරූපය පෙන්නුම් කරන්නේ ය.

ජීවිතය ආත්මයෙන් කෙළවර වන්නේ නැත යන්න බුදුසමයේ ඉගැන්වේ. ආත්ම, අනාත්ම සංකල්පයේ දී අනාත්මය මත රැඳී සිටින බුදුසමය ප්‍රතිපත්ති මත පිහිටි චරිතයකින් අපේක්ෂා කරන්නේ ආත්මය කෙටි කර ගන්නට ය.

යතාර්ථය සාක්ෂාත් කරගෙන අවබෝධකොට ගත යුතු යුතුය. සමාජ යථාර්තය, පුද්ගල යතාර්තාය පුද්ගලයා විසින් අවබෝධ කොට ගත යුතු ය. අවබෝධයෙන් තොරව කටයුතු කරන්නේ නම් ජීවිතය මුළා වේ.

නරක සිතුවිලි ප්‍රතිපත්තිගරුක පුස්ගලයා කෙරෙහි ඇතිවිය නොහැකි ය. පාරිශුද්ධාත්මක දිවියකට අර අඳින, මංපෙත් විවර කර ගන්නා පුද්ගලයාට නිරන්තරයෙන්ම සැනසිල්ලක් අත්වේ. අන් අය තලා පෙළා, පහත් අඩියකට පෙරළා දමන්නට අන් අයගේ සැපතට අකුල් හෙළන, ඊර්ෂ්‍යා කරන පුද්ගලයාට කිසිදු ප්‍රතිපත්තියක් නැත.

## සැපතට සතුටුවීම

අන් අයගේ සැපතට සතුටු වන පුද්ගලයා ප්‍රතිපත්තිවලින් පරිපූර්ණ ය. එය සලකන්නේ තමන්ගේ සැපතක් ලෙස ය. අන් අයගේ සැපත තවත් වර්ධනය කරන්නට දක්වන්නේ අපූර්ව ලැදියාවකි.

## මිණුම් දඬු දෙකක්

"පුද්ගලයෙකු යැයි කියා කෙනෙකු පරමාර්ථ වශයෙන් පවතින්නේ නැතැයි බුදු සමය පවසන අතර, පඤ්චස්කන්ධයෙන් සකස්වුණු සම්මුති වශයෙන් පවතින්නා වූ, එම නිසා සංස්කෘත වූ පුද්ගලයකුගේ පැවැත්ම පිළිගෙන ඇත. එබඳු පුද්ගලයෙකු සම්බන්ධ ව කතා කරන විට, පුද්ගල අනන්‍යතාව නිර්ණය කිරීම සඳහා මිනුම් දඬු දෙකක් උපයෝගී කරගෙන ඇත. පඤ්චස්කන්ධය දෙයාකාරයක සිද්ධීන්ගෙන් සමන්විත වේ. එනම් ශාරීරික හා මානසික සිද්ධීන් ය. මේ දෙයාකාරයේ ම සිද්ධීහු නිරන්තරයෙන් වෙනස් වෙමින් පවතී.

මාංශ අනුභව කරන්නේ නැත්නම් එය අඛණ්ඩව පැවතිය යුතු ය. අතරමගදී එම පිළිවෙත තබාගෙන යළි මාංශ අනුභව කරන්නට ගියොත් ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමකි. එක් අතකින් මෙය මායාවකි. තවත් අතකින් තමන්ගේ සිත පාලනය කර ගැනීමට තමන්ට හැකියාවක් නැතිකමයි.

මෙබඳු දුර්වල චෛතසිකයකින් විඥනයක් පහළ නොවේ. කිසියම් ඒකාග්‍රතාවක සිත තබා ගත යුතු ය. තමන්ගේ චිත්ත චෛතසිකය පාලනය කර ගන්නට තමන්ට ශක්තියක්, හැකියාවක් තිබිය යුතු ය.

## තිලකුණු මෙනෙහි කිරීම

මෙතැන දී තමන් සදාකාලික වශයෙන් ජීවත් නොවන බවත් තේරුම් කරගත යුතු ය. ජීවිතය අනිත්‍ය යයි, දුක්ඛයි, අනාත්මයි යන තිලකුණු කෙරෙහි අවධානය යොමු කළ මනා ය.

පුද්ගලයා තමන්ට ලබාගත නොහැකි බොහෝ දේ ලබා ගන්නට මහත් වෙහෙසක් ගනු ලැබේ. මේ ඔස්සේ අඛණ්ඩව ම සිත යොදවයි. මෙය ද මහා දුකකි. මේ දුකෙන් අප අත් මිදිය යුතු ය. ඇයි මෙතරම් දුකක් ජීවිතයට දෙනු ලබන්නේ, තමන් ලද පමණින් සතුටට පත්විය යුතු ය. අන් අයගේ ධනයට ආශා කිරීමෙන් තමන්ට කිසිදු සෙතක් අත්නොවේ. තවදුරටත් ජීවිතය ප්‍රපාතයට ඇද වැටීමකි මෙයින් නිරූපණය වන්නේ.

ප්‍රතිපත්තිගරුක පුද්ගලයා කිසිම දෙයකට, කිසිවකුට බයවන්නේ නැත. මරණයට නිතරම සූදානමින් සිටියි. ප්‍රතිපත්ති සමුදායක දිවි ගෙවීම අනුව ස්වකීය විඥනය සුඛවිහරණය උදෙසා මෙහෙයවීම අනුව ජීවිතයෙන් ජය ගැනීමක් සිදුවන්නේ ය. ප්‍රතිපත්තිවලින් තොර පුද්ගලයා නිතරම පරාජිත ස්වරූපයක් දරයි. පරාජිත පුද්ගලයා පසුපස හඹායාම වෙනුවට ජයග්‍රාහී පුද්ගලයා පසුපස හඹා යා යුතු සාධකය, නියතය වෙත යා යුතු ය.

# ආපදාවක දී පිහිට ඉල්ලා අනුන්ට දීන වන්නේ ඇයි



**වස්තුව සපයන්නට බලාපොරොත්තු වන්නා වූ ගිහියන් විසින් මලත්, මලේ වර්ණයත්, මලේ සුවඳත්, සටහනත් නො නසා, ඒවාට මද වශයෙන් හෝ හානියක් සිදු නො කොට මල්වලින් රොන් ගෙන, මී බඳින මී මැස්සන් මෙන් අනුන් නොපෙළා වස්තුව සැපයිය යුතු බවත්, එසේ මදින් මඳ වස්තුව සපයන්නා වූ තැනැත්තාට වස්තුව රැස් වන්නේ තුඹසක් බඳින වේයන් මදින් මඳ පස්ගෙන තුඹසක් ගොඩ නඟන්නාක් මෙනැ'යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක**

මෙසේ වස්තුව රැස් කොට, වස්තුව කොටස් හතරකට බෙදිය යුතු ය. එයින් කොටසකින් එදිනෙදා ජීවත්වීම පිණිස වැය කළ යුතු ය. දෙකොටසක් තවත් ආදායම් ලබන්නට කර්මාන්තාදී යම් කිසිවක් සඳහා යෙදිය යුතු ය. ඉතිරිව තිබෙන අනෙක් කොටස යම්කිසි රෝගාබාධ වැනි ආපද අවස්ථා පැමිණි කල්හි ගැනීම පිණිස තැන්පත්කොට තැබිය යුතු ය. යම් ගිහියෙක් මෙසේ ක්‍රමවත්ව කටයුතු කරන්නේ නම් හෙතෙම මිත්‍රධර්ම ද මැනැවින් ආරක්ෂා කරන්නේ ය. කල්‍යාණ මිත්‍රයෝ ද ඔහු හා එක්ව සබඳකම් පවත්වති.

ගිහියන්ට වස්තුව අත්‍යවශ්‍ය ය. ගිහියකු තුළ සැප සතරක් තිබිය යුතු බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක. ඒ සතරෙන් අත්ථි සුඛය (තමන්ට තමන්ගේ වැඩ කර ගැනීමට තරම් ධනවත් බවක් තිබීම) යනු පළමු වැනි සුවය යි.

ධනවතා සිය ධනය වැයකොට තමන්ගේ අත්‍යවශ්‍යතාවන් සපුරා ගනිමින් අනාගතයෙහි යම්කිසි ආපදාවක් පැමිණිය ද වියදම් කොට සැනැසිල්ල උදාකැරගත හැකි බව සිතා සැනැසෙන්නේ ය. ඔහුට පරිවාර සම්පතෙන් ද අඩුවක් නොමැත. නෑ මිතුරු සියල්ලන් ම ධනවතා පිරිවරා ගැනීම ස්වභාවය බැවිනි.

ගිහියකු තුළ තිබිය යුතු වූ සැපතක් වන අනවජ්ජ සුඛය (මම දැහැමින් සෙමෙන් ධන සම්පාදනය කෙළෙමි'යි ලැබෙන සැනැසිල්ල) තිබිය යුතුය. එකී අනවජ්ජ සුඛයට බාධා නොවන පරිදි මී මැස්සා මලෙන් රොන් ගන්නා සේ කිසිවකුට හානියක් අලාභයක් නොවන පරිදි තමන්ගේ ශ්‍රමය වැය කොට ධන හානියක් අලාභයක් නොවන පරිදි ධන සම්පාදනය කළ යුතු ය.

නොපසුබස්නා වීර්යයෙන් සපයා ගන්නා ලද, දෙ අත් බලය යොදා සපයා ගන්නා ලද්දා වූ , ඩහදිය වගුරුවා මහන්සියෙන් සපයා ගන්නා ලද්දා වූ ඒ නිසා ම ධාර්මික වූ දැහැමින් ලැබුණා වූ වස්තුව විය යුතු ය.

තමන් මහන්සියෙන් සපයා ගන්නා ලද ධනය වැය කිරීම ද ඉතා කල්පනාකාරීව කළ යුතු ය. පළමු කොට භෝගාපාය මුඛ (වස්තුව වැනැසෙන දොරටු) තේරුම් ගෙන, ඒවාට වස්තුව වැය නොකොට රැකගෙන, තමන් විසින් කළමනා යුතුකම් පිණිස වැය කොට තමන්ගේ සහ තම දරුවන්ගේ අනාගතය සලකා ඒවාට යම්කිසි කොටසක් වෙන් කොට තබා ගත යුතු ය.

ගිහියකුට තිබෙන්නට අවශ්‍ය වන්නා වූ සැප හතරෙන් භෝග සුඛය ද එකකි. තම වස්තුව පරිභෝග කළ සැටි සිතා බැලීමෙන් උපදින්නා වූ සැපත (සැනසිල්ල) භෝග සුඛය නම්.

ඒ භෝග සුඛය තිසි ආකාරයෙන් ලබන්නට මතු සඳහන් වන පරිදි පිළිපැදිය යුතු බව බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කළ සේක.

මා විසින් මගේ ආහාරපාන ඇඳුම් පැළඳුම් ගමන් බිමන් ආදිය පිණිස වස්තුව මැනැවින් වැය කරන ලදී.

මා විසින් පෝෂණය කළ යුතු වූ මව්පියෝ ය, අඹුදරුවෝ ය. දැසි දස් කම්කරු පිරිස ය, යනාදී අය මැනැවින් පෝෂණය කරන ලදී.

අප වෙත පැමිණි විපත්තිවල දී ඒවා සඳහා කළ යුතු වියදම් කොට සහනය ලබා ගන්නා ලදී.

පරලොව සුව පිණිස දක්ෂිණා (දන්පින්) පිරිනමන ලදී.

නෑයෝ ය. ආගන්තුකයෝ ය. මිය පරලොව ගිය නෑ මිතුරෝ ය. රජවරුන් හෝ රජය වෙනුවෙන් පෙනී සිටින අය ය, දේවතාවෝ යන කොටස් පසට දිය යුතු දේ (ඥාතිබලි ආදී පස) දෙන ලදී.

ධනය වැය කොට සිල්වත් උතුමනට උපස්ථානය කරන ලදී. ගිහිගෙයි වසන කෙනෙක් යම් කිසි ප්‍රයෝජනයක් බලාපොරොත්තුවෙන් වස්තුව සපයන්නාහු නම්, ඒ ප්‍රයෝජනය මම මගේ වස්තුවෙන් ලැබුවෙමි.

මෙසේ කරන ලද එකී යුතුකම් අනුව සිතා බලන තැනැත්තා ආර්ය ධර්මයෙහි පිහිටියෙකි. ඔහුට නුවණැත්තෝ මෙලොව දී පසසත්. ඒ උතුම් ප්‍රතිපදා බලයෙන් සුගතිගාමී ව, අතිශයින් ම තුටු පහටු වන්නේය.

යමෙක් මෙකී පරිදි තමන් ද වස්තුවෙන් ප්‍රයෝජන නොගෙන, කළමනා යුතුකම් ද සම්පූර්ණ නොකොට, වස්තුව රැකබලා ගැනීමෙන් පමණක් සෑහීමට පත් වී වෙසේ නම්, ඔහුට ඒ වස්තුව නිසා බරක් මිස, වැඩක් නැත. පැන් පොකුණකට අරක් ගත්තා වූ රකුසකුට නොදෙවෙනි පුද්ගලයෙකැ'යි ඔහු වෙනුවෙන් කියනවා මිස වෙන කිව යුත්තක් නොමැත. බුදුරජාණන් වහන්සේ, දවස අදින්න පුබ්බක, මජ්ඡරිය, කෝසිය වැනි අය තරම් නූනත් ඔවුන්ට ආසන්න ධනවන්තයෝ මෙකල නැත්තාහු නොවෙති.

ධන සම්පාදන කැරැ ගත් තැනැත්තා විසින් ඒ ධනය කොටස් සතරක් කොට වෙන් කරගෙන සිහිබුද්ධියෙන් ක්‍රියා කරනවායැයි දේශනා කොට වදාළේ වුව ද, ගිහියන් හැම දෙනාට ම එසේ කරන්නට නොපිළිවන් බව ඉතා හොඳින් පැහැදිලි වේ. මෙය සිඟාලක සිටුපුත් හට දේශනා කරන ලද ධර්මයකි. සිඟාලක සිටු පුත්‍රයෙකි. සිටු පුත්‍රයකුට ලැබෙන ආදායම් ප්‍රමාණය ගැන සලකා බලත් ම ඔහුට ලැබෙන්නා වූ මුළු ආදායම් ප්‍රමාණය කොටස් සතරකට බෙදා එක කොටසක් වැය කිරීම ඔහුගේ එදිනෙදා සියලු වියදම්වලටත් ප්‍රමාණවත් වේ. අනාගතාභිවෘද්ධිය පිණිස යම් යම් කටයුතු සඳහා වෙන් කොට සිව්වන කොටස ආපදාපන්න අවස්ථාවන්හි ප්‍රයෝජනය පිණිස තැන්පත් කැරැ තබන්නටත් පිළිවන් ය.

මේ කරුණෙහි ලා අප විසින් පිළිපැදිය යුත්තේ මෙබඳු සූත්‍ර දේශනාදිය යථානුලෝමික දේශනා ගණයෙහි ඇතුළත් වන නිසා කාලය, දේශය, පුද්ගල යන කරුණු සලකා ඒ ඒ කාලය වශයෙන් ද ඒ ඒ දේශයන්ගේ වශයෙන් ද ඒ ඒ පුද්ගලයන්ගේ ද වශයෙන් ය.

සුදුසු පරිදි වැඩි වැඩ නොමැතිව චාම් ලෙස ජීවත් වෙමින් අනාගතාභිවෘද්ධිය පිණිස යොදන්නට ධනයක් නොමැති නම්, මොන විදියකින් හෝ දවසකට සුළු මුදලක් වත් එකතු කොට තබන්නට අවශ්‍ය බව තේරුම් ගත යුතු ය. එසේ නොකළොත් ආපදාවක් පැමිණි කල්හි අනාථවන්නට සිදුවන බව හොඳින් තේරුම් ගත යුතු ය.

එසේ නොකිරීම නිසා ආපදාපන්න අවස්ථාවලදී කර කියා ගන්නට කිසිවක් නොමැතිව අනුන්ගේ පිහිට සොයමින් එහේ මෙහේ දුවන්නටත්, අනුන්ට දීන වන්නටත් සිදුවනු ඒකාන්ත ය. එපමණක් නොව ඒ ඒ ආපදාවෙන් සහනයක් ලබන්නට නොලබා දුක්වීමට සිදුවේ.

මෙහිදී ප්‍රධාන වශයෙන් සැලකිය යුත්තේ තමන්ට ලැබෙන ආදායම් ප්‍රමාණය සිහි බුද්ධියෙන් තේරුම් ගැනීම ය. එසේ තේරුම් නොගෙන වැඩි ආදායම් ලැබෙන අය වැඩ කරන සැටි අනුකරණය කොට මමත් එලෙස උජාරුවට කටයුතු කරන්නේමි, එසේ නූනොත් එය මට මදි කමකි. යන වශයෙන් සිතා අනුන් අනුකරණය කරමින් ධනය වැය කළොත් ඔහු පමණක් නොව ඔහුගේ අඹුදරුවෝ ද අසරණ වෙති. ලෝකයෙහි තිබෙන යන්ත්‍ර සූත්‍ර පවා ක්‍රියා කරවිය යුත්තේ ඒවායේ තිබෙන බලය ශක්තිය අනුව ය. එය සැලකුවේ නැත්නම් ඒ යන්ත්‍ර සූත්‍ර පවා කැඩී බිඳී කාර්යක්ෂම නොවීම ඒකාන්ත ය. එමෙන්ම තමාගේ ආදායම් පමණ දැන ඒ අනුව ක්‍රියා කළ යුතු ය. එසේ නූනොත් ඇති වන්නා වූ පිරිහීම කොපමණදැ'යි කීමටත් අපහසු ය.


සමජීවිකතාවෙන් (අය – වැය තේරුම්ගෙන වැඩිත් නැතිව පමණට අඩුත් නැතිව සම සේ) ජීවත් වීමට යමෙකුට හැකියාව තිබේ නම් එය අගය කළ යුතු ය. වස්තුව මැනැවින් ආරක්ෂා කිරීම වශයෙන් වදාළ ආරක්ඛ සම්පදාව ගැන ද සලකා බැලීම වස්තුව නාස්ති කිරීමෙන් වැළැක්මට උපකාර වේ. ජීවක වෙදැදුරුතුමාගේ කතා පුවතෙහි හිසරදයෙන් පෙළුණ සාකේත නුවර සිටු භාර්යාවට ප්‍රතිකාර වශයෙන් ජීවක වෙදැදුරු තුමා නස්‍ය කළ විට, ඒ නස්‍යයෙන් ගලා ගිය ගිතෙල් ස්වල්පය පවා දැස්සක ලවා අරපරෙස්සම් කැරැ තැබීමේ පුවත ලොකු ආදර්ශයකි.

> යුතුකම් අනුව සිතා බලන තැනැත්තා ආර්ය ධර්මයෙහි පිහිටියෙකි. ඔහුට නුවණැත්තෝ මෙලොව දී පසසත්. ඒ උතුම් ප්‍රතිපදා බලයෙන් සුගතිගාමී ව, අතිශයින් ම තුටු පහටු වන්නේ ය.

**බුත්තල ඤාණධාර හිමි**

# අරියවංශ දේශනාව

**අතීතයේ ලක්දිව ඉතා ජනප්‍රිය දේශනාවක් වූ අරියවංශ දේශනාවට විශේෂත්වයක් හිමි වී තිබුණේ ය. එය අංගුත්තර නිකායේ උරුවෙල වග්ගයට අයති සූත්‍රයකි. මේ සූත්‍රය අරියවංස, මහා අරියවංස, වංස ආදී නොයෙක් නම්වලින් සඳහන් වේ.**



**අත්තුඩාවේ ශ්‍රී රාහුල හිමි**

මේ සූත්‍රය දේශනා කරන ලද්දේ උත්සවශ්‍රීයෙනි. අරියවංස දේශනාව කළ හැම තැනකම වොහාර තිස්ස රජු තිති දන් වැට පිදූ බව මහවංසයේ සඳහන් වේ.

අරියවංස දේශනාව කරන භික්ෂූන් වහන්සේට දන් දෙනු පිණිස රාජ රාජ මහා මාත්‍යයන් හා ධනවතුන් ගම්බිම් පූද කළ බව සෙල්ලිපිවල සඳහන් ව තිබේ.

දීඝ භාණක අභය හිමියන් පැවැත් වූ අරිය වංස දේශනාව ඇසීමට ස්ත්‍රියක් තම දරුවාට කිරි පොවමින් හැට යොදුන් මඟ ගෙවා පැමිණි බව දැක්වේ.

ගවරවාල අංගනයේ භික්ෂූන් වහන්සේ තිස් නමක් දෙසතියට වරක් අරියවංස සූත්‍රය දෙසූ බව සඳහන් වෙයි. එකල වැඩිපුරම මෙම සූත්‍රය දේශනා කොට තිබෙන්නේ වස් කාලයේ ය. ධර්මාශෝක රජතුමා සිව් පිරිස අමතා අරිය වස මෙනෙහි කරමින් භාවනා කළයුතු යැයි අශෝක සෙල් ලිපිවල ද පවසා තිබේ.

මහා ධර්ම කථිකයකු වූ දීඝ භාණක අභය ස්ථවිරයන් වහන්සේ අරියවංස සූත්‍රය මාතෘකා කොට දේශනාවක් පැවැත් වූ එක් අවස්ථාවක දී මුළු මාගම ම උන් වහන්සේගෙන් බණ අසන්නට පැමිණියහ. දේශනාවසානයේ දේශකයන් වහන්සේට බොහෝ පුද පඬුරු පූජා කළහ. අභය හිමියන් ගේ කීර්තියටත් ජනප්‍රිය භාවයටත් ඊර්ෂ්‍යා කළ එක්තරා මහ තෙර නමක්.

"අපූරුයි දීඝ භාණකයා අරියවංසය දේශනා කරමි'යි. රෑ තිස්සේ මහා ගාල ගෝට්ටියක් කෙළේ යැයි" පැවසී ය.

පසුදා උදෑසන මේ තෙරවරු දෙනම එහි සිට තම තමන්ගේ නිවාසස්ථාන කරා යෑමට එතැනින් පිටත් වූහ. ගව්වක් පමණ ගෙවන තෙක් දෙදෙනාටම යාමට තිබුණේ එකම මඟක ය. මඟ දිගටම මහලු ශ්‍රමණයා දීඝ භාණක අභය හිමියන්ට තොර තෝංචියක් නැතිව ම අපහාස වදන් කී නමුත් උන්වහන්සේ ඉතා සංසුන් ව ඉවසුවා මිසක් එකම වචනයකුදු නො බිණූහ. උන්වහන්සේගේ සිත යොමු වී තිබුණේ භාවනාවට ය.

මේ දෙනම තම තමන් වහන්සේලා ගේ විහාර ස්ථානවලට යෑමට වෙන් විය යුතු මං සන්ධියට පැමිණියහ. දීඝ භාණක හිමියෝ මහලු තෙර නමට වැඳ "ස්වාමින් වහන්ස, මේ ඔබ වහන්සේ යා යුතු මඟයැයි" පෙන්වූහ.

මහලු තෙර නම එය නැසුනාක් මෙන් ඒ මඟින් ගියේ ය.


***(අටුවා රසකතා ග්‍රන්ථය ඇසුරෙනි)***



## Lesson for mindfulness - part 8

# Mindfulness of Walking

Walking meditation can be explained as another process of mindfulness. This technique is inspired by many practitioners; it can be easily practiced and enjoyed, walking while doing relaxation.



**Battaramulla Sri Sudassanarama sadaham senasuna**
**Ven. Dr. Mirisse Dhammika Thero**

In time one can use this meditation anywhere, in any situation where one meets time and space-in the classroom, at the office, in a park and anywhere in the house. This technique helps develop a greater strength of awareness, as well as suppleness of mind. The object of awareness is the action of slow walking at the beginning. "Total attention is placed in the action of the feet as they move and connect with the ground, harmonizing the action of walking step by step with the breath" (Levete). The practitioner begins the walking practice by standing on the spot, and should maintain an erect body with heels together. While standing, pay attention to standing; acknowledge the standing and move the walking foot. Acknowledge the lifting of the right foot and move the foot forward with full attention on the heel.

Lower the foot and place it on the ground with total awareness of placing. The walking practice consists of three aspects: 'Lifting', 'moving' and 'placing'.

Acknowledge each aspect of walking mindfully, Focusing on the movements of the walking process until reaching the end of the allotted walking path.

The practitioner should stop with both feet together in the standing position with acknowledgement of 'standing'. When one turns around by rotating on the heel, acknowledge each aspect of the turning motion: the turning of the heel of one foot and the lifting and placing down on the ground of the other foot. Focus on the standing posture and begin to walk back. The walking practice is more beneficial if one follows as slowly and as mindfully as possible. When feelings, thoughts and sounds arise, acknowledge them and repeat mentally 'thinking, thinking, thinking…..' . After a few moments, bring the attention to the walking practice.

Dhammananda expresses that the practitioner should not resist the disturbances, because then one will be concentrating on the resistance and lose the mindfulness on walking.

**Total attention is placed in the action of the feet as the y m ove and connect with the ground, harmonizing the action of walking step by step with the breath**



# නිමක් නැති සසර ගමනට නිමාවක්



**සසර පුරා බැඳි සෙනෙහස සිරිමත් සංසිද්ධියකි. සසර ගමනේ නිමාවක් නැත. කලින් කල තැනක උපත ලබමින් දිවි ගෙවමින් යන මෙම ගමනේ දී අපට මුණ නොගැසුණ කෙනෙක් ද නැත. අප කළ නොකළ දෙයක් නැත. ඒ අතර හොඳ දේ මෙන්ම නරක දේ ද තිබිය හැකි ය.**

ඒ සියල්ල මාර්ගෝපකරණ වශයෙන් අප රැගෙන එන්නට ඇත. ඒ සියල්ලේ එකතුවක් වශයෙන් මේ සියල්ල අප සැලකිල්ලට ගත්ත ද වරදක් නැත. වත්මන් දිවිය ගොඩනැඟී ඇත්තේ ද අප එදා කී දේ අනුවම ය.

සසර ගමනේදී විවිධ කටුක හා අමිහිරි, මිහිරි හා සුමිහිරි අත්දැකීම් ලබන්නට ඇත. ඒවා දුක් වේදනාව හා පසුතැවිල්ල ගෙන දෙන අඳුරු අත්දැකීම් මෙන් ම, තවත් වරෙක සතුට, ප්‍රීතිය හා සැනසිල්ල ගෙන දෙන සොඳුරු අත්දැකීම් ද වෙන්නටත් පුළුවනි. ඒවා සියල්ල තාවකාලික යි.

තවත් සමහරක් දුක වේදනාව හා දෙම්නස ගෙන දෙන අමිහිරි අත්දැකීම් වෙන්නටත් පුළුවනි. කෙසේ වුවත් සියල්ල පිළිගන්න වෙනවා.

අග, මුල නොපෙනෙන මේ දිවි ගමනේ අප විඳිනාක් විඳ ඇත්තේ දුක් දෙම්නස් විනා සැබැවින් ම වෙනත් සැපයක් නම් වෙන්න බැහැ. ජීවිතයේ සැප යැයි විඳි හැම දෙයක් ම පිළිබඳ පුනරාවලෝකනයක යෙදෙන විට දැනෙන්නේ විඳ ඇත්තේ දුක් වැලක් පමණක් බවයි. සැපක් නම් විඳ ඇත්තේ ම නැත. සුළු හෝ සැපයක් වින්දේ නම් එහි වූයේ තාවකාලික සුවයකි.

මේ බව හරිහැටි නොදැන සැප වශයෙන් විඳ ඇත්තේ මහා දුක් රාශියකි. මව්පිය සෙනෙහස අහිමි වීමෙන්, යොවුන් වියේ බැඳි සෙනෙහස බිඳියාමෙන්, ගින්නෙන්, ජලයෙන් හා සොර සතුරු ආදී උවදුරෙන් දුක සේ උපයා සපයා ගත් තමා සන්තක වස්තුව අනපේක්ෂිත ව ගිලිහීයාමෙන් විඳි මානසික වේදනාවන් අපමණ ය. ඒවා නැවත ලබා ගැනීමට ගත් උත්සාහයන්හි දී මුහුණ දුන් කටුක අහිමිරි දුක්මුසු අවස්ථාවන් සිහිපත් වීමෙන් නිතර නිතර මනසට නැඟුණ වේදනාවන් ද අපමණ ය. මේ ස්වභාවය එක් ආත්මයකට පමණක් සීමා නොවී ය. අතීත අනාගත හා වර්තමාන යන තුන් කාලයට ම පොදුව බලපාන තත්ත්වයකි.

## නොබිඳී නොසැඳී පවත්නා සසර පැවැත්ම

භාග්‍යවතුන් වහන්සේ වදාළා මහණෙනි, මේ සසර නොදන්නා ලද අග ඇතියේ ය. අවිද්‍යාවෙන් ඇවුරුණු තෘෂ්ණාවෙන් බැඳුණු සහ දිවෙන, සසර සැරි සරන සත්ත්වයන්ගේ මුල නොපෙනෙයි. මව් නො වූ විරූ, පියා නො වූ විරූ, බෑණා නො වූ විරූ, ලේලි නො වූ විරූ, පුතා නො වූ විරූ, දූ නො වූ , විරූ. මහණෙනි, මේ දීර්ඝ කාලයෙහි එබඳු සතෙක් සුලබ නොවෙයි. ඒ කවර හෙයින් ද යත්? මහණෙනි, මේ සසර නොදන්නා ලද අග ඇතියේ ය. අවිද්‍යාවෙන් ඇවුරුණු තෘෂ්ණාවෙන් බැඳුණු සහ දිවෙන, සසර සැරි සරන සත්ත්වයන්ගේ මුල නොපෙනෙයි.

මහණෙනි, මෙසේ ඔබ විසින් දිගු කලක් දුක් විඳින ලදී. තියුණු දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් හෝ පොළොව වඩන ලදී. මෙයිනුදු මහණෙනි සියලු සංස්කාරයන්හි කළකිරෙන්නට නිසිම ය. නො ඇලෙන්නට නිසිම ය. මිදෙන්නට නිසිම ය.

සත්ත්වයා ගේ සසර ගමන් මඟ මුල අග පිරිසිඳ නො දත හැකි බැවින් අවිදිතාග්‍ර ඇතියේ ය. එසේම අගක් මුලක් නොපෙනෙන මේ දිගු සසර ගමනේ දී තම මව – පියා , සහෝදර, සහෝදරිය සහ ඉතා සමීප ඥාති මිත්‍රාදීන් සදහටම වෙන් ව යාමෙන් අත්විඳි මානසික වේදනාවන් ද වචනයෙන් පළ කළ නොහැකි තරම් ය. මේ මොනම දෙයකින් වත් සදහට ම මිදීමක් නම් නොවේ ම ය. තාවකාලික වශයෙන් සැප යැයි විඳි හැම දෙයකම කෙළවර ඇත්තේ ද දුකෙකි. පූර්ණ කාලීන වශයෙන් මිදීමක් ලබන්නට නම් සසර කතරින් එතෙර විය යුතු ම ය. සසර ගමනේ නිමාවක් දැකිය හැක්කේ සියලු දුක් කෙළවර කිරීමෙනි.

> තාවකාලික වශයෙන් සැප යැයි විඳි හැම දෙයකම කෙළවර ඇත්තේ ද දුකෙකි. පූර්ණ කාලීන වශයෙන් මිදීමක් ලබන්නට නම් සසර කතරින් එතෙර විය යුතු ම ය. සසර ගමනේ නිමාවක් දැකිය හැක්කේ සියලු දුක් කෙළවර කිරීමෙනි.

## දුටු සැණින් – සිත බැඳීම

අපට හදිසියේ අහම්බෙන් නමුත් කෙනෙකු දුටු පමණින් ඉතා ළඟින් ඇසුරු කැර ඇති නිතර දැක පළපුරුදු ඇති. කවදාවත් නැති තරම් ඉතා සමීප, කුළුපග, ලෙන්ගතු බවක් දැනෙන්නේ හෝ හැඟෙන්නේ සැබවින් ම මේ ජීවිතයේ හටගත් දැඩි බැඳීමක් හා ළඟ ඇසුරක් නිසා ම නොවන්නට පුළුවනි. වෙන මොනයම් හෝ අදිසි බලයක් මෙහි තිබෙන්නට ඇත. එසේත් නොවන්නේ නම් මෙයට පදනම වන්නට ඇත්තේ සසර පුරා බැඳි දැඩි සෙනෙහස විය හැකි ය. මෙබඳු අහඹු සිදුවීම්වලට ඇතැම්විට ඔබත් මුහුණ දෙන්නට ඇත. මේ සම්බන්ධව නොයෙක් ආකාරයෙන් කල්පනා කර බලන්නටත් ඇත. ඇතැම් විට අවසන් තීරණයකට එළැඹෙන්නට අපොහොසත් ව සිතේ හටගත් සිතිවිල්ල සුළඟේ පාවී යන්නටත් ඇත. කොහොම වුවත් මේ ගැන කරුණු කාරණා ගැඹුරින් සිතා බැලීම මේ අවස්ථාවේ ඉතා වැදගත් වේ. බුදුරජාණන් වහන්සේ මුහුණ දුන් එබඳු අවස්ථාවන් කීහිපයක් මෙහිදී විමසුමට ලක්කර ඇත.

## ශාසනික හා ගේහසිත ප්‍රේමය

ආදරය, ප්‍රේමය, සෙනෙහස හා හිතවත්කම ආදී සිතිවිලි පුහුදුන් මිනිස් සිතක පහළ වන හැඟීම් සමුදායකි. යම් යම් අවස්ථාවල තමා වඩාත් කැමති එක් සජීවී හෝ අජීවී වස්තුවක් වටා බැඳී පැවති මේ හැඟීම් සමුදාය තව සුළු මොහොතකින් වෙනත් එවැනි ම වස්තුවක් මුල්කැර ගෙන ඒ බැඳීම ඒ ආකාරයෙන් ම ඇතිවීම පුදුමයට කරුණක් නොවේ. මිනිස් මනසේ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය මෙය වේ.

කාමතො, රාගතො, පෙමතො, පියතො මේ හැම නමකින් ම අදහස් කරන්නේ සිතෙහි ඇතිවන සෙනෙහස යි. එය ගේහසිත ප්‍රේමය, ශාසනික ප්‍රේමය යැයි දෙවැදෑරුම් වේ. ගේහසිත ප්‍රේමය නම් ගිහිගෙය වැසි අයට හටගන්නා ප්‍රේමය යි. එයට මොනයම් හෝ කාරණයක් හේතු වේ. මව්පියන්ට නම් දරු සෙනෙහස, ස්වාමියාට නම් තම බිරිඳ කෙරෙහි ඇති සෙනෙහස, සහෝදරයාට තම සහෝදරිය කෙරෙහි ඇති සෙනෙහස, අසල්වැසියාට තම අසල්වැසියා කෙරෙහි ඇතිවන සෙනෙහස මේ ආදී වශයෙන් විවිධ විවිධ කරුණු කාරණා මුල්කරගෙන සෙනෙහස උපදී.

අනාගාමී වූ ආර්ය පුද්ගලයාට නම් ප්‍රිය විප්‍රයෝගයෙන් ශෝකයක් හා බියක් හට නොගනී. ඉන් මෙහා සිටි හැම දෙනාට සෝවාන්, සකදාගාමී, පුද්ගලයින් ඇතුළුව සෙසු පුහුදුන් සැමට ශෝකය හා බිය උපදී. අනාගාමී වන තෙක් සහමුලින් නොසංසිඳේ.

ශාසනික ප්‍රේමය නම් ශාසන විෂයයෙහි වූ භක්ති ප්‍රසාදය යි. යම් පුද්ගලයකු හෝ යම් වස්තුවක් කෙරෙහි මේ පැහැදීම තුළ හට ගන්නා ප්‍රේමය යි.

බුදුරදුන් ජීවමාන සමයෙහි ඇති වූ මෙම සංවේදී සිදුවීම ශාසනික ප්‍රේමය හොඳින් විදහා දක්වන සිදුවීමකි.

සම්බුද්ධ පරිනිර්වාණය ආසන්න බව අසා හදවතෙහි නැඟි සෝ ගිනි යටපත් කැර ගන්නට අපොහොසත් ව දොරෙහි අගුලෙහි එල්බගෙන හඬමින් වැළපෙමින් සිටි අනඳ හිමියන් අමතා බුදුරජාණන් වහන්සේ විසින් මෙම අති සංවේදී අවස්ථාවේ මෙසේ දේශනා කරන ලදී.

ආනන්දය, නොහඬව්, විලාප නොකියව්, සියලු ප්‍රිය මනාප දෙයින් වෙන්වෙන බව, සියලු සකර දම් අනිස බව මම නොකියෙම් ද? ඇති වූ සියල්ල නැති වන සුළු ය. සංස්කාරයන්ගේ අනිත්‍යතාවය වළකාලිය නොහේ ය යනුවෙනි.

පණ්ඩිත
**හක්මණ සුමනසිරි හිමි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
ඇසළ පුර අටවක 2021.07.17

## නිදහස හා සතුට

දුක් කරදරවලින් නිදහසක් නැති තැන ජීවිතයෙන් නිදහස් වන්නට ඇතැමෙක් සිතති. ධන ධාන්‍ය, යාන වාහන, මහා මන්දිර වන් ගේදෙර, ඉඩකඩම් ආදී මොන තරම් සැප සම්පත් තිබුණ ද සිතට සතුටක් නොවේ නම් තෘප්තියක් නොවේ නම් ඒ ජීවිතයේ පලය කුමක්දැයි තවත් කෙනෙක් සිතති. ඒ කළකිරීම තුළම ඇතැමෙක් වැරැදි චර්යාවන්ට ඇබ්බැහි වෙති. තවත් කෙනෙක් එහි වරද අනුන්ට පවරමින් සමාජයෙන් පළිගන්නට සිතති. මේ කවර හැසිරීමක දීවුවද නැවත වරක් අහමි වන්නේ අනුන්ගේ නොව තමන්ගේ ම නිදහස ය. සතුට ය.

ගැටලුවක දී, දුකක දී වේදනාවක දී සිතට නැගෙන ආවේග හමුවේ කෙලෙස්බර සිතින් කවර පිළිතුරක් සෙවූව ද පිළිතුර නැවතත් ඇති කරන්නේ ප්‍රශ්නයක්ම ය. බොහෝ දෙනෙක් අමාරුවේ වැටෙන්නේ එය නොදන්නාකම නිසා ය.

පුද්ගලික වශයෙන් මෙන් ම සමාජමය වශයෙන් ද මෙතරම් අර්බුද එහෙයිනි. බෞද්ධයින් ලෙස අප මේ පිළිබඳ ඇතැම් විට ලජ්ජා සහගත විය යුතු යැයි සිතේ. ඒ ශ්‍රී සද්ධර්මය තුළ අපූර්ව චින්තන නිදහසක් අපට හඳුන්වා දී ඇති බැවිනි. ඒ ධර්ම මාර්ගයේ ගමන් කරන්නට අප තවමත් ප්‍රමාද වන බැවිනි.

අප දුකට පත්වන්නේ තම සිත ගැන නොදන්නා නිසාය. ධම්ම පදයේ කෝධ වග්ගයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ යම් පුද්ගලයෙක් ක්‍රෝධය දුරු කරයි ද, මානය පහ කරයි ද, සියලු බැඳුම් ඉක්මවයි ද, නාම රූප දෙකෙහි නොඇලෙන, රාගාදී කෙලෙස් නැති ඒ පුද්ගලයා කෙරෙහි කායික චෛතසික දුක් පවතින්නේ නැති බවයි.

මෙහි අවධාරණය කරන ක්‍රෝධය නම් වූ භයානක සිතිවිල්ල පිළිබඳ පමණක් අවධානය යොමු කළේ නම් ඒ නිසාම සිතෙහි නිදහස පහව යන අයුරු, සතුට ගිලිහී යන අයුරු තමන්ටම අවබෝධ කරගත හැකි ය.

ක්‍රෝධ සහගත සිතින් ගන්නා කිසිදු තීරණයකින්, ක්‍රෝධ සහගත අවස්ථාවක කරනා කිසිදු ක්‍රියාවකින් යහපතක් බලාපොරොත්තු විය නොහැක. ඒ එම අවස්ථාවේ අප අන්ධභාවයට පත්ව ඇති නිසා ය. මෙහි අන්ධබව නම් මසැස නොපෙනීම නොවේ. ප්‍රඥා නැමැති ඇස නොතිබීම ය.

ඇතැම් අඹු සැමියන් අතර, මව්පිය දූ දරුවන් අතර, තරුණ පිරිස් හා වැඩිහිටියන් අතර ආදී වශයෙන් කුඩාම සමාජ ඒකකයෙන් ආරම්භව මහා සමාජය දක්වා පැතිර යන අනවරත මතභේද, ගැටුම්, අරගල ක්‍රෝධයේ ප්‍රතිපලය. එවැනි වාතාවරණයක මනසෙහි ව්‍යාකූල බව මිස කවර නම් නිදහසක් සතුටක් බලාපොරොත්තු වන්නද?

එහෙයින් නිරන්තරයෙන් අපගේ සිතිවිලි මෘදු බවට පත්කරගත යුතු ය. රළු සිතිවිලි ඇතිවිට කෝපය වඩා වර්ධනය වේ. එවිට ආධ්‍යාත්මිකව පරිහානියට යනවා පමණක් නොව බාහිරව ද විවිධ උපද්‍රවලට ගොදුරු වේ.

දූස් මානයේ අනතුරු පෙනෙන්නට තිබියදීත් ඉන් වළකින්නට සිහිකල්පනාවක් නොවන්නේ, ගල්මුල්වල හැපෙන්නේ මෙවැනි පුද්ගලයන් ය. ක්‍රෝධය ඇති කල අප ජීවත් වන්නේ මායාව තුළය. ජීවිතය මං මුලා කරන්නේ ඒ මා යාවම ය. එවිට නැතිවන්නේ සිතේ නිදහසේ සතුට ය.

නුවණැස දල්වා ඒ ආලෝකයෙන් ජීවිතය දැකිය යුතු එහෙයිනි.

# සාංඝික දානයක දී ඔබගේ සිත වරදවා මෙහෙයවනවා ද?

**අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දක්ඛිණ විභංග සූත්‍ර දේශනාවේ දී වදාරන්නේ ආනන්දය, අනාගත කාලයෙහි නාම මාත්‍ර ශ්‍රමණ වූ, දුශ්ශීල වූ පාපකර්ම ඇති, කාසවකණ්ඨක කෙනෙක් මේ සාසනයේ වෙති. (කහ රෙදි පටියක් බෙල්ලේ හෝ අතේ බැඳ තමා භික්ෂුක් බව සමාජයට හඟවන තැනැත්තන්)**

(ක්‍රි.ව. 1505 සිට 1948 දක්වා අවුරුදු 443 ක් අපේ රට යටත් කරගෙන සිටි පෘතුගීසි ලන්දේසී හා ඉංග්‍රීසි යන විදේශිකයන් අතර විශේෂයෙන් ඉංග්‍රීසීහු විසින් බුද්ධාගම ඇදහීමට පවා තහංචි පැන වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස මහනුවර යුගය වනවිට උපසම්පදා භික්ෂූන් වහන්සේලා හතර නමක් මුළු රටෙන් ම සොයා ගැනීමට නො හැකි විය. මෙකල කාසාවකණ්ඨකයින් අපේ රටේ ද සිටි බවට මෑත කාලීන සාසන වංශ කතාවන්හි සටහන් ව ඇත)

ඒ දුශ්ශීලයන් කෙරෙහි වුවත් සංඝයා උදෙසා යැයි දන් දෙන්නෝ අනාගතයේ වෙති. ආනන්ද මම එකල්හිත් (එම) සංඝගත දක්ෂිණාව ගණනකින් කිව නො හැකි (අසංඛෙය්‍ය) ප්‍රමාණයක් නැති (අප්‍රමේය) ආනිසංස ඇති සාංඝික දානයක් බව කියමි.

ආනන්ද, මම කවර අයුරකින් වුව ද සංඝගත දක්ෂිණාවට වඩා පෞද්ගලික දානය උතුම් යයි (මහත්ඵලය යි) නො කියමි.

මේ අනුව එදා මහා ප්‍රජාපතී ගෝතමීය භාග්‍යවතුන් වහන්සේට දෙන්නට උත්සාහ කළේ පෞද්ගලික දානයකි. තුන් ලොවට අග්‍ර සෘද්ධි බල ඇති බුදුරදුන් බව දැන – ඥාතීත්වය තීරණය කොට – පුළුන් රොදේ පටන් නූල් ගොතා නිමා කළ වස්ත්‍රය දක්වා අසවලා වෙනුවන් – අසවලා උදෙසා – අසවලාට පූජා කරමි යි තීන්දු කරගෙන අවසානයේ ඔබ වහන්සේ වෙනුවෙන් ම යනුවෙන් වචනයෙන් පවා කියමින් දැරූ සියලු උත්සාහයන් මෙහිදී පෞද්ගලික බව පසුව කළ සාංඝික දාන විස්තරයෙන් පැහැදිලි වේ.

එහිදී මනුෂ්‍යය වර්ගයාට ම අනුකම්පා ඇති – රටක් ජාතියක් ආගමක් විශේෂ කොට නො සලකමින් සමස්ත ලෝකයට හා විශ්වයට ම මහා කරුණා ඇති අප තථාගතයන් වහන්සේ ගෞතමියට තෙවරක් ම එසේ අනුශාසනා කළේ එතෙක් ශ්‍රමය වැය කොට සකස් කළ දාන වස්තුවට සංඛ්‍යා (ගණනින් දැක්විය නො හැකි) ප්‍රමාණයෙන් හා මෙපමණ යයි උපමාවකදු නොදැක් විය හැකි අපමණ පින් කන්දරාවක් අත්කරදීමට නො වේ ද?

එහෙයින් පින්වත්නි, ත්‍රිපිටකයේ බුද්ධවචන මෙතරම් පැහැදිලිව, මනාව දේශනා කර තිබිය දී අපිදු ගෙදරට වඩම්වා හෝ පන්සලේ දී හෝ දෙන සාංඝික දානයකට දායකත්වයක් ලබාදීමේ දී කෙතරම් තමාගේ සිත වරදවා මෙහෙයවනවා ද යන්න සිතීමට මෙය හොඳ තැනකි.

පන්සලේ ලොකු හාමුදුරුවෝ නො වැඩියොත්, අප හොඳින් දන්නා හාමුදුරුවෝ පැමිණියේ නැතිනම්, අප පෞද්ගලික දන්නා, නොමනා හැසිරීම් ඇති ස්වාමීන් වහන්සේ නමක් දානයට සිටියොත්, සාමණේර පුංචි හාමුදුරුවන් සමූහයක් දානයට වැඩයොත් මේ බත මේ ව්‍යංජනය, මේ පිරිකර අසුවල් ස්වාමීන් වහන්සේ වෙනුවෙන් ම කියා වෙන් කොට සිතා තම සිත සකස් කර ගත හොත් මහා මේරු පර්වතය තරම් උසට රැස්කර ගත හැකි සාංඝික දාන පින් කන්දරාව පෞද්ගලික දානයක් කරගෙන ස්වල්පයක් තරම් කර ගන්නවා නො වේ ද?

ඇනුදු දානයකට වැඩ සිටින උතුම් මහා සඟරුවන දානයක් සාංඝික කිරීමේ දී ඉමං භික්ඛං සපරික්ඛාරං භික්ඛු සංඝස්ස දේම යනුවෙන් තුන් වරක් කියා අනතුරුව පින් දීමේ දී මේ දානයේ අග්‍ර කොටස ශාන්ති නායක ලොවුතුරා තථාගත බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් පළමුවෙන් පූජා කොට, සාරිපුත්ත – මොග්ගල්ලාන පරපුරෙන් පැවැත එන ඒ අතීතයෙහි වැඩ හිටි උතුමන් ද වර්තමානයෙහි මෙහි වැඩ සිටින මහා සංඝයා වහන්සේ හා අනාගතයෙහි මේ නිවන් ප්‍රතිපදාවෙහි හැසිරෙන යම් භික්ෂුවක් වෙත් ද ඒ සියල්ල වෙනුවෙන් පූජා කරන සංඝ ගත දක්ෂිණාවක් සේ සලකා පින් රැස් කර ගන්න යැයි අපට අනුශාසනා කරන්නේ ම ය.

ඒවෙලෙහි අපට ඇති සියලු වැඩ පසෙක ලා ඒ කළ අනුශාසනාව මැනවින් අසා වටහා ගත්තේ නම්, එහි අන්තර්ගතය වන්නේ අප දෙන දානය පෞද්ගලික දානයක් කර නොගෙන මහත්ඵල මහානිසංස ලැබෙන සංඝගත දක්ෂිණාවක් කර ගන්නා ලෙස නො වේ ද?

දක්ඛිණ විභංග සූත්‍ර අටුවාවේ මේ කාසාවකණ්ඨ සංඝයාට වුව ද බුද්ධ ශ්‍රාවකයකු සේ සලකා දන් දීම හා සාමණේර නමකට දන්දීම ගැන පැහැදිලි කරන තැනක් වේ.

කාසාවක කණ්ඨයන්ට වුව ද සැරියුත් පරපුරෙන් එන භික්ෂු සංඝයා උදෙසා දෙන දක්ෂිණාවක් ලෙසින් සලකා දානය දුනහොත් ගුණ සංඛ්‍යාවෙන් අසංඛ්‍යෙය වන බව එහි දක්වා ඇත.

භික්ෂු සංඝගත දක්ෂිණාවක් වූ එය අතීත, වර්තමාන, අනාගත, අරහත් සංඝයා කෙරෙහි ගෞරව පිණිස ම දෙන්නක් මිස එවන් පුද්ගලයකු උදෙසා දෙන්නක් නොවන හෙයිනි.

කාසාවකණ්ඨක කෙනෙක් හට දෙන දානය කවරෙක් පිරිසුදු කෙරේ ද? සැරියුත් මුගලන් ආදී අසූ මහා ශ්‍රාවක තෙරහු කෙරෙහි ම පිරිසුදු කෙරෙති. මේ වන විට ඒ අරහත් උත්තමයෝ පිරිනිවී බොහෝ කල් යයි සිතට එති. එසේ වූ විට පිරිසුදු වන්නේ කෙසේද? ඒ සැරියුත් – මුගලන් දෙනම වහන්සේගෙන් ආරම්භව අද දක්වා වැඩ ඉන්න රහත්හු ම මේ දානය පිරිසුදු කෙරෙති. (මජ්ඣිම නිකාය පාළි අටුවා දක්ඛිණා විභංග සූත්‍රය පිටුව – 202 – 203)

එනම් අප දෙන සාංඝික දානයක දී මේ වැඩ ඉන්නේ ද රහත්හු ම යි සිත සකස් කර ගත යුතු බව මෙයින් කියැවේ. එසේ සකස් කොට පිහිටුවා ගත් සිතින් අපගේ දානය දුන්නේ නම් බුද්ධ ප්‍රමුඛ සැරියුත් මුගලන් මහ පරපුරට දුන් දානයක් ම වන්නේ ය.

සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම්
(බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව)
**කේ. කේ. සුගතපාල**



# අන්‍යෝන්‍ය සුහදත්වය අගයන සමාජයකට...

**සියලු සත්ත්ව වර්ගයා ජීවත්වනුයේ එකම සමාජයක ඒකාකාරී රාමුවක් තුළ ය. එක් මිනිස් වර්ගයක නිදහස පිළිබඳ යම් යම් සීමාවන් පැනවීම හෝ නිදහස සහමුලින්ම අහෝසිකර දැමීම මානුෂික වශයෙන් මෙන්ම සදාචාරාත්මක වශයෙන් කිසිදු හේතු යුක්ති සහගත ක්‍රියාවක් නොවේ.**

ලොව ජීවත්වන සියලු සත්ත්ව වර්ගයාට උත්තරීතර මානව නිදහසක් උදාකරදීම සඳහා වූ සර්වකාලීන හා සර්ව භෞමික ඉගැන්වීමක් පළමුවෙන් ම ලෝකයාට ඉදිරිපත් කළේ බුදුරජාණන් වහන්සේ ය.

ප්‍රාග් බෞද්ධ හා බුද්ධකාලීන භාරතීය සමාජ පසුබිම පිළිබඳ විමසා බැලීමේ දී එකල මිනිසුනට යටත් පිරිසෙයින් ජීවිතය පවත්වාගෙන යාමටවත් කිසිදු නිදහසක් උරුමව නොපැවතුණි.

බමුණන් විසින් වර්ග කරන ලද චතුර්වර්ණය පදනම් කරගෙන එකල සමාජය සකස්ව තිබුණි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය වෛශ්‍ය හා ශූද්‍ර යනු එම චතුර්වර්ණයයි. මෙම වර්ගීකරණයට අනුව බමුණන් පූජකයන් හා ගුරුවරුන් ලෙස ද රජුගේ උපදේශකවරුන් ලෙස ද පෙනී සිටි අතර මිනිස් සමාජය උසස් පහත් වශයෙන් මහා බ්‍රහ්මයා විසින් මවන ලදැයි, යන්න ඔවුන ගේ නිසැක පිළිගැනීම විය. ක්ෂත්‍රියවංශිකයනට රාජ්‍ය පාලන තන්ත්‍රය මෙහෙයවීමත්, කෘෂි කර්මාන්තය කරවීමත්, යාග කරවීමත් නියමිතව පැවතිණ.

වෛශ්‍යයනට වාණිජමය කටයුතු පැවරී තිබුණ අතර ශූද්‍ර වංශිකයාට උරුම වූයේ පූර්වෝක්ත වර්ණත්‍රයට බැල මෙහෙවර කිරීමයි. මෙකී වර්ණත්‍රයට උරුම වූ මිනිස් අයිතිවාසිකම් කිසිවක් ඔවුනට උරුම නොවී ය.

එමතු නොව තත් යුගය වනවිට භාරතීය සමාජයේ කාන්තාවනට හිමි වූයේ ද ඉතා පහත් තත්ත්වයකි. ශූද්‍රයිනට සේ ම සාමාන්‍ය මිනිස් අයිතිවාසිකම් වූ ඉගෙනීම හා ආගමික කටයුතුවල යෙදීම ආදී කටයුතු පවා ඔවුනට අහිමි විය. රටේ පවත්නා පොදු නීති පවා කාන්තාව සම්බන්ධයෙන් වෙනස් වූ අතර එද සමාජයේ කාන්තාවක මැරීම පිරිමියෙකු මැරීම තරම් බරපතල ක්‍රියාවක් නොවේ ය, යන අදහස ද මුල්බැසගෙන පැවතිණි.

එබැවින් එකල ස්ත්‍රියක වී ඉපදීම ද බරපතළ පාපයක් සේ සැලකීය. මෙසේ සකස්ව පැවැති විෂම සමාජ රටාවෙහි පවත්නා නිස්සාරත්වය මනාව මහජනයාට තේරුම් කරදුන් බුදුරජාණන් වහන්සේ මංමුලා වූ ජන සමාජයකට නිසිමඟ පෙන්වා දුන්හ.

බුදුරදුන් දේශනා කළ ශ්‍රී සද්ධර්මය ශ්‍රී ලංකාවාසීන්ට හඳුනා ගැන්මට ලැබුණේ ක්‍රි.පූ. 3 වන සියවසේ දී නොහොත් බුද්ධ වර්ෂ 236 දී සිදුවූ මහින්දගමනයෙන් පසුවයි. එවකට ලාංකේය පරිසරයේ සැකැස්ම ද ප්‍රාග් බෞද්ධ හා බුද්ධකාලීන භාරතීය බ්‍රාහ්මණ ඒකාධිකාරය තරම්ම දරුණු මට්ටටමක නොපැවතිය ද එහි යම් යම් කොටස් ශේෂව පැවති ස්වභාවයක් පෙන්නුම් කළැයි, පිළිගත හැකි ය.

මෙලොව පරලොව උභයාර්ථ සංසිද්ධිය කෙසේ සලස්වා ගත යුතු දැයි, යන්න පිළිබඳ අල්පමාත්‍ර දැනුමක් හෝ නොතිබුණු ජන සමාජයකට මානව නිදහස පිළිබඳ පැවතියේ ද කිසිවෙකුටත් හිතකර නොවූ සංකල්පයන් ය. එම සංකල්පනාවන්ට නව අරුතක් එක් කිරීම තුළින් රටට උදාවූයේ පෙර කිසිදක නොවූ විරු ආලෝකයෙකි.

මිහින්තලා පර්වතය අසල දී මිහිඳු මහරහතන් වහන්සේ විසින් දෙවනපෑතිස් රජුට දේශනා කළ එක් දහම් පණිවුඩයක් මෙසේ ය.

"මහරජ, ඔබට මෙන්ම ගුවනේ සැරිසරන පක්ෂීන්ට ද වන සතුන්ට ද මේ රටේ ඕනෑම තැනෙක නිදහසේ ජීවත්වීමේ හා ඔබමොබ යාමේ සම අයිතියක් ඇත. පොළොව රට වැසියාට සහ අනෙකුත් සතුන්ට ද අයිති වන අතර ඔබ එහි භාරකරු පමණෙකි.

මෙලෙස සත්වයාගේ නිදහස පිළිබඳව ඉහළම වැටහීමක් ලබාගත් මෙරට ජනයාගේ බුද්ධිය, ක්‍රියාකාරීත්වය හා යහපත් වූ අන්තර්පුද්ගල සබැඳියාව ඉතා ඉහළම මට්ටමකින් පෝෂණය වූවාක් සේ ම නිදහස් චින්තනයේ අඩිතාලම සියවස් ගණනාවක් පුරාවටම නොසිඳී නොකැඩී රඳා ගැන්මෙහි ද හැකියාව ලැබිණ.

මෙරට ජනතාවගේ චිත්ත සන්තානය තුළ තදින්ම පැලපදියම් වූ මෙකී හැදියාව නොපිටට පෙරළී ගියේ යුරෝපීය ධන කුවේරයින් මෙරට ආක්‍රමණයෙන් පසු ඇති කළ සමාජ පරිවර්තනයත් සමඟ ය. විවිධ ආක්‍රමණිකයන් ගේ බලපෑම්වලට ලක් වූ අප ඉතිහාසයේ එක් යුගයක පරාධීන ජාතියක් ව සිටීමට සිදුවීම ජාතියක් ලෙස අත්විඳි අවාසනාවන්ත සිදුවීමක් ලෙස පෙන්වාදිය හැකි ය. ඒ තුළ දේශීය සංස්කෘතිය වෙනුවට බටහිර අනුකරණශීලී සමාජ රටාව ලක්දිව පුරා ව්‍යාප්ත වන්නට විය. තවමත් එහි යම් යම් ශේෂයන් පවතිනු දක්නට ලැබීම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි.

සියවස් කිහිපයක් පරාධීනව සිටින රටක් තව දුරටත් පරාධීනත්වයටම ඇද වැටෙන්නේ නම් ඔවුනට ස්වාධීනත්වය පිළිබඳ ඇතැම්විට කිසිදු හැඟීමක් ඇතිවිය නොහැකි ය. ඔවුනට ස්වාධීනත්වයෙහි ස්වරූපය පිළිබඳ අත්දැකීම් බිඳකුදු නොමැති හෙයිනි. නමුත් වර්ෂ 1505 දී මෙරටට ප්‍රථම පෘතුගීසි ආක්‍රමණිකයා වන ලොරෙන්සො ද අල්මේදාගේ පැමිණීමට පෙර වසර දහස් ගණනක් තිස්සේ ස්වාධීනත්වයේ හා සාමකාමී ජීවන රටාවක අත්දැකීම් මෙරට ජනතාව අත්විඳ ඇත්තාහ.

එබැවින් පැවැති නිදහසට එරෙහි විකල්ප බලවේග පැමිණීම හමුවේ අප රටවාසීහු එකී බලවේගයන්ට එරෙහිව නැඟී සිටියහ. නැඟී එන දේශානුරාගයෙන් හා නිදහස ලබා ගැනීමේ පරම පවිත්‍ර අපේක්ෂාවෙන් යුත් මනසින් හෙබි අප ශ්‍රේෂ්ඨ මුතුන් මිත්තෝ දැයේ නිදහස හා ස්වාධීනත්වය අහිමි කළ අධිරාජ්‍ය වාදයට එරෙහිව ඍජුවම ක්‍රියා කළහ.

එම ශ්‍රේෂ්ඨ ලංකාපුත්‍ර නාමාවලියෙහි අප දන්නා වාරියපොළ ශ්‍රී සුමංගල අනු නාහිමි, කුඩාපොල හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමි යනාදී අග්‍රගණ්‍ය යතිවරයන් වහන්සේලා ද කැප්පෙටිපොල නිලමේ, ගොංගාලේගොඩ බණ්ඩා, වීරපුරන්අප්පු යනාදී විරුවෝ ද මුල් තැනක් හිමිකර ගනිති. එමෙන්ම මෙම නාමාවලියට ඇතුළත් නොවුණ ද ඉතිහාසය තුළ සැඟව ගිය දහස් ගණනක් හෙළවිරුවෝ වූහ.

එමෙන්ම මහත් සේ පරිශ්‍රමයක් දරා දිනාගත් නිදහස විවිධ මතිමතාන්තර තුළින් දිනා ගැනීමට ද ඇතැම් බුද්ධිමත් නායකයෝ ප්‍රයත්න දැරූහ. එම පරම්පරාවට මහාමාත්‍ය ඩී.එස්. සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, එෆ්,ආර්. සේනානායක, ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන්, ටී.බී. ජයා යනාදී නායකයෝ පෙරමුණ ගත්හ. තවද දේශීයත්වය හැරපියා බටහිර අනුකරණශීලී ගැත්තන් වෙමින් ක්‍රියා කළ සිංහල කලු සුද්දන් වෙතින් දිනෙන් දින පලා යමින් පැවැති දේශීයත්වය නැවත ඇති කිරීම සඳහා මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි, අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිශ්චන්ද්‍රතුමා, පියදාස සිරිසේන යනාදී බුද්ධිමත්හු පියවර ගත්හ. මෙම පුනරුදයේ අවසානය වූයේ අපට අහිමි කළ නිදහස වර්ෂ 1948 දී අප වෙත ලබා ගැනීමට හැකිවීමයි.

1948 ට පෙර රටට නිදහස දිනා ගැනීම සඳහා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදී වශයෙන් බෙදීමක් නොකර ශ්‍රී ලාංකිකයන් ලෙස එක්ව කටයුතු කළ අප නිදහසින් පසු බරපතළ ලෙස වෙන් වී ගියේ හුදෙක් ජාති, කුල, ආගම්, පක්ෂ, පළාත් වශයෙන් සලකා භේදභින්නව ක්‍රියා කිරීම නිසයි.

එවැනි අදහස් තුළින් කිසියම් සමාජයක මූලික මිනිස් අයිතිවාසිකම් පැහැර හැරීමට හෝ යටපත් කිරීමට යමෙකු ක්‍රියා කළහොත් එය බෞද්ධ සහජීවනයට බරපතල හානියකි.

සැම දෙනෙකුම එකම මිනිස් වර්ගයකට අයත් ඒකාකාරී පැවැත්මක් ඇතිව ජීවත්වන සාමයෙන් හා සහජීවනයෙන් ජීවත්වීමට නම් සියලු ආගම් ඇදහිය යුතු යැයි, යමෙකු අදහස් කළහොත් එය සහමුලින්ම වැරදි සහගත බව ද තේරුම් ගත යුතු ය.

සියලුම ආගම් ඇදහීම උමතු ස්වභාවයක් මිස ආගමික සහජීවනය නොවේ. වෙසක් පොහොයට අන්‍ය ආගමිකයෝ වෙසක් පහන් කූඩු තනති. තොරණ ඉදි කිරීමට සහය වෙති. ආධාර උපකාර කරති. දන්සැල් දෙති. බෞද්ධයෝ ද අන්‍ය ආගමිකයන්ගේ හා අන්‍ය ජාතීන් ගේ උත්සවවලට උදව් උපකාර කරති. තම නිවෙස් හෝ ආයතන ඒ වෙනුවෙන් සරසති. එසේම පන්සලේ ධර්ම ශාලාව හෝ ප්‍රජා ශාලාව ඔවුන්ගේ සමාජ සේවා රැස්වීම් ආදිය සඳහා ලබා දෙති. සහජීවනයේ සැබෑ ලක්ෂණය වන්නේ අන්‍යයන්ගේ ආගම හෝ සිරිත විරිත තමනුත් අනුගමනය කිරීම නොව ඔවුන්ගේ ආගම ඇදහීමට හා ඔවුන්ගේ සිරිත් විරිත් ඔවුන්ට පවත්වාගෙන යාමට බාධා නොකිරීමයි.

සිංහල බෞද්ධයා පෙර සිටම මෙම පිළිවෙත අනුගමනය කළේ ය. අන්‍යෝන්‍ය සුහදත්වයෙන් යුතුව අනුගමනය කරන මෙම උතුම් පිළිවෙත ආගමික සහජීවනය යි. සිංහලකමත්, බෞද්ධකමත් යනු එයයි.

**ඌරුගමුවේ අස්සජී හිමි**

# සංහිඳියාවේ තෝතැන්න කතරගම ඇසළ පෙරහර

## මෙවර කතරගම ඇසළ පෙරහර මංගල්‍යයේ ශ්‍රද්ධාවන්ත මුද්‍රිත මාධ්‍ය දායකත්වය ලේක්හවුස් ආයතනයෙනි

**කතරගම යනු සිංහල, දෙමළ හා මුස්ලිම් සියලු දෙනාගේම වන්දනාමානයට ලක්වෙන පුණ්‍ය භූමියකි. කතරගම පුද බිම හා බැඳුණු ඉපැරැණි චාරිත්‍ර විධි මෙන්ම බුදුරජාණන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පවිත්‍ර වූ කිරිවෙහෙර චෛත්‍ය රාජයාණන් වහන්සේ ද පිහිටීම නිසා මේ පින් බිමට බෞද්ධ ජනතාව විශාල ලෙසින් පැමිණීමට හේතු වී තිබේ. මුස්ලිම් ජනතාව ද සිය ආගමික ස්ථාන කරා පැමිණෙන්නේ ඉමහත් බැතියෙනි.**

'කතරගම ගැන කතාකරන විට එහි දේවාලය හා කතරගම පෙරහර ගැන අනිවාර්යයෙන් සඳහන් කළ යුතුම ය.

කතරගම පෙරහර ඉතිහාසයට අනුව එහි පෙරහර 3ක් අද දක්වාම පවත්වන බව පෙනෙන්නට තිබේ. 'රුහුණු මහ කතරගම දේවාලය' නමින් හැඳින්වෙන කතරගම දේවාලය කේන්ද්‍ර කර ගනිමින් අවුරුදු මංගල්‍යය පෙරහර, ඇසළ මංගල්‍යය පෙරහර හා ඉල්මහා කාර්තික මංගල්‍ය පෙරහර යනුවෙන් පෙරහර 3ක් පවත්වයි. එයින් කතරගම ඇසළ පෙරහරට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. කතරගම ඇසළ පෙරහර මංගල්‍යය දින 15ක් තිස්සේම පැවැත්වෙන්නේ දෙවියන්ට ඉමහත් භක්තියකින් යුතුව කරන සැලකීමක් ලෙසිනි.

කතරගම පෙරහරේ ප්‍රධාන අරමුණු 4කි. ඒ අපල උපද්‍රව දුරු කිරීම, දේවාශිර්වාදය ලැබීම හා රටට සෙත් පැතීම, වර්ෂාව හා සශ්‍රීකත්වය ලබා ගැනීම හා ස්වභාවික විපත්වලින් රට බේරා ගැනීම ය.

පෙරහර ආරම්භය කප් සිටුවීමෙන් සිදු කෙරේ. ඇසළ මාසයේ පෙරහර කාල සීමාව පුරාම කතරගම දෙවියන් කපෙහි වාසය කරන බවට විශ්වාසයක් ජනතාව තුළ පවතී. ඒ නිසා සිටුවන ලද කප පූජා වස්තුවක් ලෙස සැලකේ. කතරගම පෙරහරට සම්බන්ධ චාරිත්‍ර අතර ගිනි පෑගීම, බිම පෙරළෙමින් චාරිත්‍ර හා භාර හාර ඉටු කිරීම, කටු ගැසීම ආදී දුෂ්කර කාර්යයන්හි නියැළෙමින් දෙවියන් ඉදිරියේ ඇඩි භක්තිය ප්‍රකාශ කිරීමට බැතිමත්හු කටයුතු කරති.

කතරගම ඇසළ පෙරහරේ පළමු පෙරහර හඳුන්වන්නේ මඟුල් පෙරහර නමිනි. එම පෙරහර පසුගිය 10 වැනිදා වීදි සංචාරය කළේ ජනතා සහභාගිත්වයෙන් තොරව ය. ඒ පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වයන් යටතේ සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව ය. මඟුල් පෙරහර පැවැත්වෙන දිනයේදී කැවුම්, කොකිස්, කිරිබත් සකස් කිරීම රජ කාලයේ සිට පැවත එන්නකි. කැවිලි සකස් කරන්නේ දේවාලයේ තේවාකරු වන ගම්පහ විදානේය. පෙරහර පටන් ගැනීමේ චාරිත්‍රය වන්නේ වත බැඳීමයි. 'වත බැඳිම' නම් දේවාභරණ රැගෙන යන ඇතා පිට වස්ත්‍ර ඇතිරීමයි.

දෙවන දිනයේ පැවැත්වෙන්නේ අපූරු පෙරහරකි. එය වර්තමානයේ හඳුන්වන්නේ දෙවොල් පෙරහර නමිනි. එම පෙරහර ද පසුගිය 11 වැනිදා පවත්වන ලදී. එම පෙරහර දුවන පෙරහර නැත්නම් වේගවත් පෙරහර යනුවෙන්ද හඳුන්වන අතර 'හොර පෙරහර' නමින් හැඳින්වීම ද විශේෂී ය. හොර පෙරහර නමින් හඳුන්වන්නේ තේවානි අම්මාට හොරෙන් කතරගම දෙවියන් වල්ලි අම්මා දේවාලය වෙත වැඩමවීම සනිටුහන් කිරීමයි.



කතරගම කිරිවෙහෙර වහන්සේ

කතරගම දේවාලය

දේවාලයේ කටයුතු බාරව සිටින කපු මහත්වරු

මහ පෙරහරේ දෙවියන් වැඩම කිරීම සිදු කරන්නේ මහ දේවාලයෙන් ලබා ගත් පිරිත් පැන් දේවාලය පුරා ඉසීමෙන් අනතුරුව ය. එහිදී ෂණ්ඩා නාදයෙන්ද දෙමළ ජනතාවගේ 'හරෝ – හරා' නාදයෙන් ද පෙරහර අලංකාර වේ. පන්දම් එළියෙන් පෙරහර ආලෝකමත් කෙරේ. එසේම මල් ඉසින්නන්, මාර්ගය පිරිසිදු කිරීමට කහදිය ඉසින්නන් මෙන්ම ස්තෝත්‍ර හා ද්‍රවිඩ ගීතිකා ද ඇතුළත් පෙරහරේදිස්වන්නේ රජ කාලයේ පෙරහරක ස්වරූපයකි.

පෙරහරේ ඉදිරියෙන්ම යන්නේ ඉරහඳ නිරූපණය කරන සේසත් දරන්නන්ය. දිසා කොඩි දරන්නෝ ද එහි සිටිති.

උඩරට, පහතරට, සබරගමු ආදි සියලු සාම්ප්‍රදායික නැටුම් මෙන්ම මොණර නැටුම්, කාවාඩි නැටුමින් ද පෙරහර අලංකාර කරනු ලැබේ. එමෙන්ම ඇසළ පෙරහර අලි ඇතුන්ගෙන් ද අලංකාර වන්නකි.

කතරගම ඇසළ පෙරහර පැවැත්වීමේ සාම්ප්‍රදායික අරමුණ වන්නේ වල්ලි අම්මා හා කතරගම දෙවියන් විවාහ වීමේ ප්‍රීතිය සැමරීමයි. කතරගම පුදබිම තුළ දුටුගැමුණු රජ සමයේ පටන් ආරම්භ වූ පුද පූජා සහ පුද සිරිත්වලට මුල් තැනක් හිමිවීම විශේෂත්වයකි.

වසර 44ක එළාර රජුගේ පාලනය පරදවා රට එක්සේසත් කළ දුටුගැමුණු රජතුමා යුද්ධයට යාමට පෙර කතරගම දෙවිඳුන්ට වූ බාරයක් ඔප්පු කිරීම සඳහා කතරගම දේවාලය ඉදිකර පූජාකර තිබේ. එමෙන්ම දෙවියන්ට උත්සව පවත්වා දේවාලයේ



කතරගම අභිනවාරාමාධිපති රුහුණු මාගම්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක කපුගම සරණතිස්ස නා හිමි



රුහුණු මාගම් පත්තුවේ ප්‍රධාන සංඝනායක කිරිවෙහෙර රජමහා විහාරාධිපති කොබවක ධම්මින්ද නා හිමි

කටයුතු වෙනුවෙන් සන්නස් සකස් කොට ඒ අනුව කටයුතු කරන ලෙස රජතුමා නියෝග කර තිබුණි.

මෙවර පෙරහර පැවැත්වීම සම්බන්ධයෙන් අදහස් දක්වමින් කතරගම අභිනවාරාමාධිපති රුහුණු මාගම්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක කපුගම සරණතිස්ස නා හිමියන් පැවසුවේ කතරගම දෙවියන් හා වල්ලිඅම්මාගේ මංගල්‍යය සිහිකරමින් රජකාලයේ සිට පැවැති පෙරහර මංගල්‍යය මෙවර ද සියලු චාරිත්‍ර වාරිත්‍රවලට අනුව සිදුකරනු ලබන බවයි.

"දෙමළ ජනතාව කතරගම දෙවියන් හඳුන්වන්නේ 'මුරුගන්' නමින්. කතරගම දෙවියන්ට දක්වන ගෞරවයක් හා භක්තියක් ලෙස තමයි දෙමළ ජනතාව උතුරේ සිට සති දෙකක් තුනක් පමණ වන සතුන් ගහන මාර්ගය ඔස්සේ පා ගමනින් පාද යාත්‍රාවේ පැමිණ කතරගම දෙවියන්ට පුද සිරිත් කරන්නේ. 35.000කට අධික ජනතාවක් එලෙසින් පැමිණෙනවා. පාවහන් පවා නොමැතිව විශාල දුෂ්කරවෘත ගෙවමින් ඔවුන් සිදු කරන්නා වූ මේ මහත් වූ ගෞරව පූජාව මෙරට වෙනත් කිසිදු ආගමික ස්ථානයක් වෙනුවෙන් සිදු කරන්නේ නැහැ.

දින 15ක් පමණ පවත්වන කතරගම පෙරහරට පූර්වයෙන් දේවාල මළුව හා මාර්ගවල සුදුවැලි ඇතිරීම විශේෂයෙන්ම සිදු කරන්නක්. එය දෙවියන්ට සිදු කරන්නා වූ ගෞරවයක් වගේම ජනතාව දෙවියන් වෙනුවෙන් මළුවේ පෙරළෙමින් සිදු කරන්නා වූ භාරහාර වෙනුවෙන් ඔවුන්ට කිසිදු අපහසුතාවකින් තොරව එම කාර්යයන් සිදු කිරීම වෙනුවෙන් මේ සුදුවැලි ඇතිරීම සිදු කරනවා.

මහා සංඝරත්නයේ ආශිර්වාදය මැද පවත්වනු ලබන මේ පෙරහරේ තවත් විශේෂ අංගයක් වන්නේ බස්නායක නිලමේවරයාගේ වලව්වේ තිබෙන ගොම මැටි ඇතිරූ විශේෂ කාමරයක සිට භික්ෂූන් වහන්සේ පිරිත් සජ්ඣායනා කිරීමයි.

හයවැනි පෙරහර පැවැත්වෙන දින මහා සංඝරත්නය සඳහා දානයක් පිරිනමා සෙත් පිරිත් දේශනා කරවා ගන්නවා. මෙදින සිදුවන වැදගත්ම සිද්ධිය වන්නේ බස්නායක නිලමේවරයා සිය නිල ඇඳුම ඇඳ පෙරහරේ ගමන් කිරීමයි. ඔහු එසේ ගමන් කරන්නේ ඇතාට පෙර වීම විශේෂයි. මෙරට කිසිදු පෙරහරක නිලමේ ඇතාට පෙර ගමන් කරන්නේ නැහැ.

දුටුගැමුණු රජතුමාට යුද්ධය ජයග්‍රහණය කිරීම සඳහා සහාය දුන් කඩොල් ඇතාගේ දළ යුගලය එදින දිවා කාලයේ රන්කොත් මාලිගයෙන් පිටතට ගෙන ජනතා ගෞරවය පිණිස ප්‍රදර්ශනය කරනවා.

පෙරහරේ විශේෂ චාරිත්‍රයක් වන ගිනි පෑගීම සිදු කෙරෙන්නේ පෙරහර නිමවීමට දින 3කට පෙර සිටයි. එහිදී දේවාලය ඉදිරිපිට විශාල ගිනිමැලයක් දල්වා බැතිමතුන් විසින් ප්‍රාර්ථනා කරනු ලබන දේ සිහිකර ගින්දර නිවුණු නමුත් ගිනි අඟුරු මතින් ගමන් කර ගිනි පෑගීමේ චාරිත්‍රය සිදු කරනවා.

අවසානයේදී කිරි වෙහෙරේදී කිරි වෙහෙර විහාරාධිපති හිමියන් ඇතුලු සියළු පෙරහරට සම්බන්ධ වූ සියලු දෙනාට ස්තුති කතාවක් බස්නායක නිලමේ විසින් සිදු කරනු ලබනවා.

පසුදින දිය කැපීමේ චාරිත්‍රය සිදු කරන්නේ දිය කපන කපු මහතා විසිනි. ඒ කිසිවකුට නොපෙනෙන සේ වල්ලිඅම්මා තොටුපොළින් දියට බැස දිය කපන තොටුපොළ දක්වා යාමෙන් අනතුරුවයි. සියලු වස් දෙස් දුරු වී රටට සාමය සතුට උදාවනු පිණිසත් එමෙන්ම කතරගම දෙවියන්ට පින්දීමත් එයින් සිදු කරනවා.

සර්ව ආගමික පෙරහරක් ලෙස හඳුන්වන කතරගම දේවාල පෙරහරේ දුටුගැමුණු රජතුමාගේ අඩි 15ක පමණ උසින් යුතු රූපය පෙරහර ඉදිරියේ ගමන් කරවීමෙන් රජුට උපහාර කිරීමක් සිදු කරනවා."

රුහුණු මාගම් පත්තුවේ ප්‍රධාන සංඝ නායක කිරිවෙහෙර රජමහා විහාරාධිපති කොබවක ධම්මින්ද නා හිමියන් පවසන්නේ ජනතා සහභාගිත්වයෙන් තොරව මෙවර කතරගම පෙරහර මංගල්‍යය පවත්වන බවයි.

"කොවිඩ් වසංගත තත්ත්වය මත වුණත් පෙරහර මංගල්‍යයට අවශ්‍ය සියලු කටයුතුවලට කිරිවෙහෙර දායකත්වය ලබා දී තියෙනවා. විශේෂයෙන්ම රජ කාලයේ සිට පැවතගෙන එන චාරිත්‍ර ඒ ලෙසින්ම සිදු කරනවා. එහිදී කිරිවෙහෙරට අයත් ප්‍රධාන කාර්යයක් වන්නේ පිරිත් තිලයේ රාජකාරි කටයුතු කිරීමයි.

විශේෂයෙන්ම පෙරහර නිමිත්තෙන් සති පිරිත සාම්ප්‍රදායික චාරිත්‍රයක් ලෙසින් පවත්වනවා. ඒ සති පිරිත ජූලි 15 වැනිදා ආරම්භ වුණා. මේ සියලු කටයුතු සිදු කරන්නේ නිරෝධායන නීතිවලට අනුකූලව සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුගතව බව පැවසිය යුතුයි."



රුහුණු මහා කතරගම දේවාලයේ බස්නායක නිලමේ ඩිෂාන් ගුණසේකර



කතරගම ප්‍රාදේශීය ලේකම් ඒ.එම්. නන්දසිරි



කතරගම ප්‍රාදේශීය සභාවේ සභාපති චානක රංගන

රුහුණු මහා කතරගම දේවාලයේ බස්නායක නිලමේ ඩිෂාන් ගුණසේකර මහතා පවසන්නේ කොවිඩ් 19 වසංගත තත්ත්වය මත වුව ද සම්පූර්ණ පෙරහර පවත්වනු ලබන බවයි.

"කතරගම දේවාලයේ බස්නායක නිලමේවරයාට අයත් ප්‍රධානතම කාර්යය වන්නේ දෙවියන් වෙනුවෙන් පුද පූජා පැවැත්වීමයි. ඊට අමතරව පෙරහර පැවැත්වීම, දේවාලය හා ඊට අයත් අනෙකුත් සියලු දේ නඩත්තු කිරීම වැනි කාර්යයන් පැවරී තිබෙනවා. විශේෂයෙන්ම දේවාලයේ කපු මහත්වරු සමඟ මේ කටයුතු නිසි ලෙසින් කළ යුතු වෙනවා. එමෙන්ම මේ වන විට දේවාලයේ මූල්‍ය විගණන කටයුතු ආරම්භ කර තිබෙනවා.

කතරගම නඩත්තුවට අතීතයේ විශාල භූමි වපසරියක් ලබා දී තියෙනවා. දැන ගන්නට ඇති පරිදි එය අක්කර 90,000ක්. කොහොම වුණත් දැන් කතරගම පුදබිමට අයත් අක්කර 35,000ක් තියෙනවා. ඒ භූමි වපසරිය නිසි පරිදි කළමනාකරණය කළොත් කතරගම නඩත්තු කිරීම අපහසු නැහැ.

දෙවියන් උදෙසා කළ යුතු සියලු වත් පිළිවෙත් නිසි ලෙසින්ම අප සිදු කරනවා. එයට සංචරණ සීමා තිබුණා කියා වෙනසක් නැහැ. උදෑසන 4.30ට, පෙරවරු 10.30ට වගේම පස්වරු 6.30ට අප සුවඳ පූජා, ශබ්ද පූජා, ආලෝක පූජා පවත්වා දේව දානය පූජා කරනවා. මුරුතැන් පූජාව නිසි වත් පිළිවෙත් අනුව සිදු කරනවා. ඒ වගේම කිසිදු අඩුවක් නැතිව අප මෙවර පෙරහරේ සියලු කටයුතු කරනවා. වසංගත තත්ත්වය නිසා ජනතා සහභාගිත්වය සිදු කරන්නේ නැහැ. නමුත් සජීවී ලෙසින් රූපවාහිනී විකාශයක් සිදු කෙරෙනවා"

කතරගම ප්‍රාදේශීය ලේකම් ඒ. එම් නන්දසිරි මහතා පවසන්නේ මහජන සහභාගිත්වයෙන් තොරව මෙවර පෙරහර පැවැත්වෙන නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා රාජ්‍ය මට්ටමින් කළ යුතු සේවාවන් අවම වී ඇති බවයි.

"ජන සහභාගිත්වයක් නැති නිසා රාජ්‍ය සේවකයන් යෙදවීම 75%කින් පමණ අඩුවෙලා තියෙන්නෙ. ඒ වගේම ආරක්ෂක අංශවල අයත් ඉතා අවම පිරිසක් පමණක් යොදා ගැනීමට තීරණය වී තිබෙන්නේ.

මෙවර උතුරේ සිට පැමිණෙන බැතිමතුන්ගේ පාද යාත්‍රාව සිදු කෙරෙන්නේ නැහැ. එම නිසා නවාතැන් ගන්නා ජනතාව වෙනුවෙන් සපයනු ලබන පහසුකම් අවශ්‍ය වන්නේ නැහැ. වෙනත් උත්සව සමයන්හි පාද යාත්‍රාවේ පැමිණෙන ජනතාවට කතරගමට පැමිණීමට පෙර සිට අතරමඟදී පවා පහසුකම් සලසන්නට සිදුවුණා. අකමැත්තෙන් වුවත් පාද යාත්‍රාවට අවසර නොදෙන්නට සිදුවුණා. එසේම පෙරහර සමයේ සිදු කරන වෙළෙඳ බලපත්‍ර ලබාදීමත් අවශ්‍ය වන්නේ නැහැ.

නමුත් ලොකුම ප්‍රශ්නය තමයි පෙරහර නිසා වසරක්ම ජීවත් වෙන ජනතාව ගැන සොයා බැලිය යුතු වීම. ඇතැම් අය පෙරහර පවත්වන සති දෙකක පමණ කාලයේදී තමයි අවුරුද්දටම ඕන කරන ආදායම සොයා ගන්නෙ. පවුලේ අය ඔක්කොම එකතුවෙලා කරන ව්‍යාපාර මඟින් ඔවුන් සොයා ගත් ආදායම අද වෙනකොට බින්දුවටම වැටිලා. ඒ ජනතාව වෙනුවෙන් කුමක් හෝ කළ යුතු වෙනවා."

කතරගම ප්‍රාදේශීය සභාවේ සභාපති චානක රංගන මහතා පවසන්නේ මෙවර පෙරහරේදී ද පසුගිය වසරේ මෙන්ම චාරිත්‍ර වාරිත්‍රවලට පමණක් සීමා වීම නිසා ප්‍රාදේශීය සභාවෙන් කළ යුතු කාර්යයන් අවම වී ඇති බවයි.

"කොහොම වුණත් අපි කතරගම පුද බිමේ අවශ්‍ය සියලු කටයුතු සිදු කරනවා. දෙවියන් වෙනුවෙන් කරනු ලබන චාරිත්‍රවල කිසිදු අඩුවක් කරන්නේ නැහැ. දේවාල මළුවට ජලය ඉසීම ඇතුළු පෙරහරට අවශ්‍ය සියලු කටයුතු අප විසින් සිදු කරනවා. පෙරහර බලන්න අවසර නැතත් ජනතාව කතරගමට පැමිණෙනවා. ඔවුන් කතරගම දේවාලයට මෙන්ම වැඩසිටිකන්ද, සෙල්ල කතරගම, සිතුල්පව්ව වැනි පුදබිම් කරා ගමන් කරන්නේ නගරය හරහා. එමනිසා ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැලසිය යුතු වනවා. පෙරහර පවත්වන නිසා මේ දිනවල පස්වරු 3.00න් පසුව කතරගම දේවාල භූමියට ඇතුළුවීමට අවසර නැහැ. පැමිණෙන සියලු ජනතාවට අවශ්‍ය ජල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් ඇතුළු සියල්ල ලබා දිය යුතුයි. ප්‍රාදේශීය සභාවට ලැබෙන සියලු ආදායම් මේ වන විට අහිමිවෙලා තියෙන්නෙ. ඒ වුණත් අවශ්‍ය සියලු කටයුතු කෙසේ හෝ සිදු කරනවා."

ජන සහභාගිත්වයෙන් තොරව වුවද සියලු චාරිත්‍ර වාරිත්‍ර හා නැටුම් කණ්ඩායම්වලින් අලංකෘත කතරගම පෙරහර මංගල්‍යය පසුගිය 10 වැනිදා ආරම්භ වූ අතර මේ වන විට පෙරහර වීදි සංචාරය කරයි. අවසන් පෙරහර 23 වැනිදා ඇසළ පුන් පොහෝ දින පැවැත්වේ. 24 වැනිදා දිය කැපීමෙන් මෙවර පෙරහර මංගල්‍යය අවසන් වනු ඇත.

චාරිත්‍ර වාරිත්‍රවලට පමණක් මුල් තැන ලබා දී හෝ පෙරහර මංගල්‍යය පැවැත්වීම ගැන නාහිමිවරුන්ට, බස්නායක නිලමේ, කපු මහත්වරු ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය සභාවේ සභාපති ඇතුළු සැමට කෘතවේදීත්වය පළ කළ යුතු ය. එමෙන්ම මෙවර කතරගම පෙරහරේ ශ්‍රද්ධාවත් මුද්‍රිත මාධ්‍ය දායකත්වය ලේක්හවුස් ආයතනය විසින් දැරීම ද විශේෂ කාර්යයකි.

තාරක වික්‍රමසේකර

(කතරගම සංචාරයකින් පසු)

සේයාරූ - විමල් කරුණාතිලක

# පාලි භාෂාවත් බෞද්ධ දර්ශනයත් ලෝකයට දිය හැකි අනර්ඝ වස්තුවක්



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ උපකුලපති මාතර අනගාරික ධර්මපාල නගරයේ ශ්‍රී අශෝකාරාම විහාරාධිපති මාතර ශ්‍රී සිද්ධාර්ථෝදය මහ පිරිවෙනේ පරිවේණාධ්‍යක්ෂක සියම් මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක මහාචාර්ය**

**කනත්තෙගොඩ සද්ධාරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**




**බහුශ්‍රැත ධර්මධර විනයධර සම්භාව්‍ය ස්වාමීන් වහන්සේ නමක් වන ඔබ වහන්සේ අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ අභිනව මහෝපාධ්‍යාය ධූරයෙන් පිදුම් ලැබුවා. ගුරු හාමුදුරුවරුන්ගේ ආභාසය ලබමින් ආ ගමන් මඟ සිහිපත් කරමින් සාකච්ඡාව ආරම්භ කරමු හාමුදුරුවනේ,**

මාතරදිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මාතර කඩවත්සතර කනත්තෙගොඩ කියන බොහොම පිටිසර සුන්දර ග්‍රාමයක 1966 සැප්තැම්බර් මස 10 වෙනිදින උප්පත්තිය ලැබුවා.බී.ඒ. ලීලාරත්න සහ ජේ.ඒ.ඇසිලින්නෝනා යන සැදැහැවත් සදාදරණීය මව්පිය දෙපළ ලොකු ධනවතුන් නොවුණත්,මා ඇතුළු දරුවන් 8 කගේ ජීවිත ආලෝකමත් කරගැනීමට සම්පූර්ණ දායකත්වය ලබා දුන්නා.

මාතර වනිගසේකර මහා විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබමින් 6 වන ශ්‍රේණියට සමත් වූණ කාල වකවානුවේදී මාතරදිස්ත්‍රික් විහාරාධිපති සංගමයේ ලේඛකාධිකාරීන් වහන්සේ ලෙස කටයුතු කළ මාගේ ගුරුදේවෝත්තම රාජකීය පණ්ඩිත දිවියාගහ ගුණානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු ගරුතර මහා සංඝරත්නයේ මැදිහත්වීමෙන් මාතරදිස්ත්‍රික් විහාරාධිපති සංගමය මාතර බෝධිරාජයාණන් අභියස කුල දරුවන් 50 ක් පැවිදිකිරීමේ මහා පින්කමේදී මමත් එක කුල දරුවෙකු වශයෙන් 1979 වර්ෂයේ ජනවාරි මස 04 වනදින කනත්තෙගොඩ සද්ධාරතන යන ශාසනික නාමයෙන් උත්තරීතර පැවිදිභූමියට ඇතුළත් වීම මගේ ජීවිතයේ සුවිශේෂීම සිද්ධිය ලෙස මම දකිනවා.ඒතැන් සිට අධ්‍යාපනික, සාමාජික වශයෙන් මගේ ජීවිතයේ ලොකු පරිවර්තනයක් සිදුවුණා.

එහිදී මාගේ ගුරුදේවෝත්තම රාජකීය පණ්ඩිත දිවියාගහ ගුණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මඟ පෙන්වීම උන්වහන්සේගේ අවවාද අනුශාසනා දිරිගැන්වීම නිසා දවසින් දවස මගේ අධ්‍යාපනය වැඩි දියුණු කර ගන්නට ඉඩ අවකාශ සැලසුණා. මාතර අනගාරික ධර්මපාල නගරයේ ශ්‍රී සිද්ධාර්ථෝදය මහ පිරිවෙනින් මූලික පැවිදි අධ්‍යාපනය ලබා ගත්තා.

ගුරුහාමුදුරුවන් වහන්සේලාගේ මග පෙන්වීම යටතේ පැවිදි ජීවිතය ආලෝකවත් කරගැනීමට හේතු වූ බවත්මේ අවස්ථාවේදී ගෞරව පූර්වකව සිහිපත් කළ යුතුයි.

පිරිවෙන් අධ්‍යාපනයෙන් පසු 1986 වර්ෂයේදී අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්ම පීඨයට ඇතුළත් ව 1992 දී පන්ති සමාර්ථයක් සහිතව ත්‍රිපිටකවේදී උපාධිය ලබා ගත්තා. නැවත එම වර්ෂයේ දී ම කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුළත්ව 1996දී ප්‍රථම පන්ති ගෞරව සාමාර්ථයක් සහිතව ශාස්ත්‍රවේදී උපාධියත්, ඒ වගේම ශාස්ත්‍රපති උපාධියත්,කොළඹ විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපන ඩිප්ලෝමා උපාධියත් සම්පූර්ණ කරමින් කිසියම් ආකාරයකින් ශාස්ත්‍රීය ජීවිතයේ ගමන් මඟ වඩාත් යහපත් තත්ත්වයට පත් කර ගන්නට යෙදුණා.විශ්ව විද්‍යාල සේවයට පෙරාතුව ගම්පහ බෙම්මුල්ල විද්‍යාකර පිරිවෙනේ උපගුරුවරයකු ලෙසත්, මාතර ශ්‍රී සිද්ධාර්ථෝදය මහ පිරිවෙනේ පරිවේණාධිපතීන් වහන්සේ වශයෙනුත් සේවයට වැඩම කළා.

අනතුරුව 1998 වර්ෂයේදී අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලයේ බෞද්ධ දර්ශනය පිළිබඳ කථිකාචාර්ය ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ආචාර්ය මණ්ඩලයට ඇතුළත් විමත් සමඟ ශාස්ත්‍රීය ජීවිතය වඩාත් ආලෝකමත් වුණා. විශ්ව විද්‍යාල ආචාර්යවරයකු වශයෙන් පර්යේෂණවල නියැළෙමින් 2002 වර්ෂයේදී කැලණිය විශ්ව විද්‍යාලයෙන් දර්ශනපති උපාධිය ලබා ගත්තා. චීන රජයෙන් ලැබුණ ශිෂ්‍යත්වයකට අනුව බීජිං නුවර මිත්‍ර විශ්ව විද්‍යාලයේ පුරා වසර 4ක් චීන භාෂාවත් හදාරමින් දර්ශනශූරි උපාධිය ලබාගෙන නැවත ශ්‍රී ලංකාවට වැඩම කළා.

ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ විවිධ පරිපාලන තනතුරුවලට සම්බන්ධ වෙමින් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන සංවර්ධනයට අවශ්‍ය කරන ඉගැන්වීම් කටයුතුවල නිරත වුණා. 1998 වර්ෂයේ දීම ශාලාධිපතීන් වහන්සේ ලෙස පරිපාලනයට සම්බන්ධ වෙමින් ශිෂ්‍ය උපදේශක, අංශාධිපති ,පීඨාධිපති වශයෙන් හා විවිධ සමිතිවල සභාපතිත්වය දරමින් තිලතල ඉදිරියට පවත්වාගෙන ආවා. විශ්ව විද්‍යාලයීය සනාතන සභික හා පාලක සභික ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් දායකත්වය ලබාදෙමින් කටයුතු කළා. මෑත කාලීනව පුරප්පාඩු වූ උපකුලපති ධූරය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයකට අනුව ලබා තිබූ අධ්‍යාපනය වගේම සිදුකළ සේවාව , ලැබූ අත්දැකීම් හා සුදුසුකම් මත එම ධූරයට පත්වුවා. විශ්ව විද්‍යාල පාලක සභාව හා උත්තරීතර සභාව විසින් මා ඒ සඳහා වඩාත්ම සුදුසුම භික්ෂුව ලෙස තෝරා පත්කරමින් උසස් අධ්‍යාපන ඇමතිතුමාගේත් උත්තරීතර සභාවේත් නිර්දේශය මත අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් විශ්ව විද්‍යාලයේ උපකුලපතීන් වහන්සේ ලෙස පසුගියදා පත්කරනු ලැබුවා.

**අපේ හාමුදුරුවනේ,සියම් මහා නිකායේ ශ්‍රී රෝහණ සංඝ සභාවේ අධිකරණ නායක ස්වාමීන් වහන්සේ වශයෙන් වගකීම් සහගත කාර්ය භාරයක නියැළීමට පසුබිම සකස් වුණේ කුමන ආකාරයෙන්ද?**

රෝහණ සංඝ සභාවේ සුවිශේෂී පසුබිමක් තිබෙන නිසා එහි විධායක සංඝ සභාවට එක වරටම ඇතුළත් වෙන්න බැහැ. විධායක සංඝ සභාවට ඇතුළත් වීමට ආයුතු ගමන් මගක් තිබෙනවා. ඒ අනුව තරුණ භික්ෂු සංවිධානයේ සාමාජිකත්වය ලබමින් වසර දෙක තුනකින් අනතුරුව උපසම්පදා කාරක සංඝ සභාවට ඇතුළත් වුණා.මා වෙත පවරන ලද රාජකාරිය සහ වගකීම ඵලදායි ලෙස මනාව ඉටුකළ බවට සෑහීමකට පත්වූ එවකට සංඝ සභාවේ මහානායක ධූරය දැරූ සාහිත්‍ය චක්‍රවර්තී රුහුණු විශ්ව විද්‍යාලයේ කුලපතිව වැඩසිටි අත්තුඩාවේ ශ්‍රී රාහුල මහානායක මා හිමිපාණන් වහන්සේ ඇතුළු විධායක කාරක සංඝ සභාව විසින් විධායක සභික ධූරය පිරිනමන්නට යෙදුණා. රෝහණ සංඝ සභාවේ ශ්‍රීමත් මහානායක අත්තුඩාවේ රාහුල මා හිමිපාණන් වහන්සේගේ අපවත්වීමත් සමඟම තනතුරු ඉදිරියට ඇදීම හේතු කොටගෙන රෝහණ සංඝ සභාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක පදවිය පුරප්පාඩු වූණා. මගේ කිසිදු ඉල්ලීමකින් තොරව ශ්‍රී මත් මහානායක මා හිමිපාණන් වහන්සේ ඇතුළු ත්‍රිංශත් වර්ගික කාරක මහා සංඝ සභාව විසින් මා වෙත ප්‍රධාන අධිකරණ සංඝනායක ධූරය පිරිනැමීමට ගත් තීරණය අවස්ථා දෙකකදීම මා විසින් ම නොපිළිගනිමින් ප්‍රතික්ෂේප කරන්නට සිදුවුණේ මා එවකට වැඩිහිටි භික්ෂූන් වහන්සේ නමක් නොවූ නිසයි. එවකට මහානායක ස්වාමීන් වහන්සේ ලෙස කටයුතු කළ රාජකීය පණ්ඩිත මහෝපාධ්‍යාය ගොම්බද්දල නන්දාරාම මහානායක මා හිමිපාණන් වහන්සේ ඇතුළු සානුනායක ත්‍රිංශත්වර්ගික කාරක සංඝ සභාවේ ඉල්ලීම ඉවත දැමීමට නොහැකි නිසාම නැවත එම අධිකරණ සංඝ නායක ධූරය බාර ගැනීමට සිදුවුණා.රෝහණ සංඝ සභාවේ දියුණුව වෙනුවෙන් ගමන් මග නිවැරැදි කරමින්,අවශ්‍ය කරන මගපෙන්වීම් සිදුකරමින්, ධර්ම විනයානුකූලව ක්‍රියාත්මක විය යුතු ආකාරය පෙන්වාදෙමින් ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරනවා.

16 පිටුවට....

හේමමාලා රන්දුනු

# දුක් සහිත සසරෙන් කෙසේ නිදහස් වෙමුද?



**සංසාරයේ ස්වභාවය නම් දුක් සහිත බව ය. කරදර සහිත බව ය. මනුස්ස ජීවිතය සුගති ලෝකයකි. ඒ සුගති ලෝකයේ ඉපදුණ අප වෙන් වෙන් වශයෙන් අප දෙස බැලුවොත් මේ ගෙවා දැමූ ටික කාලයට අප හඬා වැටුණ වාර කොපමණ ද? සුසුම් හෙලූ වාර සිහි කර අවසන් කළ හැකි ද? ප්‍රශ්න නිසා පීඩා විඳි දින ගණනය කළොත්? සුගති ලෝකයේ ම මෙසේ දුක් කන්දරාවක් තිබෙන්නේ නම් ගෙවා ආ සසර ගමන් කොතරම් දුක් කන්දරාවක් විඳින්නට ඇතිද?**

ප්‍රේත, තිරිසන්, නිරය ආදී ලෝකවල ඉපදුණොත් එකදිගට ම දුක් කරදර. ඒ ලෝකවල සැප නැත. දුක් සහිත සසරක ඇවිද යන අතර මඟයි අප මේ මිනිස් ලෝකයේ උපත ලැබුවේ.

මිනිස් ලෝකයේ ඉපදුණත් ඒ හැම කෙනාටම වාසනාව නැහැ බුදුරජාණන් වහන්සේ නමක් වදාළ ධර්මය අසන්න. පින මෝරා ඇති කෙනකුට ඒ ධර්මය ඇසුණොත් තමාගේ ජීවිතයට ප්‍රශ්නයක් එන විට ජීවිතය ගැන සිතන්න පුළුවන් පිළිවෙළක් මුණ ගැසෙනවා.

ඒ වගේම තව කෙනෙක් ධර්මය මුණ ගැසුණ පමණින් සිතුවොත් අපට කායික පීඩා, මානසික පීඩා නැතිව, ආර්ථික ප්‍රශ්න නැතිව, දූ දරුවන්ට කිසිදු අපහසුතාවක් නැතිව සුව සේ අපේ ජීවිත ගලා යා යුතුයි කියා එය අසාධාරණ සිතිවිල්ලක්.

යම් කෙනෙක් මේ ධර්මය පුහුණු කරන අතරේ යම් ප්‍රශ්නයක් ආ විට එයට මුහුණ දෙන ආකාරය සහ සසරෙන් මිදෙන ක්‍රමයකුයි මේ ධර්මය තුළින් අපට මුණ ගැසෙන්නේ.

එක දිගට අපගේ ජීවිතයට ප්‍රශ්න එනවිට අපට සිතෙන්න පුළුවන් අනේ මටමයි මේ හැම කරදරයක් ම කියලා. එහෙත් එකිනෙකා සමඟ වෙන් වෙන්ව කතාකර බැලූ විට සමාජය ඉදිරියේ සිනා සී සිටියාට ඒ හැම දෙනාටම නොයෙක් ආකාරයේ ප්‍රශ්න තිබෙනවා. එකිනෙකාට පෞද්ගලික වූ තමාගේ කතාවක් මේ අභ්‍යන්තරයේ තිබෙනවා. එසේ නම් අප හැමෝටම පොදු වූ දෙයක් තිබෙනවා. අප කා තුළත් අර්බුද තිබෙනවා.

මේ මනුස්ස ලෝකයේ අප සැපෙන් සිටිනවා. ඒ අටලෝ දහමේ හොඳ පැත්තයි. තවත් විටකදී අප දුකට පත්වෙනවා. ඒ අටලෝ දහමේ නරක පැත්තයි. විටෙක ලාභ ලැබෙනවා. තවත් විටක අලාභ ගෙන දෙනවා. නින්දා ලැබෙනවා. නැවත ප්‍රශංසා එනවා. තව කාලයකදී තමා වටේ පිරිස එක්රොක් වී සිටිනවා. තව කාලයකදී තමා තනි වී අයස ලැබෙනවා. තව අවස්ථාවකදී කායික මානසික දුක් පීඩා එනවා. තව අවස්ථාවකදී සැප සේ සිටිනවා.

මේ සියලු දේ අප හැමගේ ම ජීවිතතුළ අඩු වැඩි වශයෙන් වරින් වර පැමිණ තිබෙනවා. අටලෝ දහමේ දුක් පැත්ත එනවිට අප සිතනවා අනේ ඇයි මට ම මේ තරම් කරදර? මේ කරදරවල ඉවරයක් නැහැනේ කියා. නමුත් අටලෝ දහමේ සැප එද්දී අනේ මටමයි සියලු ලාභ ලැබෙන්නේ. මටමයි ප්‍රශංසා. මා වටේමයි පිරිස සිටින්නේ කියා අප කවුරුත් සිතන්නේ නැහැ. ලාභයෙන්, ප්‍රශංසාවෙන්, යසසින්, සැපයෙන් අප උද්දාමයට පත් වෙනවා. අලාභ එනවිට, නින්දා එනවිට, අයස ලැබෙන විට, දුක් පීඩා එනවිට ඇයි මටම මෙතෙරම් කරදර කියා කල්පනා කරන සිතිවිල්ල අසාධාරණ වන්නේ ඒක ලෝක ස්වභාවය නිසා.

බුදුරජාණන් වහන්සේ වැඩසිටි කාලයේ සැවැත්නුවරට ආසන්න ගමක එක් තරුණ කාන්තාවක් වාසය කළා. ඇය සෝණායි. ඉතා රූමත්. විවාහක ඇයට පුතුන් දස දෙනෙක් සිටියා. ඒ දරුවන් ඉතා ලස්සනයි. නිරෝගියි. පුතුන් දස දෙනෙක් සිටි නිසා මේ අම්මා ජීවත් වුණේ තේජසින් යුතුව යි. මම වයසට ගියාම මේ එක දරුවෙක් හරි මට බලයි කියලා මේ අම්මාගේ සිතේ බලාපොරොත්තුවක් තිබුණා.

දිනක් ඒ සෝණාගේ සැමියා ධර්මය අහලා බුද්ධ ශාසනයේ පැවිදි වුණා. දැන් මේ අම්මා සැමියාත් නැතිව දරුවන් දස දෙනෙකු ලොකුමහත් කරන්න බොහෝ මහන්සි වෙනවා. ඉතා අමාරුවෙන් ඇය දරුවන්ට ශිල්පය ලබා දුන්නා. උස් මහත් කළා. නිසි කල විවාහ කරදී දේපළ සියල්ල සම සේ බෙදා දුන්නා.

දැන් ඇය මැදිවියත් පසු කරමින් ඉන්නේ. කාලයකදී පොඩි පුතු අම්මාට කිව්වා අම්මා "ඇයි අපේ ගෙදරම ඉන්නේ. තව දරුවෝ නව දෙනෙක් ඉන්නවානේ. ඒ ගෙවල්වලටත් යන්න" කියලා. එදා සෝණා අම්මා එළියට බැහැලා තව දරුවකුගේ නිවසට ගියා. ටික කාලයක් ගත වෙද්දී ඒ පුතත් කියනවා "අම්මා අපට දේපළ වැඩිපුර දුන්නේ නැහැනේ. අනෙක් දරුවන් ළඟටත් යන්න" කියලා.

ඇය ඒ නිවසෙනුත් එළියට බැස්සා. තමන්ට නැගිටින්නට උදව් කළ අම්මා ඒ දරුවන් අමතක කළා. ඇය නිවසින් නිවසට දරුවන් වෙත යද්දී ඒ සෑම නිවසකම දොරවල් වැසුණා. ඇය දරුවන්ට දෙස් කිව්වේ නැහැ. වෛර කළේ නැහැ. සිදු වූ අසාධාරණය සෙව්වෙත් නැහැ.

"අසාධාරණකම් එක දිගටම ජීවිතයට එද්දී අසාධාරණ සංසාරයෙන් නිදහස් වීම තමයි හොඳම දේ. දුක් කරදර එක දිගට එද්දී දුක් කරදර දෙන කෙනාට ඇඟිල්ල දිගු කරනවාට වඩා හොඳයි කෙළවරක් නැති සසරින් නිදහස් වෙන එක" කියා ඇය සිතුවා.

අසාධාරණ මේ සංසාරයට මම ඇලෙන්න හොඳ නැහැ. ඒ කාලයේ දරුවෝ මගේ වටේ දැවටි දැවටී සිටියා. ඥාතීන් යහලුවෝ මට සිටියා. අද කවුරුවත් නැහැ. ඇය දැන් මහලුයි. ඇය යම් විසඳුමකට ආවා.

දිනක් ඇය භික්ෂුණී ආරාමයකට ගියා. භික්ෂුණීයන්ට ආවතේව කරන්න බාර ගත්තා. ඇයට එතැනත් බොහෝ වැඩ පැවරුණා. දර පැලුවා. වතුර ඇද්දා. භික්ෂුණීන් වහන්සේලාට පැන් පහසුවෙන්න වතුර උණු කළා. අතුපතු ගා පිරිසුදු කළා. මුළු දවස පුරාම ඇයට වැඩ කරන්නට සිදු වුණා. නමුත් ඇය ඉවසුවා.

කාලයක් යද්දී ඇය පැවිදි වුණා. දැන් සෝණා තෙරණිය යි. ඇය පැවිදි වුවත් වැඩවල අඩුවක් වුණේ නැහැ. මුළු දවසේම වැඩ කරන්නට සිදුවුණා. මේ තෙරණිය වැඩ අවසන් වූ පසු රාත්‍රියේ අසල තිබෙන කණුවක් අල්ලාගෙන ඒ වටේ සක්මන් භාවනාවේ යෙදුණා.

ඇයට මලුවක සක්මන් කරන්න වාරු නැති නිසා කණුවක් අල්ලාගෙන සක්මන් කරන්න පුරුදු වුණා. මේ කුණුප කොටස් වලින් සැදුන මේ ශරීරය තමාට කෙතරම් කායික පීඩාවක් ගෙන දෙනවා ද කියා ඇය සිහි කළා. මහ පොළොවට පස් වෙලා යන මේ ශරීරය ගැන සිතමින් ඇය කායානුපස්සනා භාවනාව සිහිකරමින් මුළු රැය පුරා සක්මන් කරනවා.

දිනක් එතුමිය මෙසේ කායානුපස්සනා භාවනාව වඩමින් සිටියා. දැන් එතුමියගේ පින හොඳින් මෝරා තිබුණා. භාග්‍යවතුන් වහන්සේ එදා මහාකරුණා සමාපත්ති ඥානයට සම වැදී අනුකම්පාවෙන් ලෝකය දෙස බැලුවා. භාග්‍යවතුන් වහන්සේ පින මෝරා තිබෙන මේ තෙරණිය දුටුවා. මේ බියකරු සසරින් එතෙර වීමට ගන්නා වීර්යය දුටුවා.

> එක දිගට අපගේ ජීවිතයට ප්‍රශ්න එනවිට අපට සිතෙන්න පුළුවන්, 'අනේ මටමයි මේ හැම කරදරයක් ම' කියලා. එහෙත් එකිනෙකා සමඟ වෙන් වෙන් ව කතාකර බැලූ විට සමාජය ඉදිරියේ සිනා සී සිටියාට ඒ හැම දෙනාට ම නොයෙක් ආකාරයේ ප්‍රශ්න තිබෙනවා. එකිනෙකාට පෞද්ගලික වූ තමාගේ කතාවක් අභ්‍යන්තරයේ තිබෙනවා.

භාග්‍යවතුන් වහන්සේ එතුමිය වෙත ආලෝක ධාරාවක් එවා වදාළා "යම් කෙනෙක් ධර්මයේ හැසිරෙන්නේ නැතිව අවුරුදු සියයක් ජීවත් වුවත් වැඩක් නැහැ. ධර්මයේ හැසිරෙමින් එක්දිනක් ජීවත්වීම තමා උතුම්" කියා.

මේ දහම් පදය අසා සතුටට පත් එතුමිය එදිනම නිකෙලෙස් වුණා. ඇය ගෞතම බුද්ධ ශාසනයේ වීර්යය අධික භික්ෂුණීය ලෙස අග තනතුරු ලැබුවා.

අද වනවිටත් අපි තවම මේ සසරේ ඇවිද යන්නේ අපට එකපිට එක දුක් කරදර එද්දී සිතන්න බැරිවුණා "අනේ මේ සසරේ ස්වභාවයට නේ මම මුහුණ දීලා තිබෙන්නේ" කියා. "අපට දුකක් එනවිට අපි කල්පනා කරන්නේ අසවලා නිසයි මට මේ දුක. මගේ ජීවිතයට කරදරවල ඉවරයක් නැහැනේ "කියා. නමුත් ඒ සෝණා තෙරණියට එකපිට එක කරදර එද්දී ඇය මනා ලෙස ඉවසුවා. දරුවන්ට හෝ සැමියාට වෛර කළේ නැහැ. ඇයට අවශ්‍ය වූයේ දුක්ඛිත මේ සසරින් එතෙරවීම පමණයි. තමාට සිදු වූ අසාධාරණකම් සිත සිතා සිටියා නම් ඇය අදත් මේ සසරේ යන කෙනෙක්. නමුත් එතුමිය සසරේ දුක දැක එයට විසඳුමක් සොයා ගත්තා.

එනිසා අපත් අවිද්‍යාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳී ගෙවා ආ මේ සසරට අවබෝධයෙන් නො ඇලීමයි වටින්නේ. සසරින් එතෙර වීමමයි වටින්නේ. එනිසා අපේ ජීවිතවලට එක දිගටම කරදර ගලා එද්දී ඒ දෙස උපේක්ෂාවෙන් බලන්නට උත්සාහවත් වෙමු. එවිට මෙලොව ජීවිතයත් පරලොව ජීවිතයත් සැනසීමෙන් ගත කරන්නට හැකියාව ලැබෙනු ඇති.

නයනා නිල්මිණී

# ගිහි ගෙදර ජීවිතය අමිහිරි ද?



**දිනක් තථාගත බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට ගෘහපතීන් පිරිසක් පැමිණියහ. එහි දී ඔවුන් අරහයා බුදුරජාණන් වහන්සේ සතර ආකාර වූ සහවාසය කරන්නා වූ ගෘහපතීහු දෙදෙනා වශයෙන් ගෙන මේ ආකාරයෙන් ධර්මය දේශනා කළ සේක.**

ලාමක වූ මෙලොව යම් සැමියෙක් ප්‍රාණඝාත කරයි ද? සොරකම් කරන්නේ ද? කාමයෙහි වරදවා හැසිරෙන්නේ ද? බොරු කියන්නේ ද? මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානය කරන්නේ ද වෙයි. එලෙසම මහණ බමුණන්ට ආක්‍රෝශ හා නින්දා කරන්නෙක් ද වෙයි. දුශ්ශීලව පව්වු අදහස් ඇතිව, ඇඩි ලෝභීව ගිහි ගෙදර වාසය කරයි.

එලෙස ම ඔහුගේ භාර්යාව ද ප්‍රාණඝාත කරන්නී ය. සොරකම හා කාමයෙහි වරදවා හැසිරෙන්නීය. බොරු කියන්නී ය. මදයට ප්‍රමාදයට හේතුවන රහමෙර පානය කරන්නී ය. ඒ වගේ ම දුස්සීල ව හා පාපී අදහස් ඇතිව මසුරුමලින් යුතුව ගිහිගෙදර වාසය කරන්නීය. මහණ බමුණන්ට ද ආක්‍රෝශ හා නින්දා කරන්නී ය. මේ ආකාරයෙන් ලාමක සැමියෙක් ලාමක වූ බිරිඳක හා එක්ව වාසය කිරීම පළමු සංවාසය ලෙස හඳුන්වා දී ඇත.

දෙවන සංවාසය පිළිබඳව මේ ආකාරයෙන් දේශනා කර ඇත. එනම් ලාමක වූ සැමියෙක් දෙව්දුවක් හා බඳු බිරිඳක් සමඟ වාසය කිරීමයි. යම් සැමියෙක් ප්‍රාණඝාතය කරන්නේ ද, සොරකම් කරන්නේ ද, කාමයෙහිවරදවා හැසිරෙන්නේ ද, බොරු කියන්නේ ද? මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානය කරන්නේ ද වෙයි. එලෙස ම දුශ්ශීල වූයේ ද පාපී අදහස් ඇති මසුරුමලින් යුතු වූවෙක් ද වෙයි. මහණ බමුණන්ට ආක්‍රෝශ, පරිභව නින්දා කරන්නෙක් ද වෙයි. එහෙත් ඔහුගේ භාර්යාව ප්‍රාණඝාතයෙන්, සොරකමින්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, බොරු කීමෙන් වළකින්නී ය. මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානයෙන් වැලකුණේ වෙයි. සිල්වත් ව කල්‍යාණ දහමින් යුක්තව මසුරුමල බැහැර කළ සිතින් යුතුව ගිහි ගෙදර වාසය කරන්නී ය. එමෙන් ම මහණ බමුණන්ට ආක්‍රෝශ හා නින්දා නොකරන්නී ය. ලාමක වූ සැමියෙක් සමඟ දෙව්දුවක් බඳු වූ බිරිඳක් සමඟ විසීමක් ලෙස හඳුන්වා දී ඇත.

අප භාග්‍යවතුන් වහන්සේ තුන්වන සංවාසය මේ ආකාරයෙන් පැහැදිලි කර දේශනා කර ඇත.දෙවියෙක් බඳු වූ සැමියෙක් ලාමක වූ බිරිඳක් සමඟ එක්ව වාසය කරන්නේ ද? එනම් මෙලොව සැමියෙක් ප්‍රාණඝාතයෙන්, සොරකමින්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, බොරුකීමෙන් හා මදයට ප්‍රමාදයට හේතුවන රහමෙර පානයෙන් වැළකුණේ ද වෙයි. ඒ වගේ ම සිල්වත් ව කලණ දහම් ඇතිව බැහැර කළ මසුරු මළ ඇතිව ගිහිගෙයි වසයි. මහණ බමුණන්ට ආක්‍රෝශ හා නින්දා නොකරන්නේ වෙයි. එනමුත් ඔහුගේ භාර්යාව ප්‍රාණඝාත, කාමයෙහි වරදවා හැසිරෙන, බොරු කියන හා මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානය කරන්නී ද වෙයි. දුශ්ශීල ද ලාමක අදහස් ඇත්තියක් ද,ලෝභී සිතින් ද යුක්ත වූවා වෙයි. එලෙස ම මහණ බමුණන්ට ආක්‍රෝශ නින්දා කරන්නී ද වෙයි. මේ ආකාර වූ දෙවියෙක් බඳු සැමියෙක් ගුණ නැත්තා වූ ලාමක වූ බිරිඳක් සමඟ වාසය කිරීමකි.

සතරවෙනි සංවාසය භාග්‍යවතුන් වහන්සේ මේ ආකාරයෙන් පැහැදිලි කර දේශනා කර ඇත. දෙවියෙක් බඳු සැමියෙක් දෙව්දුවක් බඳු බිරිඳක් සමඟ වාසය කෙරේ ද? මෙලොව යම් සැමියෙක් මෙන් ම බිරිඳක් ප්‍රාණඝාතයෙන්, සොරකමින්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, බොරු කීමෙන් වැළ කුණේ ද වෙයි. ඒ වගේ ම මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර භාවිතයෙන් වැළකුණේ වෙයි. සිල්වත් වූයේ ද කලණ දහම් ඇතිව බැහැර කළ මසුරු මල ඇත්තෙක් වන්නේ ය. මහණ බමුණන්ට ආක්‍රෝශ නින්දා ද නොකරන්නේ ය. මෙය නම් දෙව් වූයේ දෙව් දුවක හා එක්ව විසීමයි.

භාග්‍යවතුන් වහන්සේ මෙම කල්‍යාණවන්ත වූ දිව්‍යමය පවුල "දෙදෙනා ම සැදැහැතිව, පරිත්‍යාගශීලීව, ශීල සංයමයෙන් යුතුව, දැහැමි ජීවිත පවත්වන්නේ ද, ඔවුනොවුන්ට ප්‍රියකරුවෙත්" යනුවෙන් දේශනා කර ඇත. ඒ වගේ ම "සම සිල් ඇති මේ දෙදෙනාගේ අභිවෘද්ධිය සම්පූර්ණ වෙත් ද ඔවුනොවුන්ට පහසු විහරණ වෙයි. ඒ වගේ ම "මෙලොව සමාන සිල් ඇතිව, දෙදෙන දහම් මඟ සපුරා සතුටු වූවා හු දෙව්ලොව සැප කැමති වෙමින් විපාක වූ කලණ දහම් මඟ අනුව සතුටු වෙති.

භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ සඳහන් පඨම සංවාස සූත්‍රයෙහි ගෘහස්ථ ජීවිත ගත කරන සියලු දෙනා විසින් නුවණින් මෙනෙහි කළ යුතු ය. භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ මේ ධර්ම මාර්ගය අනුගමනය කිරීමට තරම් කායික සහ මානසික පවුල් පරිසරයක් ගිහි ගෙදරක නොමැත්තේ නම් චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධය නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිළිපන් ශ්‍රාවකයෙක්, ශ්‍රාවිකාවක් වන්නේ ද? සැමියා සහ බිරිඳ අතරින් එක් අයෙක් පස්පව් හි යෙදෙමින් පාපී අදහස් ඇතිව වාසය කරන්නේ නම් අනෙක් සහකරුට හෝ සහකාරියට නිසි සේ දහම් මඟ අනුගමනය කළ නොහැකි ය. සිතට සැනසිල්ල දෙන ස්වාමි භාර්යා හෝ මව්පිය දූ දරු සම්බන්ධයක් කෙසේ නම් පවත්වන්නේ ද?

ඕනෑම ජීවිතයක සසර ගත කර්මදෝෂ පැවතිය හැකි ය. එනමුත් ශ්‍රද්ධා, ශීල, චාග,

ප්‍රඥා නම් වූ සතර ගුණ සම්පත් සැමියා බිරිඳ දෙදෙනාට ම හැකිතාක් දුරට සමාන කර ගනිමින් දියුණු කර ගත හැකි නම්, වෙස්සන්තර මන්ත්‍රීදේවි නම් වන්නේ ය. සිදුහත් – යසෝදරා නම් වන්නේ ය. නකුලපිතු නකුල මාතා නම් වන්නේ ය. මේ නම් පෙළට ගිහි ගෙදර එක්ව වාසය කරන අපට ද එකතු විය හැකි වන්නේ ය. මේ ආකාරයෙන් වූ මෙම මනා වූ සංවාසයම පරමාර්ථ ධර්ම අවබෝධයට මාර්ගය සකසා ගැනීමක් වන්නේ ය.

සෑම එකතුවීමක් ම වෙන්වීමකින් කෙළවර වන්නේ ය. මේ බව තේරුම් ගැනීම ගෘහස්ථ ජීවිතය දිව්‍යමය පවුලක් සේ ගත කරන සියල්ල අනිත්‍ය වූ මේ භවයෙහි කිසිවක් ස්ථිර, සදාකාලික හා තමාට අවශ්‍ය ආකාරයෙන් නොපවත්නා බව වැටහෙන්නේ ද. මෙයම නිවන් මඟ අනුගමනය කිරීමයි.

## සිරි සදහම් පැන විසඳුම්

සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරු ලියා එවා ගුණසේන සහ සමාගමෙන් පිරුවානා පොත් වහන්සේ නම් යුත් "මහ පිරිත් පොත් වහන්සේ" හිමිකර ගන්න.

සතිපතා ජයග්‍රාහකයන් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ.

බුදුසරණ

*සතියේ ප්‍රශ්නය - 58*

**ඉන්දීය ජාතික ධජයට ධර්ම චක්‍රය හඳුන්වා දුන්නේ කවුද?**

පිළිතුර : ..............................

නම : ..............................

නිවසේ ලිපිනය : ..............................

..............................

දුරකතන අංකය : ..............................

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

ඇම්. ඩී. ගුණසේන – බුදුසරණ සිරි සදහම් පැන විසඳුම්, බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10

# මොරකැටිආරේ සුමණානන්ද හිමි




ගල්කිස්ස පන්සල පාර ශ්‍රී සුගත ධර්මායතනයේ මොරකැටිආරේ සුමණානන්ද ස්වාමීන් වහන්සේ පැවිදි දිවිය ආලෝකවත් කරගනිමින්, අර්ථාන්විත ව කටයුතු කරන සුපේශල ශික්ෂාකාමී හිමි නමකි. තමන් වහන්සේ වැඩවෙසෙන විහාරස්ථානයේ දයක දයිකාවන්ට සේම අවට ජනයාගේ හිත සුව වෙනුවෙන් උන්වහන්සේ ආගමික, සාමාජීය වශයෙන් අපමණ සේවාවක නිරත වෙති.

ශ්‍රී විමලසිරි දහම් පාසලේ ඉගෙනුම ලබන දරු දැරියන් තුළ සාර ධර්ම වැඩිදියුණු කිරීම සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, වෙසක්, පොසොන් පොහෝ දිනයන් හි විශේෂ ආගමික වැඩසටහන් සඳහා අනුශාසනා කිරීම තුළින් සාර ධර්ම, පිරුණු සමාජයක් සේම ගමේ ජනතාවට දෙලොව දියුණුවට ධර්ම දනය ලබාදීම ආදිය උන්වහන්සේ තුළ කැපී පෙනෙන ගුණ ධර්මයන් ය.

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ දරිද්‍රතාවයෙන් පෙළෙන අසරණ පිරිසකට තමන් වහන්සේට හැකි පමණින් යම් පරිත්‍යාගයන් කිරීමට ද උන්වහන්සේ නිර්ලෝභී වූහ.

මොරකැටි ආරේ සුමණානන්ද හිමියන්ගේ ජන්ම දිනය යෙදෙන මෙම 18 වැනිද සොබා අසිරිය නමින් ග්‍රන්ථයක් එළි දැක්වීමට ද උන්වහන්සේ කටයුතු කර ඇත. උන්වහන්සේට තවදුරටත් සම්බුද්ධ ශාසනය වෙනුවෙන් ඇප කැප වන්නට, බොදු ජනතාවට පිහිට වන්නට නිදුක් නිරෝගී චිර ජීවනය ලැබේවා යි ප්‍රාර්ථනා කරමු.

**ඉසුරි අබේවික්‍රම**

## අපේ දහම් පාසල



දහම් ඉගෙන ගන්න තමයි දම් පාසල් එන්නේ
ගුරු මව්වරු ගුරු පියවරු සිත් පහදන්නේ
දහම් දැනුම අප හැමට ම නිසිලෙස දෙන්නේ
ගුරු හිමිවරු මෙහි වැඩහිඳ දම් ඇස පාදන්නේ

අධ්‍යාපනයට ම තමයි කවුරුත් මුල්තැන දෙන්නේ
දහම් දැනුම තමයි සැමට දැන් දැන් අඩු වී යන්නේ
අනාගතේ දම් පාසල් වැඩි වැඩියෙන් ඇරඹෙන්නේ
දහම් දැනුම නොමැති වුණොත් කෙලෙසද ඉහළට යන්නේ

දහම් දැනුමෙ වටිනාකම හැම දින කියලා දෙනවා
දැනුම ලබා ගන්නට දැන් වැඩි වැඩියෙන් මෙහි එනවා
කිසිම දෙයක් නොලැබුවත් ගුරු සේවය සලසනවා
හැම දානෙට වඩා උතුම් දහම් දානෙ ලැබ දෙනවා

**ගාල්ල කාලිංගවත්තේ ජී. පියදාස**

**අ.පො.ස (උසස් පෙළ) විභාගය 2021**
**බෞද්ධ ශිෂ්ටාචාරය ආදර්ශ ප්‍රශ්නෝත්තර**
**කුලියාපිටිය සාරානාත් විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය ශාස්ත්‍රපති උප්පල වත්තේ විමලානන්ද හිමි.**

# ලෝකයේ බුදු දහම ව්‍යාප්ත වූ රටවල් ආශ්‍රිත ප්‍රශ්න

### අභ්‍යාස 02

01 වන ප්‍රශ්නය

- **තායිලන්තය හෙවත් සියම් රටට බුදුදහම ලැබුණු අයුරු දක්වන්න.**

**පිළිතුර –**

ථේරවාද බුදුදහම පවතින රටක් වශයෙන් තායිලන්තය හෙවත් සියම් රට දැක්විය හැකි ය. ලංකාව මෙන් අට ගුණයක් පමණ විශාල වූ මෙම රටෙහි වර්තමාන අගනගරය බැංකොක් නුවර ය. පුරාවිද්‍යාත්මක සාධක අනුව මෙහි මුල් පදංචිකරුවන් වන්නේ මොන් වරුන් ය. එරටට බුදු දහම ලැබී ඇති ආකාරය පිළිබඳව මත කිහිපයක් පවතී.

01. ක්‍රි.පූ. 03 වන සියවසේ අශෝක දවස පැවැත් වූ 03 වන සංගායනාවෙන් රටවල් නවයකට බුදුදහම හඳුන්වා දුන් බවත් එකල ස්වර්ණ භූමියට වැඩම කළ සෝන, උත්තර දෙනම වහන්සේ ආසන්නතම රට වන සියම් රටට බුදු දහම රැගෙන ගිය බවත් සඳහන් වේ.

02. තායලින්තයට බුදු දහම ලැබීම පිළිබඳ ව පවතින තවත් මතයක් වනුයේ ක්‍රි.පූ. 07 වන සියවසේ දී පමණ සුමාත්‍රාවේ රාජ්‍ය කළ පලම්බාන් රජුගේ කාලයේ මහායාන බුදු දහම ලැබුණ බව ය.

03. ක්‍රි.ව. 1000 දී පමණ බුරුමයේ මහා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කළ අනව්රත රජතුමා තායිලන්තයට බුදු දහමේ පණිවිඩය ලබා දී ඇති බව තවත් මතයකි.

04. ක්‍රි.ව. 13 වන සියවසේ ලක්දිව දඹදෙණි රාජධානියේ රාජ්‍ය කළ දෙවන පැරකුම් රජු ශ්‍රී ලාංකික භික්ෂූන් පිරිසක් මඟින් බුදු දහමේ පණිවිඩය තායිලන්තයට ලබා දුන් බව ද කියැවේ. තායිලන්තයට බුදු දහම ලැබීම පිළිබඳ මෙවැනි මත පවතී.

2 වන ප්‍රශ්නය

- **තායිලන්තයේ බුදු දහම ව්‍යාප්ත වී ගිය අයුරු දක්වන්න.**

**පිළිතුර –**

බුදු දහම ව්‍යාප්ත වූ බොහෝ රටවල්වල රාජ අනුග්‍රහය ඇතිව බුදු දහම ව්‍යාප්ත වී තිබේ. එරට බුදු දහම ව්‍යාප්ත කිරීමට පුරෝගාමී වූ පාලකයකු වශයෙන් රාම්කම්හැම් (රාමක මේන්) හැඳින්විය හැකි ය. ඔහු එරට රාජ්‍ය කරන කාලයේ ලක්දිව බුදු සමය බෙහෙවින් ව්‍යාප්තව පැවතුණි. පොළොන්නරු යුගය වූ මෙකල ලක්දිව බුදු දහමේ පැවති උන්නතිය පිළිබඳ ව රාමක මෙන් රජුට දැන ගැනීමට ලැබුණි. ඔහු තායි භික්ෂූන් පිරිසක් ලක්දිවට එවා බුදු දහම පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීමට සැලැස්වීය. එමෙන්ම උන්වහන්සේලා ලංකාවේ දී උපසම්පදා කරවා ගෙන එරටට ගෙන්වා සීහල භික්ෂු වංශය නමින් අලුත් භික්ෂු නිකායක් ද පිහිටවී ය. සුකෝදය නගරට කේන්ද්‍ර කොට ගෙන එරටට බුදු දහම ව්‍යාප්ත කිරීමට ද කටයුතු කළහ. තායිලන්ත භික්ෂූන් වහන්සේලා කොටස් දෙකකට බෙදී සිටිති. එනම්,

01. ධම්ම යුක්තික නිකාය
02. මහා නිකායික භික්ෂු පිරිස යනුවෙති.

එරට භික්ෂූන් වහන්සේලා පාලනය වන්නේ සංඝරාජ හිමිනමක් යටතේ ය. උත්තරීතර නායකයා වශයෙන් සලකනු ලබන්නේ එම සංඝරාජයාණන් වහන්සේ ය. එරට රජු සංඝරාජයන් වහන්සේ පත්කරනු ලැබේ. සංවිධාන හත නම් සංඝ සමාජය පාලනය කිරීමද සුවිශේෂත්වයකි. එම සංවිධාන හත නම්, සංඝ රාජයන් වහන්සේ, උත්තරීතර සංඝ සභාව, සංඝ මන්ත්‍රී මණ්ඩලය, ප්‍රාදේශීය පාලක මණ්ඩලය, භික්ෂු කොමසාරිස්වරු, දිස්ත්‍රික් කාමසාරිස්වරු, ග්‍රාම සංඝ සභාව යනුවෙති.

3 වන ප්‍රශ්නය

- **තායිලන්ත ජන ජීවිතය බුදු දහමින් පෝෂණය වී ඇති ආකාරය පැහැදිලි කරන්න.**

**පිළිතුර –**

එරට සියලුම පිරිමි අය තාවකාලිකව හෝ පැවිදි වී සිටිය යුතු ය.

පැවිදි වී සිටි බවට ලැබෙන සහතිකය විවාහයේ දී හා රැකියාවේ දී වැදගත් වීම.

දිනපතාම උදෑසන පිණ්ඩපාතයේ යන භික්ෂූන් වහන්සේ නමකට පිණ්ඩපාත දනය පිරිනැමීම.

විවාහ මංගල්‍ය උත්සවය බෞද්ධ සිරිත් විරිත්වලට මුල්තැන දෙමින් සිදු කිරීම.

ගමේ ප්‍රජා මධ්‍යස්ථානය හා අධ්‍යාපන මධ්‍යස්ථානය ආරාමයට බවට පත්වීම.

ගිහි ජනතාව නිරන්තරයෙන් පන්සල ඇසුරු කිරීම.

බුදුදහමේ ආරක්ෂකයා ලෙස රජතුමාට පූජනීය තත්ත්වයක් ලැබීම.

සියලු දෙනාම ගෙලෙහි බුදු පිළිමයක් පැළඳීම.

විශේෂ උත්සවයක් වශයෙන් කඨින පූජා උත්සවය පැවැත්වීම.

අවමංගල්‍ය කටයුතු විහාරස්ථානයේ සිදු කිරීම.

12 පිටුවෙන්

# පාලි භාෂාවත් බෞද්ධ දර්ශනයත්

**ශාස්ත්‍රීය ශික්ෂණයෙන් ඔබ වහන්සේ ලබාගත් දැනුම් සම්භාරයට අනුව විවිධ විපර්යාසයන්ට ලක්වෙමින් පවතින මෙබඳු සමාජයක අධ්‍යාපනය ලබමින් හැදෙන වැඩෙන නූතන භික්ෂූන් වහන්සේලාට ලබාදෙන අවවාද අනුශාසනා මොනවගේද?**

ශාස්ත්‍රය ලබාදීමත් සමග පුද්ගල ශික්ෂණය ඇතිවිය යුතුවම තිබෙනවා. වර්තමාන අධ්‍යාපන රටාව තුළ සමාජයත් ,රටත්, අපේක්ෂා කරන ආකාරයට ගිහි පැවිදි දෙපාර්ශ්වයෙහිම ශික්ෂණයක් ඇතිවෙලා තිබෙනවාද? කියන ප්‍රශ්නාර්ථයක් තිබෙනවා.

අප ජීවත්වන සමාජ පරිසරයේ තිබෙන සිද්ධීන් අධ්‍යාපනය ලබන ගිහි පැවිදි ශිෂ්‍යයන්ට දකින්නට,අත්විඳින්නට තිබෙන නිසා අපි අපේක්ෂා කරන මට්ටමට ගෙන ඒම ඉතාමත් දුෂ්කර කාරණාවක් වුණත්, අපට වගකීමෙන් බැහැර වෙන්නට හැකියාවක් කොහොමටවත් නැහැ.

කිසියම් ආකාරයක විභාග ඉලක්ක කරගත් භික්ෂු අධ්‍යාපනයක් වුණත්, අධ්‍යාපනය තුළට පුද්ගල චර්යාව සංවර්ධනය කරන අධ්‍යාපන රටාවක් ඇතුළත් කරගත යුතුයි. බෞද්ධ අධ්‍යාපන රටාව තුළ ඒම කාරණාව වඩාත් ඉහළින් තිබෙන බව අපි දන්නවා. ඇතැම් විට බෞද්ධ අධ්‍යයන විෂයයන් තුළින් දුරස්වෙලා ආර්ථික වටිනාකම් ඇතැයි කල්පනා කරමින් විද්‍යා විෂයයන් ට යොමු වෙනවා.

බෞද්ධ විෂය තුළ අනෙක් විෂයයන්ට වඩා ආර්ථික වටිනාකම් ගොනු කරගැනීමේ හැකියාවක් තිබෙන බව අමතක නොකළ යුතුයි. එම ආර්ථික වටිනාකම් ගොනු කර ගන්නට නම්, පාලි භාෂාව, බෞද්ධ දර්ශනය ගැඹුරු ලෙස අධ්‍යයනයට යොමුවීමත් සමගම ජාත්‍යන්තර භාෂාවක් ප්‍රගුණ කළ යුතුමයි. ලංකාවෙන් ඉල්ලන සුවිශේෂී සම්පත වන පාලි භාෂාවත් ,බෞද්ධ දර්ශනයත් ලෝකයට දිය හැකි අනර්ඝ වස්තුවක්. ඒ සඳහා අධ්‍යාපන රටාව සකස්විය යුතුයි.

භික්ෂූන් වහන්සේලා ඒ සඳහා අවධානය යොමුකරමින් අධ්‍යාපනය සංවර්ධනය කරගැනීම අවශ්‍යයි.මා ලැබූ අත්දැකීම් අනුව භික්ෂූන් වහන්සේලාට විදේශීය භාෂා දැනුම පිළිබඳ බරපතල ඌනතාවයක් තිබෙනවා. වර්තමාන භික්ෂූන් වහන්සේ ඉදිරි ගමන් මග සකස් කරගන්නට නම්,පාලි, ත්‍රිපිටක ධර්මය, සිංහල භාෂාව වගේම ඉංග්‍රීසි භාෂාව මැනවින් ප්‍රගුණ කරගත යුතුමයි.

**උපාසක මහතෙකු අවශ්‍යයි**

කළුතර ප්‍රදේශයේ විහාරස්ථානයක් බලාකියාගෙන ආගමික වත් පිළිවෙත්වල යෙදිය හැකි සුරා සුදුවෙන් තොර උපාසක මහතෙකු සොයමි.

**විමසීම් : 0770076806**

**O+ වර්ගයේ වකුගඩුවක්**

**අවු. 66 වයස වූ කෙනෙකුට ඉතා ඉක්මණින් අවශ්‍යයි.**

**077-0702254, 074-1110487**
**078-2455838**

**ගිරිබාව ප්‍රදේශයේ හුදෙකලා ආරණ්‍යයක**

ස්වාමීන් වහන්සේලා දෙනමකට උපස්ථාන කරමින් බණ භාවනා කිරීමට කැමති, ආධ්‍යාත්මික දියුණුව කැමති,


**සිල්වත් උපාසක පින්වතෙකුට අවස්ථාවක්.**

වයස අවුරුදු 60 ට අඩු විය යුතුයි.

විමසන්න.

**දුරකථනය : 0717-674224**

## මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් ගංගොඩවිල ඤාණාලෝක හිමි මුල්තැනට



නුගේගොඩ, ගංගොඩවිල, සුභද්‍රාම පිරිවෙන් විද්‍යායතනයෙහි ඉගෙනුම ලබන ගංගොඩවිල ඤාණාලෝක පොඩි හාමුදුරුවෝ 2019 වර්ෂයේ පැවැත්වූ මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් ඒ (ඒ) සාමාර්ථ දහයක් ලබා දිවයිනේ ප්‍රථම ස්ථානය ද, 2020 පැවැත්වූ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයේ ඩී සාමාර්ථ හයක් හිමිකරගෙන දිවයිනේ ප්‍රථම ස්ථානය ද, ලබාගෙන ඇත. උන්වහන්සේ දැනට ප්‍රාචීන මධ්‍යම විභාගය සඳහා සූදානම් වෙමින් සිටින අතර සෙසු සහෝදර හිමිවරුන්ටත් සහයෝගය ලබා දෙමින් ඔවුන් ද දිරිමත් කිරීම බෙහෙවින් අගය කළ යුත්තකි. ගංගොඩවිල ඤාණාලෝක පොඩි හාමුදුරුවන් වහන්සේට පිරිවෙනේ ගරු කෘත්‍යාධිකාරී නාහිමිපාණන් වහන්සේ, පරිවෙණාධිපති හිමි ඇතුලු සියලුම ගුරු භවතුන් සුභාෂිංශනය ප්‍රාර්ථනා කරයි.

**මදරා මුදලිගේ**

## පෝය ලබන සහ ගෙවන අයුරු

**ඇසළ පුර අටවක**

**ජූලි 17 සෙනසුරාද පූර්වභාග 04-34 පුර අටවක ලබා 18 ඉරිදා පූර්වභාග 02.41 ගෙවේ. සෙනසුරාද සිල්.**


**ඇසළ පුර පසළොස්වක**

**ජූලි 23 සිකුරාද පූර්වභාග 10.43 පසළොස්වක ලබා 24 සෙනසුරාද පූර්වභාග 08.06 ගෙවේ. සිකුරාද සිල්.**

## ප්‍රහේලිකා අංක 20

බුදුසරණ
තෑගි අනුග්‍රහය බෞද්ධාලෝක පදනම

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**



**හරහට**

1. විදුර ජාතකයෙහි සඳහන්වන යක්ෂයාගේ නමයි
4. බුදුබව ලබා ගැනීමට බෝසතුන් මෙම ගුණාංග දහයක් පුරන ලදී
6. මෙම සම්ප්‍රදායික ජ්‍යොතිෂය තොරතුරු පත්‍රය ශුභ, අශුභ කාල සහ පොහොය දින යනාදිය දක්වයි.
8. මාර්ගය යන අර්ථය දෙන වචනයකි.
9. ආශිර්වාදාත්මක ප්‍රබන්ධයන් වන මෙම වචන සැකැසුම් තඹ තහඩුවල ලියා ශරීරයෙහි පැළඳීම ද කරති.
10. ගෘහ සේවිකාවන් සඳහා වන පැරණි භාවිත නාමයකි.
12. පන්සලකට සම්බන්ධ එහි අවශ්‍යතා සපයන ගිහියන් නම් කරන අයුරුයි.

**පහළට**

1. අරහං යන බුදුගුණය අළලා ලියූ සුප්‍රසිද්ධ පැරණි සිංහල ග්‍රන්ථයකි.
2. ගල් ගුහා තුළට පර්වත බිත්තියෙන් ගලායන ජලය වළකාලීමට කර ඇති නිර්මාණයයි.
3. ඉතා නුවණැති කාන්තාවක් ලෙස මෙම දේවියගේ නම සිංහල සාහිත්‍යයෙහි කියැවෙයි.
5. මුවන්ට අභය භූමියක් වූ නිසා බරණැස ඉසිපතනයට මෙම නම යෙදිණි.
7. හින්දු ධර්මයට අයත් ග්‍රන්ථ කාණ්ඩයකි.
11. ශික්ෂා යන අරුත් දෙන වචනයකි.

**පිරුවානා පොත් වහන්සේ, සප්ත බොජ්ඣංගය, මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් රචිත බුදුන් වදාළ ධර්මය ඇතුළු ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

මෙම ලිපියේ 3 කොටස
පසුගිය පොසොන් අමාවක පෝදා පත්‍රයේ පළ විය

# වැලිවිට අසරණ සරණ සරණංකර හිමියෝ සංඝරාජ ධූරයට පත්වෙති

04

**නරේන්ද්‍රසිංහ රජතුමාත් උභය විහාර සාමණේරයන් වහන්සේලාත්, සිල්වත් සමාගමත්, මහජනතාවත් සතුටට පත්වන සේ කටයුතු කරමින් හා අධ්‍යාපන කටයුතු සිදු කරන අතර, රත්නත්‍රයේ ගාථා, රජතුමාගේ ඉල්ලීම පරිදි භෙසජ්ජ මංජුසා සන්නය මහා බෝධි සන්නය, සතරබණවර සන්නය, රූපමාලාව, පාලි සන්දේශය ආදී ග්‍රන්ථ සම්පාදනය කිරීම නිසා රාජරාජ මහාමාත්‍යාදීන් හා උභය විහාරයීය භික්ෂූන් වහන්සේ ද බෙහෙවින් ප්‍රසාදයට පත් වූහ.**

ශ්‍රී විජයරාජසිංහ රජතුමා "රාජගුරු" යන ගෞරව නාමය උන්වහන්සේට පිරිනමා ඇති අතර, රජතුමාගේ ගුරුවරයා වූයේ ද සරණංකර සාමණේරයන් වහන්සේ ය.

උන්වහන්සේ නිතර ප්‍රාර්ථනා කළේ සම්බුද්ධ ශාසනය යනු උපසම්පදාවයි. උපසම්පදාවක් නැති තැන ශාසනයක් නැත යනුවෙනි.

ලංකාවෙන් රැගෙන ගිය මහාවිහාර උපසම්පදාව ලැබූ භික්ෂූන් වහන්සේ වැඩවසනුයේ සියම්රටේ හා බුරුම රටේ හෙයින්, පළමුව නරේන්ද්‍රසිංහ රජතුමාට සිහිපත් කළ ද ප්‍රයෝජනයක් නොවීය.

එනමුත් අධ්‍යාපනය දියුණු කිරීමට නියමකන්ද විද්‍යාස්ථානය පිහිටුවා අදාළ සම්පත් ලබා ගැනීමට සහාය විය.

ශ්‍රී විජයරාජසිංහ රජතුමාට මේ උතුම් උපසම්පදාව පිළිබඳ සිහිපත් කොට රාජ්‍ය අනුග්‍රහයෙන් පඬුරුපාක්කුඩම් හා සංදේශ සිහිතව උපවැදි වූ හාරගොඩ ඇතුළු සිල්වතුන් පස්දෙනා ද, දෙරණෑගමරාළ හා මාතොට රාළ යන ඇමතිවරු දෙදෙනා ද, වටවන උපාසක රාළ හා සේවකයකු ද යන දූත පිරිස නැව් මගින් සියම් රටට යවන ලදි. නැව වැලිකන්දක හැපී විනාශ විය. ඇමතිවරු දෙදෙනාත් උපාසක හා සේවකයාත් පමණක් ඉතිරි විය. දෙවන වර ද වැල්ලෑවේ ආදී සිල්වතුන් පස්නමත් දෙරණෑගම, මීදෙනිය, විල්බාගෙදර මොහම්දිරම් යන අටදෙනා සියම් රටට ගොඩ බසිනවාත් සමගම විජයරාජසිංහ රජ මරණයට පත් විය. එහෙහින් ආපසු එන විට විල්බාගෙදර මොහම්දිරම් හැර සෙසු හත්දෙනා ද මරණයට පත් විය.

උතුම් වූ උපසම්පදාව ගෙන ඒමට දෙවතාවක්ම ධූතයන් යැවූ අතර, ඔවුන්ගෙන් දෙළොස් දෙනෙක් මුහුදට බිලි විය. 13 වන බිල්ල වශයෙන් මම හෝ මුහදට බිලි වී අනාගත සාමණේරවරුන්ට උපසම්පදාව ලබා ගැනීමට අවස්ථාව ලැබේවා යන අධිෂ්ඨාන කරගත් සරණංකර සාමණේරයෝ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා පොළඹවාගෙන පෝයමලු විහාරයේ නායක කොබ්බෑකඩුවේ ශ්‍රී නිවාස හිමි, අස්ගිරි විහාරයේ නායක ගොලැහැන්වත්තේ ධම්මසිද්ධි හිමි ඇතුළු උභය විහාරයෙහි ප්‍රධාන භික්ෂූන් ද ඇහැලේපොල නිලමේ ආදී රජතුමා සමසම්බන්ධ පිරිස් සමග සාකච්ඡා කළහ. සරණංකර හිමි සියම් සංඝරාජ හිමියන්ට ද, අස්ගිරි විහාරයේ ගොලැහැන්වත්තේ ධම්මසිද්ධි හිමි සියම්

**වැලිවිට සරණංකර හිමිපාණෝ පෝයමලු හා අස්ගිරි විහාරයේ ගණනායක කොබ්බෑකඩුවේ හා නාවින්නේ හිමිවරු, තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත සාමණේරයන් වහන්සේ ඇතුළු උභය විහාරයීය සාමණේරවරු සමග ගොඩපල නුවරට ගොස් උපාලිහිමි ඇතුළු පිරිස පිළිගත්හ.**

**වැලිවිට අසරණ සරණ ශ්‍රී සරණංකර සංඝරාජ මා හිමියන්ගේ 323 වන ජන්ම සංවත්සරය, 243 වන අනුස්මරණය හා මහා විහාරවංශික ස්‍යාමෝපසම්පදාවට වසර 268ක් සම්පූර්ණ වීම නිමිත්තෙනි.**

රජතුමාට ද පාලියෙන් හසුන්පත් ලියා පුත්තලම් දිසාවේ දිසාපති හා සතරදේවාලයේ බස්නායක ධූරය ඉසුලූ කොබ්බෑකඩුවේ හිමි මගින් ඕලන්දයන්ගෙන් ලබා ගත් තාරකා නැවෙන් විල්බාගෙදර රාළ ඇතුළු පිරිස සියම්රටේ අයෝධ්‍යාවට ගොස් පරමධාර්මික රජු බැහැදැක සියලු පඬුරු හසුන්පත් පිළිගැන් වූහ.

පරමධාර්මික රජතුමා හා සියම් සංඝ රාජ මාහිමි ශ්‍රී ලංකා දූතයන් පිළිගෙන අයෝධ්‍යාවේ ඵලාරාම විහාරයෙන් ප්‍රවර උපාලි හිමියන් ප්‍රධාන උපසම්පදා භික්ෂූන් 21 නමක්, සාමණේර 08 නමක් හා ඇමතිවරු 03 ක් යන 32 දෙදෙනා සියම් නැවෙන් ද, ශ්‍රී ලංකා දූත පිරිස එම තාරකා නැවෙන් ද රාජ්‍ය වර්ෂ 1752 ඉල් මස පැලවිය දින සියමෙන් පිටත් විය. රාජ්‍ය වර්ෂ 1753 දී පොසොන් මස ශ්‍රී ලංකාද්වීපයේ ත්‍රිකුණාමල වරායට පැමිණි මොහොතේ සත්කෝරළේ දිසාව ඇතුළු ඇමතිවරු උන්වහන්සේලා පිළිගෙන මාතලේ ගොඩපොල රජමහ විහාරයට වැඩම වූ හ.

එම ප්‍රවර උපාලිහිමි ඇතුළු පිරිස ශ්‍රී ලංකාවට වැඩමකොට උපසම්පදාව පිහිටුවා වසර 260 ක් පිරීම නිමිත්තෙන් 2013 දෙසැම්බර් 26 වනදින තායිලන්තයේ අයෝධ්‍යා නගරයේ තායිලන්ත රජය හා ශ්‍රී ලංකා රජය සම්බන්ධ වී අභිනවයෙන් ගොඩනැගිල්ලක් සාදා ප්‍රවර උපාලි නමින් වූ කෞතුකාගාරයක් ආරම්භ කරන ලදී.

එම රාජ්‍ය උත්සවයට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා විහාරවංශික ස්‍යාමෝපාලී මහානිකායේ මල්වතු මහා විහාරපාර්ශවයේ අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මා හිමියන් වහන්සේගේ නියමය අනුව, එම මල්වතු මහා විහාරයීය ගරුතර කාරක මහා සංඝ සභාවේ ලේඛකාධිකාරී සෝමවතී රාජමහා විහාරාධිපති ආචාර්ය පහමුණේ ශ්‍රී සුමංගල නාහිමියන් වන මටත් එවක සංස්කෘතික අමාත්‍යවර හා අධ්‍යාපන අමාත්‍ය යන අප තිදෙනාට සහභාගිවීමට ලැබීම ඉමහත් සතුටට හේතුවන්නක් බව කෘතවේදීව සිහිපත් කරමු.

වැලිවිට සරණංකර හිමිපාණෝ පෝයමලු හා අස්ගිරි විහාරයේ ගණනායක කොබ්බෑකඩුවේ හා නාවින්නේ හිමිවරු, තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත සාමණේරයන් වහන්සේ ඇතුළු උභය විහාරයීය සාමණේරවරු සමග ගොඩපල නුවරට ගොස් උපාලිහිමි ඇතුළු පිරිස පිළිගත්හ. එකී පිරිස කිහිප දවසක් ගොඩපල විහාරයේ නැවතී සිට උපසම්පදාවට අවශ්‍ය බණ දහම් ප්‍රගුණ කරමින් සිවුරු කැපීම්, මැසීම් ආදී ශාසනික වත්පිළිවෙත් ද නවදූරටත් ඉගෙනගෙන උන්වහන්සේලා පෙරටු කොට මහනුවර බලා පිටත් වූහ.



සෝමවති රජමහා විහාරාධිපති
මහා විහාරවංශික ස්‍යාමෝපාලි
මහා නිකායේ
මල්වතු මහා විහාර පාර්ශ්වයේ
වැඩබලන ලේඛකාධිකාරි
ආචාර්ය
**පහමුණේ සුමංගල හිමි**

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ස්වකීය මල්වත්තේ සෙනසුන් පිළියෙල කරවා ඇමති සෙන් පිරිවර සහිත අළුත්ගම් තොටට පයින්ම ගොස් සක්විති රුවනක් ලැබුණාක් මෙන් අපමණ සතුටට පත්ව එකී උපාලි හිමියන් ප්‍රමුඛ සැමදෙනා වහන්සේම යානාවලින් මල්වත්තේ සෙනසුන් වෙත වැඩම වීය.

රජතුමා විසින් පූජා කරන ලද මල්වත්තේ පිහිටුවා තිබූ රාජස්ථාන ශාලාවම විසුන්ගාම සීමාව බවට පත්කොට රාජ්‍ය වර්ෂ 1753 ජූලි 15 ඇසළ පොහෝදින එදා මිහිඳුමහ රහතන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවේ පිහිටුවා වදාළ උපසම්පදාව සිහිපත් කරමින් පළමු කොට සියමෙන් වැඩම කළ සාමණේරයන් උපසම්පදා කොට ලක්දිවෙන් පළමුකොට පෝයමලු විහාරයේ නායක කොබ්බෑකඩුවේ සාමණේර හා වැලිවිට, හුලංගමුවේ, බඹරදෙනියේ, තිබ්බටුවාවේ යන සාමණේර හිමිවරුව 5 දෙනෙක් ද අස්ගිරි විහාරයෙන් නාවින්නේ සාමණේර හිමි යන සය දෙනා උපසම්පදා කළ හ.

මෙය වර්තමාන සම්බුද්ධ ශාසනයේ ප්‍රථම උපසම්පදාවයි. වසර 50 ක් පමණ කාලයක් මුළුල්ලෙහි අභාවයට පත්ව තිබූ සම්බුද්ධ ශාසනයේ ජීවය වූ මේ ශ්‍රේෂ්ඨතම උපසම්පදා විනය කර්මය සිදු කිරීමෙන් වැලිවිට සරණංකර මාහිමියන් වහන්සේ පමණක් නොව මල්වතු අස්ගිරි උභය මහා විහාරයීය හා සමස්ත සාමණේරයන් වහන්සේලා මෙන්ම ශ්‍රී ලංකා ධරණී තලයම සාතිශය ප්‍රමෝදයට පත් වූහ.

අස්ගිරි පාර්ශවයේ අතිගෞරවාර්හ මහානායක මාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද සංඝ සම්මේලනයේ වාර්තාගත තොරතුරු ඇතුළත් කරමින් 1934 දී මහනුවර මල්වතු මහා විහාරයේ ගරුතර කාරක මහා සංඝ සභාව මගින් සියම්රටේ බැංකොක්නුවර සංඝ රාජ හිමියන්ට පාලි භාෂාවෙන් යවන ලද දැනට අප සමීපයේ ඇති සංදේශයේ සඳහන් වන අයුරින් උපාලි හිමි ප්‍රධාන සියම් භික්ෂූන් වහන්සේ 1753 ජූලි 15 දින උපසම්පදා විනය කර්මය පිහිටුවා තුන්වසරක් ඇතුළත 700 ක් සාමණේරයන් උපසම්පදා කරවා, 3000 ක් කුල දරුවන් පැවිදි කරවා ලක්දිව විහාරස්ථාන ගණනාවක සීමා බන්ධන සම්මත කොට උපාලි හිමි ඇතුළු කීපනමක් නතර වී සෙසු පිරිස සියම් දේශයට වැඩියහ.

නැවත අයෝධ්‍යා පුරයෙන්ම විශුද්ධාචරිය මහ තෙරුන් ඇතුළු වැඩම වූ භික්ෂූන් වසර 4ක් ලක්දිව වාසය කරමින් 300 ක් සාමණේරවරුන් උපසම්පදා කරවා සිය ගණනක් කුල දරුවන් පැවිදි කරවා කතිකාවතක් ද පිහිටුවා, ආපසු යාමට කැමති වූ විට කීර්ති ශ්‍රී රජසිංහ රජතුමා සියම්රටේ පරමධාර්මික රජතුමාගේ අදහස ද සලකා මෙවන් ශාසන කාර්ය භාරයක් සිදු කිරීමට මුල් වූ වැලිවිට සරණංකර හිමියන්ට රාජ්‍ය වර්ෂ 1760 දී ශ්‍රී ලංකාද්වීපයටම සංඝරාජ ධූරය පත්කොට එකී භික්ෂූන් ආපසු යැවීය.

# ගැමුණු කුමරු නපුරු සිහිනයක් දකියි

දුටුගැමුණු මහ රජතුමා 39

**මෙසේ කල්පනා කරමින් ගමන් කළ හිද්දලයා කුඹුරට එන විට ඉර බසිමින් තිබිණි. රන් මැණිකා ඇඹුල ද රැගෙන පැමිණ සිටියාය. දෙදෙනාම එකට කා බී මදක් විවේක ගත්හ. දහවල් කෑමෙන් පසු ටික වෙලාවක් නින්දට වැටීම හිද්දලයාගේ පුරුද්දකි.**

හිද්දලයා ගමන් මහන්සිය නිසාම ඉක්මණින් නින්දට වැටුණේය. ඔහුට තමන් අහසේ පාවෙන්නාක් මෙන් දැනුනේ ය. ඔහුගේදිව එළියට ඇදුණේය. එය ටිකින් ටික දික්විය. තව තවත්දික්විය. එය රට වටේ කැරකී නැවත ටිකෙන් ටික කෙටි වී මුව තුළට ඇදුනේය.

හිද්දලයා බිය වී අවදි විය. එය දුටු රන් මැණිකා ද බියට පත් විය.

"ඇයි හීනෙන් බය වුනාද?"

"ඔව් නපුරු හීනයක් දැකලා හොඳටම බය වුණා."

"මොකක්ද හීනය?"

"රන් මැණිකා, අපොයි ඒක භයානක හීනයක්. ඒ ගැන නම් අහන්න එපා."

"මම හීනවලට බය නැහැ. අනේ ඒක කියන්න."

"මගේදිව එක්වරම එළියට ආවා. ගොඩාක් දික් වුණා. තව තවත් දික් වුණා. රට වටේ කැරකිලා නැවත කෙටි වෙලා කට ඇතුළට ආවා."

"ඇත්තටම ඒක විකාර හීනයක්. ඒත් මේ දුටුවේ ඵල දෙන හීනයක්ද, පුස් හීනයක්ද කියලා දැනගන්නට ඕනේ. හවසට මම අප්පච්චිත් එක්ක ගිහිල්ලා ගුරුගෙදර ආචාර්යතුමාගෙන් මේ ගැන හරියටම දැන ගෙන එන්නම්."

"හීනෙ දැක්කේ මමනේ. ආචාර්යතුමා ප්‍රශ්න අහන්නත් පුළුවන්. ඒ නිසා මම හවස් වෙලා ගිහින් එන්නම්."

"ඔව් ඒක වඩාත් හොඳයි. දෙදෙනාම කතා කරමින් ගොවි ගෙදර බලා පිටත් වූහ.

මොනවා වුණත් ආචාර්යතුමාට හීනය ගැන කියනවා. ඵලාපල අසාගන්නවා. හොඳ වුණත් නරක වුණත් ඉදිරියට කළ යුතු කාර්යයන් කඩිනම් කරනවා. මෙසේ සිතමින් හිද්දලයා ගුරු ගෙදරට ගියේ ය. එය සිත නිවන පරිසරයක පිහිටා ඇත. ඉදිරියෙන් කුඩා උද්‍යානයක් සහ පොකුණක් ද, පිටුපසින් සරුසාර කුඹුරු යායක්ද විය.

ආචාර්යතුමා ඉගැන්වීම් අවසාන කර විවේක සුවයෙන් සිටියේය. පොතක් කියවමින් සිටි ආචාර්යතුමා ආලින්දයට පැමිණි හිද්දලයා දෙස හිස ඔසවා බැලුවේය.

"ආ මේ අපේ හිද්දලයා ළමයා නොවැ. මේ පාර සුසුල්පිටිය විහාරයේ පින්කම බොහොම ඉහළින් පවත්වන්න සැරසෙනවා කියල ආරංචියි. මමත් මේ පාර සිල් සමාදන් වෙන්නයි ඉන්නේ."

"ආචාර්යතුමාට ආරාධනා කරන්නට එන්නයි හිතාගෙන හිටියේ. මාත් එක්ක කොත්මලේ තරුණයන් දහසකට වැඩි පිරිසක් එදාට සිල් සමාදන් වෙනවා. අල්ලපු ගම්වලින් පැමිණෙන පිරිසත් ඇතුළුව පන්දහසකට වැඩි පිරිසක් සිල් සමාදන් වීමට එදාට පැමිණෙන බවයි ආරංචිය."

"බොහොම හොඳයි", සරු පින්කමක් වේවි."

"ඉතින් මේ දරුවා අද මේ පැත්තේ ආවේ ඇයි?"

"ආචාර්යතුමනි, මට හීනයක ඵලාපල දැනගන්නට ඕනි. ඒ නිසයි මෙහි පැමිණියේ."

"ඉතින් කියන්න දරුවෝ මොකක්ද ඔය හීනය"

"ආචාර්යතුමනි, යම් කිසි කෙනෙකුගේ දිව එළියට ඇදී දික් වී ගොස් රට වටේ කැරකී නැවත කෙටි වෙමින් මුව තුළට යනවා දුටුවොත් මොන විදියේ විපාකයක් ඒ සිහිනය දුටු කෙනාට හිමි වේවිද?

හීනය අවධානයෙන් අසා සිටි ආචාර්යතුමා කල්පනා කරන්නට විය. පුදුමයෙන් මෙන් හිද්දලයා දෙස බලා සිටියේය.

"මේ හීනය දුටුවේ කවුද?"

"මම "

"කොහේදීද?"

"කුඹුරේ පැලේදී "

"වේලාව කීයට විතරද?"

"ඉර හැරී සුළු වේලාවකට පසුව"

ආචාර්යතුමා යළිත් වරක් හිද්දලයා දෙස විමසිල්ලෙන් බැලීය.

"මේ හීනය ගැන විස්තර කළ ආකාරය නිවැරැදි නම් හීනය දුටු තැනැත්තා තව දින හතකින් තමන්ට හිමි රාජ්‍යයක රජු බවට පත් වෙනවා. අද හීනය දුටු වේලාවටම ඔටුනු පළඳීවි. එයින් පසු නොබෝ කලකින්ම මුළු රටේම රජු බවට ස්ථිරව ම පත්වෙනවා."

කුමාරයා තුළ සතුටක් ඇති විය. තමා බලාපොරොත්තු වන දිනය ළඟාවී ඇති බව අවබෝධ විය. එහෙත් රජකම ලැබෙන්නේ පිය රජතුමාට හදිසි අනතුරක්දැයි බියක් ඇතිවිය.

"ඇයි දරුවා සිහින ප්‍රතිඵලය ඇසීමෙන් නුඹ කනගාටුවට පත් වුණාද? සිහිනය දැක්කේ නුඹ නොවෙයිද?"

"සිහිනය දැක්කේ මම තමයි ආචාර්යතුමනි. එහෙත් එම සිහිනයේ ප්‍රතිඵලය දකිනා තුරු මේ ගැන කිසිවකුට නොකියන බවට මට පොරොන්දු වෙන්නට ඕනෑ."

අයන්ති විතාන

# කවරයේ කතාව



සැවැත් නුවර ධනවත් එහෙත් මසුරු බමුණෙක් විය. ඒ අදින්නපුබ්බක ය. ඔහුට පුතෙක් විය. පුතුට කුණ්ඩලාභරණ සාදා දිය යුතුවූ ව ද කුණ්ඩලාභරණ සාදන්නෙකුට දුන් විට එයට වියදම් යැයි සිතූ අදින්නපුබ්බක බමුණා, රන් කැබැලි ගෙන කපා තලා කුණ්ඩලාභරණ දෙකක් තැනුවේ ය. එය පැළැඳි දරුවා මට්ටකුණ්ඩලී නමින් ප්‍රකට විය.

සොළොස් වියට පත් මට්ටකුණ්ඩලීට පාණ්ඩු රෝගය වැළැඳුණි. අදින්නපුබ්බක තම දරුවාගේ රෝගී බව දුටුවත් වියදම් වේ යැයි බියෙන් කිසිදු වෙදකු ගෙන්වූයේ නැත. අසාධ්‍ය වූ මට්ටකුණ්ඩලී මරණ මඤ්චකයට පැමිණියේ ය.

මට්ටකුණ්ඩලී බැලීමට පැමිණෙන අයට ගේ තුළ ඇති ධනය පෙනේ යැයි සිතූ අදින්නපුබ්බක බමුණා මරණාසන්න වූ සිය පුතු ගෙයින් පිටත ගෙයි පිල් කඩෙහි ඇඳක් මත සැතැප්පීය. එදින අලුයම්හි මහ කුළුණු සමවතින් ලොව බලා වදාරණ බුදුරජාණන් වහන්සේ මට්ටකුණ්ඩලී දුටුවහ. ඔහු සිටිනා නිවස සමීපයට බුදුරජාණන් වහන්සේ වැඩි සේක. මට්ටකුණ්ඩලී බුදුරජාණන් වහන්සේ දැක සිත පහදවා ගත්තේ ය. එයින් නොබෝ වේලාවකින් මරණයට පත් දරුවා දෙව්ලොව උපන්නේ ය.

අදින්නපුබ්බක පුතුගේ මළ සිරුර ආදාහන කළ භූමියට ගොස් සෑම දවසෙහි පුතුගේ නම කියා හඬන්නේ ය. මට්ටකුණ්ඩලී දෙව් පුත් ද තමා දෙව් ලොව උපදින්නට හේතුව බලන්නේ ය. සිය පියා මසුරු බැවින් තමාට වෙදකම් නො කර මළ පසු සොහොනේ හඬා ඇවිදී යැයි ද, බුදුරජාණන් වහන්සේ කෙරේ ප්‍රසාදයෙන් තමාට දෙව් සැප ලැබුණේ යැයි ද දිටී ය.

දෙව් පුතු අදින්නපුබ්බක බමුණා හඬා ඇවිදින සොහොනෙහි පැත්තක පළමු මට්ටකුණ්ඩලී වේශයෙන් ම සිට හඬන්නට විය.

බමුණු ඔහු දැක කුමට හඬයි දැයි ඇසී ය. තමාට රථයක් ලැබුණු බවත් එයට රෝද දෙකක් නැති හෙයින් හඬන බවත් කීය. එවිට සිය පුතුගේ රූපකාය ඇති ඒ තරුණයා කෙරෙහි ආදරයක් ඇති විය. එසේ හෙයින් වුවමනා පරිදි වූ රිය සක් දෙකක් රිදියෙන් හෝ රනින් වුව ද කරවා දෙන්නම් නො හඬන්න යැයි කීය.

රෝගයෙන් පෙළුණු සිය පුතුට ධනය වියදම් වේ යැයි වෙදකමක් නොකර තම පුත්‍ර වේශයෙන් ආවකු කෙරෙහි දැන් සෙනෙහෙ පා මෙසේ කියයි. මොහුට නිග්‍රහකොට වරද පෙන්වා දෙමැ'යි දෙව් පුත් සිතීය. එසේ සිතා තමාගේ රථයට අන් කිසි රෝදයකින් අර්ථයක් නැති බවත්, රිවි සඳු දෙදෙනා ම සුදුසු වූ රෝද බවත් කීය.

එවිට බමුණා රිවි සඳ නො ලද හැකි බවත්, එය පැතීම මෝඩකමක් බවත් කීය.

දෙව් පුත් තෙම මේ රිවි සඳු ඈත්හි වූවත් ඇසට පෙනෙති. මැරී පරලොව ගිය හු නම් දක්නට නැත්තේ ම ය. මෙසේ කල අපි දෙදෙනා ගෙන් කවරෙක් මූඪතර ද? ඇසට පෙනෙන්නට වත් ඇති රිවි සඳුන් පතන්නේ ද, නැත හොත් කොයි අත ඉඳීදැයි නො දැක්ක හැකි පරලොව සිටියහු පතා ශෝක කරන්නේ දැයි ඇසීය.

බමුණු ඒ දෙව් පුතු ගේ කතාව අසා තමා වඩා මූඪ බව තේරුම් ගෙන ඒ වචනයෙන් ම තුනී වූ ශෝක ඇත්තේ භවත, මා සෝ දුක් නිවූ යුෂ්මත් කවරෙහි දැ යි විචාළේ ය.

මරණ මංචකයෙහි හුන් තමා කෙරෙහි දයාවෙන් වැඩි බුදුරජාණන් වහන්සේ කෙරෙහි උපදවා ගත් ප්‍රසාද මාත්‍රය හේතුවෙන් දෙව් ලොව උපන් බව කීය. එසේ කියා, බමුණාට බුදුරජාණන් වහන්සේ වෙත පැමිණෙන ලෙස අවවාද දී දෙව් පුත් අතුරුදහන් විය.

බමුණා ද ගෙට ගොස් දන් පිළියෙළ කරවා පසු දා බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා වැඩම කැරවී ය. අබෞද්ධයකු බුදුරජාණන් වහන්සේ වැඩම කර වූ කල අබෞද්ධයෝ ප්‍රශ්න ඇසීමෙන් ශ්‍රමණ ගෞතමයන් වෙහෙසවන හැටි බලන්නැයි ද අද මහා ධර්මයාගයක් වෙතැයි ද සිතා එහි රැස් වෙති. මෙසේ එදා මහා ජනසන්නිපාතයෙක් විය.


බුදුරජාණන් වහන්සේ වැඩම කරවා සත්කාර කොට ඒ අදින්නපුබ්බක තෙම, ඔබ වහන්සේට දන් නොදී, වැඳීම් මාත්‍රයකුත් නො කොට ස්වර්ගයේ උපන්නෝ ඇත් දැ යි විමසීය.

බුදුරජාණන් වහන්සේ තොපගේ පුත්‍රයා ම මෙයට සාධක යැයි වදාළහ. කොඩොල් දෙව් පුත් විමානය සහිත ව මෙහි පැමිණේවා යි ඉටූ සේක. දෙව් පුත් ද එසේ අවුත් වැඳ සිටියේ ය.

මෙහි දී බුදුරජාණන් වහන්සේ ඒ දෙව් පුත් සාක්ෂි ස්ථානයෙහි තබා බමුණා සහිත පිරිසට ධර්මාවවාද කළ සේක. බමුණු තෙම සරණ ගත උපාසකයෙක් විය.

- දීපා

# ඉන්දීය ජාතික ධජයට ධර්ම චක්‍රය හඳුන්වා දුන් හරිජනයාගේ අසහාය නායකයා





ගෞරව
ශාස්ත්‍රවේදී
**බෝගහවැව ආනන්ද විපුලසිරි හිමි**

**හිම්රාවෝ රාම්පි අම්බෙඩ්කාර්තුමා ක්‍රි.ව. 1891 - 1956 යන කාලයේ භාරතයේ ජීවත් වූයේ ය. ඔහු ගත කළ මෙම කෙටි කාලයේ දී විශාල සේවාවක් තම මව්බිමට සිදු කළේ ය. ඒ බව එතුමා හඳුන්වා ඇති නාමයන්ගෙන් පිළිඹිබු වේ.**

එනම්, ඔහු ඉන්දියානු නීතිවේදියෙක්, දේශපාලන නායකයෙක්, ඉතිහාසඥයෙක්, කථිකයෙක්, ආර්ථික විද්‍යාඥයෙක්, ගුරුවරයෙක්, සංස්කාරකයෙක්, මහජන ලේඛකයෙක්, විප්ලවවාදියෙක් සහ ඉන්දීය බුද්ධාගමේ පුනර්ජීවනවාදියෙක් වශයෙන් ය.

භාරතීය සමාජයේ එවකට ඇතිව තිබූ හින්දු කුලවාදයෙන් පීඩාවට පත් වූවා සේ ම එය නැති කිරීම සඳහා ද විශාල අරගලයක් දියත් කරන්නට අම්බෙඩ්කාර්තුමාට සිදු විය. ඒ සඳහා ඔහු බුදුදහම තෝරාගත් අතර එහි ඉගැන්වීම් තම ඉලක්ක කරා ගමන් කිරීමේ පියගැටපෙළ කරගත්තේ ය.

දිළිඳු කුලයෙන් පැමිණි අම්බෙඩ්කාර්තුමා ඉන්දීය රජයේ ප්‍රධාන තනතුරු සඳහා ගමන් කළ අතර භාරතීය රාජ්‍ය ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේ මණ්ඩලයේ සභාපතිවරයා ද විය. වර්තමානයේ පවතින ඉන්දීය දේශපාලන සමාජ සහ ආගමික පසුබිම සඳහා අම්බෙඩ්කාර්තුමාගේ දැක්ම ඉතා ගඹුරින් බලපා ඇත.

ඒ අනුව ඔහුගේ මග පෙන්වීම මත ඉන්දීය රාජ්‍ය තේමාව සඳහා "බහු ජන හිතාය – බහු ජන සුඛාය" යන බෞද්ධ පාඨය ද ජාතික කොඩිය සඳහා බෞද්ධ නරපතියෙක් වූ අශෝක රජුගේ ස්මාරකවල ඇති ධර්ම චක්‍රය ද යොදාගෙන ඇත.

නූතන ජාත්‍යන්තර දේශපාලනයේ ආදර්ශයට ගත හැකි හොඳම රාජ්‍ය ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේ ගෞරවය ද අම්බෙඩ්කාර්තුමාට හිමි වී ඇත.

අභාවයෙන් පසුව ද අම්බෙඩ්කාර්තුමා ඉන්දීය සමාජයේ ඉහළ ම සිවිල් සම්මානය වන භාරත් රත්න සම්මානය මගින් පිදුම් ලැබීය. එසේම අද වන විට භාරතීය භූමියෙහි පිහිටි ස්මාරක අතුරින් 80% පමණ ඔහු වෙනුවෙන් ම නිර්මාණය කර ඇත. අම්බෙඩ්කාර් ජයන්තිය ඉන්දීය රාජ්‍ය පුරා රජයේ නිල නිවාඩු දිනයක් ලෙස සමරනු ලබයි. එසේම ඉන්දීය බෞද්ධයෝ අම්බෙඩ්කාර්තුමා බෝධිසත්වයෙක් ලෙස පූජනීයත්වයෙන් සලකනු ලබති. මෙවන් ශ්‍රේෂ්ඨ පුද්ගලයකුගේ ආගමික පුනරුද ව්‍යාපාරය මෙම ලිපිය මගින් පෙන්වා දීමට සිදුකරයි.

ක්‍රි.ව. 1893 – 1956 කාලයේ ඉන්දියාවේ විසූ හය කෝටියක් පමණ වූ හරිජනයාගේ අසහාය මෙන් ම විජයග්‍රාහී නායකයා වූයේ අම්බෙඩ්කාර් හිම්රාවෝ රාම්ජී ය. පංචම කුලයට අයත් ජන කොට්ඨාසයකින් මොහු පැවතගෙන එයි. මොහුගේ පියා රාම්ජී මලෝජී නමැති හරිජනයෙකි.

අම්බෙඩ්කාර් ළදරුවා මව්කුසින් බිහිව මෙලොව එළිය දුටුවේ ක්‍රිස්තු වර්ෂ 1893 අප්‍රේල් මස 14 වන දිනයේ දී ය. හින්දු කුලවාදයේ තාඩන පීඩන විඳ නොයෙක් බාධක අභිමුවේ මෙතුමා ඉන්දීය සමාජයේ ස්ථායී තැනක් තමා වෙනුවෙන් ම ගොඩනගා ගත්තේ ය. එය තම උප්පත්තියත් සමග ම වූ ස්වාධීන ජීවිතය යයි.

ඔහු ද සෙසු ඉන්දීය දරුවන් මෙන් ම කුඩා කාලයේ ගමේ පාසලෙන් අධ්‍යාපනය ලැබීය. ඉගෙනීමේ දක්ෂයෙක් වූ අම්බෙඩ්කාර් ඉන්පසු බොම්බායේ ඇල්ෆිස්ටන් විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය හැදෑරී ය. වයස අවුරුදු 19 දී උපාධිධාරියෙක් වූ අම්බෙඩ්කාර්තුමා අමෙරිකාවේ කොලම්බියා විශ්වවිද්‍යාලයට බැඳී සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් ද හිමිකර ගත්තේ ය. එයින් නො නැවතුණු අම්බෙඩ්කාර්තුමා එංගලන්තයට ගොස් අර්ථශාස්ත්‍රය පිළිබඳව උපාධියක් ලැබූ අතර, බැරිස්ටර් විභාගයෙන් ද සමත් විය. අධ්‍යාපනයේ දිගුවක් අරඹමින් ඔහු තවත් ක්ෂේත්‍ර කරා අවතීරණ වූයේ ය. එහිදී දර්ශනවිශාරද උපපාධිය ද, නවීන විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ද හිමි කර ගත්තේ ය. දැනුමෙන් දියුණු වූ ඔහු පසුව තම ජනතාව වෙනුවෙන් සිය ජීවිතය කැප කරන්නට විය. තම ජනතාවට යුක්තිය සාධාරණය ඉටුකර විමුක්තිය උදා කිරීමේ අදිටනින් මොහු නව ජීවිතයකට පියවර තැබී ය. එනම්, දේශපාලනයට අවතීර්ණ වීම ය. ඒ කම්කරුවන් වෙනුවෙන් දියත් වූ මහා සටනකින් ය. මොහු කුලවාදයට එරෙහිව සමාජයේ මහා හඬක් ඇති කළේ ය.




බොම්බායේ ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ සාමාජිකයකු ලෙස දේශපාලන ජීවිතය ඇරඹූ ඔහු කම්කරු පක්ෂයේ නායකත්වය දැරීය. නායකත්වයෙන් අව්‍යාජ වූ මොහු ප්‍රථමයෙන් හින්දු කුලවාදයෙන් පීඩාවට පත් වූ ජනතාව නගා සිටුවීමට පාසල්, පුස්තකාල සහ නේවාසිකාගාර පිහිටුවීමට සංගමයක් ආරම්භ කළේ ය. රජයේ පොදු අරමුදල්වලින් පිහිටුවන ආයතනවලට තම ජනතාවට ඇතුළු වීමට අවස්ථාවක් ලැබෙන පරිදි පනතක් සම්මත කර ගත්තේ ය. ඒ තම රටවැසි ජනතාව කෙරෙහි පැවැති ආදරයත් එතුමා තුළ පැවැති දැඩි උද්යෝගයත් නිසා ම සිදු විය.

තවද ඉන්දියාවට නිදහස ලබාදීමට ක්‍රි.ව. 1930 බ්‍රිතාන්‍යයේ පැවැති සාකච්ඡාවට සහභාගී වූ පිරිස අතර අම්බෙඩ්කාර් එක් නියෝජිතයෙක් වශයෙන් සහභාගී විය.

ඉන්දීය අභිනව ආණ්ඩුක්‍රමය සැකසීමේ දී එහි ප්‍රධාන සම්පාදකයෙක් හැටියට මෙතුමා කටයුතු කළේ ය. එසේ ම ක්‍රි.ව. 1947 ඉන්දියාව නිදහස්, රාජ්‍යයක් වීමෙන් පසු නේරුතුමාගේ අගමැති මණ්ඩලයේ අධිකරණ ඇමැතිවරයා වශයෙන් කටයුතු කරන්නට වාසනාව හිමි විය.

ළමා කාලයේ සිට අම්බෙඩ්කාර්තුමා බුදුහමට මහත් ලැදිකමක් දැක් වීය. ඒ බව ඉන්දීය රාජ්‍ය ලාංඡනය සඳහා සාරානාතයේ සිංහ හිසත්, ජාතික ධජයට ධර්ම චක්‍රයත් යෙදීමෙන් සනාථ වේ. ක්‍රි.ව. 1950 දී කොළඹ පැවැත් වූ සමස්ත ලෝක බෞද්ධ සම්මේලනයට පැමිණි මොහු එහි මුල් තැන ගෙන ක්‍රියා කළේ ය.

තවද හරිජනයා බුද්ධාගමට හැරවීමේ ක්‍රියාවේ යෙදුණු අතර ක්‍රි.ව. 1956 බුද්ධ ජයන්ති වර්ෂයේ ඔක්තෝබර් මස 14 දින නාගපූර්හි දී දෙලක්ෂයකට අධික පංචම ජනයා සමඟ බුද්ධාගම වැළඳ ගත්තේ ය.

"භාරතය ලොව තුළ ශ්‍රේෂ්ඨත්වයට පත් කළ ශ්‍රේෂ්ඨයාණන්ගේ ධර්මය නැවත භාරතයට ගෙන ඒමට අවස්ථාව ලැබීම භාග්‍යයක් බව පැවසූ මෙතුමා මා හින්දුවෙක් ලෙස ඉපදුණත් හින්දුවෙක් ලෙස මිය නොයමි" කියා ය.


විවිධ විෂයයන්හි ලද පාණ්ඩිත්‍ය මත මෙතුමා ග්‍රන්ථ කිහිපයක් නිර්මාණය කළේ ය "ශූද්‍ර ජනයාගේ ප්‍රභවය, origin of sudras රුපියලේ ගැටලුව, problem of the rupee පකිස්ථානය පිළිබඳ චින්තාව Thoughts on pakistan ඉන් කිහිපයකි.

ඉන්දීය සමාජයටත්, එහි වැසියන්ටත්, ඉන්දීය සාහිත්‍යයටත් මෙතුමා මහත් සේවාවක් ඉටු කළේ ය.

බුදුසරණ



වටදාගෙය





දඹදෙණිය දළදා මන්දිරය

# දඹදෙණි යුගයේ අභිමානය කියන

# දඹදෙණිය විජයසුන්දරාරාම රාජමහා විහාරය

**දඹදෙණි රාජධානියේ ශාසනික පුනරුදයේ කේන්ද්‍රස්ථානය වශයෙන් පැවති එම යුගයේ දළදා වහන්සේ වැඩ සිටි සම්භාවනීය විහාරස්ථානය වූ දඹදෙණිය ශ්‍රී විජයසුන්දරාරාම රාජමහා විහාරස්ථානය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල කුරුණෑගල මහා මාර්ගයේ දඹදෙණිය නගරයෙන් හැරී ගමන් කිරීමේ දී හමු වෙයි.**



භාරකාර විහාරාධිපති දාහිගමුවේ සුමංගල මාහිමි

කළිඟු රට ගුහසීව රජුගේ දියණිය වූ හේමමාලා කුමරිය සහ දන්ත කුමරු විසින් අනුරාධපුරයේ කිත්සිරිමෙවන් රජ සමයේ දළදා වහන්සේ ලක්දිවට වැඩම වූ දා පටන් අනුරාධපුරයේ සහ පොළොන්නරුවේ විවිධ ස්ථානවල වැඩ හිඳුවා තැබුව ද එම දළදා මාලිගා මේ වන විට හමුවන්නේ නටබුන් වශයෙනි.

එසේ නමුදු දඹදෙණි යුගයේ දළදා මාලිගාව වශයෙන් පැවති මන්දිරය යුගයෙන් යුගයට ප්‍රතිසංස්කරණවලට භාජනය වුව ද තවමත් නටබුන් ව නොතිබීම නිසා ප්‍රකෘතිමත්ව පවතින පැරණි ම දළදා මන්දිරය ලෙස දඹදෙණිය විජයසුන්දරාරාමය හඳුන්වා දිය හැකි ය.

කාලිංග මාඝ ආක්‍රමණිකයාගේ ආක්‍රමණ හමුවේ පොළොන්නරු රාජධානිය පරිහානියට පත්වීමත් සමග කොත්මලේ සඟවා තැබූ දළදා වහන්සේ සහ පාත්‍රා ධාතූන් වහන්සේ දඹදෙණිය බලකොටුවක් කොට ගනිමින් ප්‍රාදේශීය පාලකයකු වශයෙන් කටයුතු කළ තුන්වැනි විජයබාහු රජතුමා බෙලිගලට වැඩමවීය. දඹදෙණිය විජයසුන්දරාරාමය තැනවීම ද තුන්වැනි විජයබාහු රජුගේ මෙහෙවර අතරට එක් වෙයි.

තුන්වැනි විජයබාහු රජතුමාගේ පුත් වූ කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත ගෞරවෝපාධියෙන් සම්මානිත වන දෙවැනි පරාක්‍රමබාහු රජතුමා රජ මැදුරට නුදුරින් මනරම් දළදා මැදුරක් තනවා බෙලිගල වැඩසිටි දළදා වහන්සේ වැඩමවා මහත් වූ පුද පූජා පවත්වා සත්‍යක්‍රියා කළ කල්හි දළදා වහන්සේ අහසට පැන නැඟ ජීවමාන බුදුරුවක් මවා බුදුරැස් විහිදුවා ප්‍රාතිහාර්ය පෑ බව පූජාවලියේ සඳහන් වෙයි.

සැදැහැති රජුගේ අධිෂ්ඨානය නිසා දළදා වහන්සේ සිංහල පැය හතහමාරක් රුවන් සක්මන් කොට පෙළහර පාන ලදැයි සැලකේ.

දඹදෙණි අස්න වැනි මූලාශ්‍රගත කරුණු පාදක කර ගනිමින් මෙසේ සඳහන් වන දළදා මන්දිරය විජයසුන්දරාරාම විහාරස්ථානය ලෙස ඉතිහාසඥයින් විසින් නිගමනය කෙරෙයි.

දෙවැනි පැරකුම්බාවන් කරවූ තෙමහල් දළදා මන්දිරය මහනුවර යුගයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජ දවස මීගස්තැන්නේ අධිකාරම් විසින් දෙමහල් විහාර මන්දිරයක් ලෙස පිළිසකර කරවීය.

පෞරාණික දළදා මන්දිර ගොඩනැඟිල්ලට ආසන්නයේ පිහිටි වටදාගෙය ද දඹදෙණි යුගයේ දළදා ප්‍රදර්ශන සඳහා භාවිත කළ ගොඩනැගිල්ලක් ලෙස ජනප්‍රවාදයේ සඳහන් වේ.

මෙම වටදාගෙය සහිත දාගැබ් වහන්සේ ද මහනුවර යුගයේ පිළිසකර කරවා ඇත. බෝධීන් වහන්සේ, විහාර බිමෙහි දක්නට ලැබුණු සපු ගස දඹදෙණි යුගයේ රෝපිත බව පිළිගැනීමයි. විහාර මලුව සලකුණු කළ ප්‍රාකාරයෙහි නටබුන් බැම්ම සහ නැඟෙනහිර වාහල්කඩ හඳුනා ගත හැකි පරිදි ශේෂ වී පවතී.

දඹදෙණි යුගයේ සිදු වූ සුවිශේෂී ශාසනික සංසිද්ධියක් වශයෙන් සැලකෙන දඹදෙණි කතිකාවතට අනුව තුන්වන විජයබාහු රජ දවස ටීකාචාර්ය ශාරිපුත්‍ර මාහිමියන්ගේ ශිෂ්‍ය වූ තත්කාල ශාසනානුශාසක හෙවත් සංඝරාජ පදවිය හෙබවූ සංඝරක්ෂිත මහාස්වාමි, මේධංකර මාහිමි ඇතුළු ග්‍රාමවාසී හිමිවරුන් ද දිඹුලාගල මේධංකර මාහිමියන් ඇතුළු වනවාසී මාහිමිවරුන් ද විජයසුන්දරාරාමයේ දී කතිකාවතක් සම්පාදනය කරවා ඇත. දෙවන පැරකුම්බා රජ දවස කළ දඹදෙණි කතිකාවත ද විජයසුන්දරාරාමය මුල් කොට සම්මත කළැයි සැලකේ.

බ්‍රාහ්මණවංශික අනෝමදස්සි මාහිමි, මාහින් බණ්ඩාරගේ මුණුපුරු අනුරුද්ධ තෙරුන් වැනි හිමිවරුන් දඹදෙණිය විජයසුන්දරාරාමය හා සබැඳෙයි.

කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස සියම් දේශයෙන් මෙරටට වැඩි රාජවංශික හිමියන් දඹදෙණියෙහි වැඩ වසන ලදී.

ස්‍යාමෝපසම්පදාව පිහිටුවීමෙන් පසු අස්ගිරි මහා විහාරයෙහි උපසම්පදාව ලත් සඟ පරපුරක් දඹදෙණිය විජයසුන්දරාරාමයෙහි වැඩ විසුව ද කුරුණෑගල, මාතලේ ප්‍රදේශ කේන්ද්‍ර කොට ගනිමින් පැතිරුණු 1848 නිදහස් සටනෙහි දී විහාරස්ථානය සතු පැරණි ලියවිලි සියල්ලම ඉංග්‍රීසීන් විසින් රැගෙන ගියේ යැයි ඉංග්‍රීසි පරිපාලන වාර්තාවල සඳහන් වෙතැයි දඹදෙණි සඟ පරපුර පිළිබඳ පර්යේෂණවල නියුතු පන්නල සුමේධ නාහිමියෝ සඳහන් කරති.

වර්ෂ 1838 සිට යටගම සිද්ධාර්ථ හිමි, කොස්වත්තේ සරණපාල හිමි, මතව මේධංකර හිමි, මතව සුමංගල නාහිමි, කෙම්පිටියේ සරණංකර හිමි, ඇටඹේ සීලරතන නාහිමි, මංගෙදර සිරිරතන නාහිමි සහ නාරංගොඩ සංඝානන්ද නාහිමිවරුන් විහාරාධිපති ධුරයේ ද නාරංගොඩ සිරිනිවාස නාහිමියන් විහාරාධිකාරී ධුරයෙහි කටයුතු කළ අතර අස්ගිරි මහා විහාරයේ කර්මවාගාචාර්ය, විචිත්‍රභාණක, දාහිගමුවේ සුමංගල මාහිමියෝ භාරකාර විහාරාධිපති ධුරයේ කටයුතු කරති.

වනමන්දාව රාජමහා විහාරය, සිරිගල පුරාණ විහාරය, දීකිරිකෑව පුරාණ විහාරය, වේවැල්වල පුරාණ විහාරය, ගල්ගමුව පුරාණ විහාරය, අලව්ව ගොරකාගස්දෙණිය අභිනවාරාමය යන විහාරස්ථානවල මෙම පරපුරේ විහාරස්ථාන වෙති. මීට අතිරේකව ගණේගොඩ පේරුව,

මැදගම්ගොඩ, තිරිවාන වත්ත, උදියාවල, පහළ දඹදෙණිය යන දේවාල දඹදෙණිය අවට පිහිටි පෞරාණික දේවාල අතරට සලකනු ලබයි.

සාහිත්‍යය හා ආගමික පුනරුදයෙහි සුවිශේෂී දායකත්වයක් සනිටුහන් කළ දඹදෙණි යුගයෙහි සියලු ආගමික හා ශාස්ත්‍රීය මෙහෙවරෙහි මූලස්ථානය වශයෙන් පැවති ශ්‍රී විජයසුන්දරාරාම රාජමහා විහාරය සුවිශේෂී පූජනීය ස්ථානයකි.

දිමුතු පුන්සර කොළඹගේ



වර්ෂ 2021 ක් වූ ජූලි 17 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.